# ජමාඅතුල් මුස්ලිමීන්
# (චෝදනා සහ පිළිතුරු)

පටුන

01. ජමාඅතුල් මුස්ලිමීන් යනු කුමක් ද?

02. ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති.

03. ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාකාරකම්.

04. ලංකාවේ ජමාඅතුල් මුස්ලිමීන් ආරම්භය හා වර්ධනය.

05. ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් ප්‍රචන්ඩත්වය පොළඹවනවා ද?

06. පරිශිෂ්ට ඇමුණුම - මෙම පොතෙහි භාවිතා කර තිබෙන අරාබි වචනවල කෙටි විවරණය.

# පෙරවදන

මු.අ. ඉමාමුදීන් සහෝදරයා
සම්පාදක
ජමාඅතුල් මුස්ලිමීන්
දඃවා ඒකකය - ලේඛණ අංශය

අපිරිමිත දයාබර අසමසම කරුණාභරිත අල්ලාහ්ගේ නාමයෙනි

"අසාධාරණයට ලක් වූ තැනැත්තාගේ ප්‍රාර්ථනාවට බිය වන්න. මන්ද, ඔහු කරන ප්‍රාර්ථනාව සහ අල්ලාහ් අතර තිරයක් නොමැත" යන නබිතුමාගේ ප්‍රකාශයෙහි සඳහන් වන, `අසාධාරණයට ලක් වූ තැනැත්තා' යන පදය මුස්ලිම්වරුන් පමණක් සඳහන් නොකරයි. ලෝකයේ ජීවත් වන සියළු ජාතීන් වලට අයත් ජනතාව හඳුන්වන පොදු වචනයක් වෙයි. මුස්ලිම්වරයා යනු තම සහෝදරයා වූ අනෙක් මුස්ලිම්වරයෙකුට හෝ තමා සමග ජීවත් වන අනෙක් මිනිසුන්ට හෝ කිසිවිටෙක අසාධාරණයක් කරන්නෙකු නොවන්නේ ය, නොවිය යුතු ය.

1988 වර්ෂයේ බිහිකරන ලද ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය යනු, ජාතීන් අතර විවිධ ආක්‍රමණ, ප්‍රචන්ඩ සිද්ධීන් සිදුවූ කාලවලදී පවා කිසිම සිද්ධියකට තමාව කිසිවිටෙක සම්බන්ධ නො කරගත් අතර මුස්ලිම්වරුන්ට හෝ අනෙක් ආගම් පිළිපදින මිනිස්සුන්ට හෝ කිසිදු ආකාරයක අසාධාරණයක් සිදුනොකළ - සිදුකිරීමට නොසිතූ සංවිධානයක් ලෙස අද වනතුරු ක්‍රියාත්මක වෙමින් පවතී.

ඉස්ලාම් ධර්මය යනු අනෙක් මිනිසුන්ගෙන් සිදුවිය හැකි කරදර පවා අල්ලාහ් වෙනුවෙන්, ඉවසීමෙන් දරාගන්නා මෙන් මුස්ලිම්වරුන්ට උපදෙස් කරයි. ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය කිසිම ආකාරයකින් හෝ මීට වෙනස් ව මේ වනතුරු ක්‍රියාත්මක වූයේ නැති බව `ජමාඅතුල් මුස්ලිමීන් - චෝදනා සහ පිළිතුරු' (Jama'athul Muslimeen - Allegations and Answers) නමැති මෙම පොතේ අප පැහැදිලි කර ඇත්තෙමු.

අල්ලාහ් සහ ඔහුගේ අවසාන ධර්ම දූතයාණන් වන මුහම්මද් නබිතුමා පිළිගත් අය, දේශපාලනික කාරණා මත ත්‍රස්තවාදීන් හෝ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ලෙස හෝ අනෙක් මිනිසුන්ට වචනයෙන්; ක්‍රියාවෙන් වේදනාවට පත් කරන්නන් ලෙස පෙන්වනු ලැබෙති. මෙහි කිසිම සත්‍යයක් නැති බව අප කියන්නේ නැත. එසේවූවත් සමාජයේ සියළු දෙනා මෙවැනි ස්වභාවයකින් දක්නට නොලැබෙන බව අප අවබෝධ කරගත යුතු ය. හෘද සාක්ෂියට විරුද්ධව හැසිරෙන මෙවැනි අය සෑම සමාජයකම දක්නට ලැබෙති. එසේවූවත් නබිතුමාගේ අනුගාමිකයින් ඉලක්ක කරමින් මෙවැනි පහර දීම් සමහර මාධ්‍ය අධිකව සිදුකිරීම ඇත්තෙන්ම වේදනාවට පත්විය යුතු කාරණාවකි.

ඉන් විශේෂයෙන්ම, නබිතුමාගේ අනුගාමික සමූහයේ `නබිතුමාත් ඔහුගේ අනුවරයිනුත් කුමන ප්‍රතිපත්තියක් මත ජීවත්වූවෝද, එවැනි ජීවිතයක් ජීවත් වී මරණයට පත්විය යුතුයි' යන අරමුණ පදනම් කරමින් ක්‍රියාත්මක වන ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය දෙස දැඩි මතධාරී චෝදනා සමහර ලේඛකයින් ඉදිරිපත් කර තිබීම ඇත්තෙන්ම වේදනාවට පත්විය යුතු, නිෂේධනය යුතු කාරණාවකි.

මෙවැනි ලේඛකයින් ජමාඅතුල් මුස්ලිමීන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් පූර්ණ තොරතුරු නොලැබූවන් හෝ ජමාඅතුල් මුස්ලිමීන් සම්බන්ධයෙන් පූර්ණ පැහැදිලිතාවයක් නොමැති

හෝ ජමාඅතුල් මුස්ලිමීන් පිළිබඳව අනෙක් අය විසින් ඉදිරිපත් කරන ඊර්ෂ්‍යා සහගත අදහස් ඇතුල් කරගත්තවුන් ලෙස දක්නට ලැබෙති.

එමනිසා සැබෑ තත්ත්වය මෙම පොත මගින් අප ඉතා පැහැදිලි ලෙස විස්තර කර ඇත්තෙමු. මෙම පොතේ සඳහන් කර තිබෙන ආකාරයට ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් එදත් අදත් දක්නට ලැබේ. එමනිසා වර්තමාන කාලයේ ජමාඅතුල් මුස්ලිමීන්හි සැබෑ තත්ත්වය යමෙකු දැක ගැනීමට කැමැති වෙන්නේ නම් අනිවාර්යයෙන් ම මෙම පොත ඔහු කියවා තමාට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගැනීම කාලීන අවශ්‍යතාවයක් ලෙස අදහස් කරන්නෙමු.

පසුගිය 2019 අප්‍රේල් 21 වැනිදා සිදුකල ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසු, ජමාඅතුල් මුස්ලිමීන් වෙත ශ්‍රීලංකාවේ ජීවත් විය හැකි සමහර ලේඛකයින් හා පර්යේෂකයින් චෝදනාවන් ඉදිරිපත් කර ඇත. එවැනි චෝදනාවලට පිළිතුරු දෙන අන්දමින්, එවැනි චෝදනාවලට අයත් වන සංවිධානයක් ලෙස ජමාඅතුල් මුස්ලිමීන් කිසිම විටෙක නොමැති බව එහි ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් යනාදියත් එහි ඉතිහාසයත් පදනම් කරමින් මෙම පොතේ ඔප්පු කර ඇත්තෙමු.

මෙම පොත තනි පුද්ගලයෙකුගේ උත්සාහයක් නොව; ජමාඅතුල් මුස්ලිමීන් දෑවා ඒකකයේ ලේඛන අංශයේ සිටින සෑම අයෙකුගේම උත්සාහයේ එළිදැක්මකි. මෙම පොත එළිදැක්මට විවිධාකාරයෙන් උදව් හා උපදෙස් ලබාදුන් ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ හිටපු අමීර් උස්තාද් උමර් අලි (රියාදි)ටත් පුත්තලම ශාඛාවේ අමීර් එම්.ඒ.එම්. ජවාහිර් සහෝදරයාටත් ජමාඅතුල් මුස්ලිමීන් අධ්‍යයන පීඨය වන අල්කුල්ලියතුල් ඉස්ලාමියියාවෙහි සභාපති මව්ලවි ඒ.ආර්. මුහම්මද් (ඉස්ලාමි)ටත් පුල්මුඩේ ශාඛාවේ අමීර් එස්. සම්මූන් සහෝදරයාටත් පුත්තලම ශාඛාවේ එම්.එන්.එම්. අලි අස්මත් සහෝදරයාටත් වාලච්චේනේ ශාඛාවේ හිටපු අමීර් එස්.ඒ. කමරුදීන් සහෝදරයාටත් කොටරාමුල්ල ශාඛාවේ එම්.එච්.එම්. ෆයිසර් සහෝදරයාටත් කටුකැලියාව ශාඛාවේ ඒ.එෆ්.එම්. නිසාර්දීන් ගුරුභවතාටත් සහ මා විසින් නම සඳහන් කිරීමට අමතක වූ අනෙක් සියළුම සහෝදරවරුන්ටත් මෙම පොත එළිදැක්මට විවිධාකාරයෙන් උදව් උපකාර, ආර්ථික උපකාර කළ සියළුම ශාඛාවල අමීර්වරු හා අනෙක් සහෝදරවරු සියළු දෙනාටත් මගේ හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරන අතර මෙම පොතට අලංකාර හැඳින්වීමක් සැපයූ ජමාඅතුල් මුස්ලිමීන් අමීර් අෂ්ෂෙයික් ඒ.ඒ. ජසීම් (ඉස්ලාමි)ටත් මෙම පොත නිකුත් කිරීමට ඉදිරිපත් වූ (**Serendip**) ප්‍රකාශකයින්ටත් හද පිරි ස්තූතිය ප්‍රකාශ කරමි. ජසාකල්ලාහු හයිරන්.

එමෙන්ම ඉදිරි කාලයේ දී ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ ආරම්භයේ සිට එහි සියළු ඓතිහාසික කරුණු පැහැදිලි ව ප්‍රකාශ කරන `ජමාඅතුල් මුස්ලිමීන් - එදා සහ අද' යන පොත එළිදැක්වීමට ඉන්ෂා අල්ලාහ් ජමාඅතුල් මුස්ලිමීන් දෑවා ඒකකයේ ලේඛන අංශය අදහස් කර තිබෙන බවත් මෙහි සඳහන් කිරීමට කැමැත්තෙමු.

සම්පාදක
මු.අ. ඉමාමුදීන් සහෝදරයා
ජමාඅතුල් මුස්ලිමීන්
දෑවා ඒකකය - ලේඛන අංශය
2023/05/20

# හැඳින්වීම

ඒ.ඒ. සියාද් (ජසීම්) ඉස්ලාමි
අමීර්
ජමාඅතුල් මුස්ලිමීන්,
ඒතාලේ,
පුත්තලම.

අපිරිමිත දයාබර අසමසම කරුණාභරිත අල්ලාහ්ගේ නාමයෙනි.

`ජමාඅතුල් මුස්ලිමීන් - චෝදනා සහ පිළිතුරු' (Jama'athul Muslimeen - Allegations and Answers) යන මෙම ජමාඅතුල් මුස්ලිමීන් සම්බන්ධ චෝදනාවලට පිළිතුරු සපයන පොත, ජමාඅතුල් මුස්ලිමීන් ලේඛන අංශය විසින් ඉතා හොඳින් නිමවා ඇත.

මෙම පොතෙහි භාෂාව ගැන සැලකීමේ දී, භාවිතා කර තිබෙන වචන සරල ව තිබෙන අතර `පරිභාෂිත පද' කොටස අරාබි භාෂාවේ වචන මව් භාෂාවෙන් ඉතා හොඳින් පැහැදිලි කරන ආකාරයට දක්නට ලැබෙන අතර ඉස්ලාම් ධර්මයේ ඕනෑම වචනයක් යමෙකුගේ මව් භාෂාවට සරල ව පරිවර්ථනය කර පැහැදිලි කළ හැකි බවට හොඳ නිදසුනක් ලෙසින් ද පවතී.

ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනාවලට විස්තරාත්මකවත් පැහැදිලි ලෙසත් විරෝධතාවය දක්වන අන්දමටත් ලියන ලද මෙම පොත, ජමාඅතුල් මුස්ලිමීන් ඉතිහාසයේ ලියන ලද, ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ සැබෑ තත්ත්වය මුළු ලොවට ම එළිදක්වන පොතක් වනු ඇති බව විශ්වාස කරමි. ඉදිරිපත් කරන ලද චෝදනාවලට පිළිවදන් දෙන අන්දමට මෙම පොත සාර්ථක ව ලියැවී තිබීම විශේෂයෙන් ප්‍රසංශා කටයුතු ය.

ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් විශිෂ්ඨ අයුරින් ඉදිරිපත් කර ඒවා මගින් ජමාඅත්හි ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් කිසිම අන්දමකින් ප්‍රචන්ඩකාරී ක්‍රියාවලට සහයෝගීව නොපැවැති බව පැහැදිලි කර තිබෙන අතර ජමාඅතුල් මුස්ලිමීන් තම ඉතිහාසයේ ශ්‍රීලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජ වාදී ජනරජයට කිසිම අවස්ථාවක විරුද්ධව ක්‍රියා නොකළ සංවිධානයක් වන අතර, පාලක ආණ්ඩුවලට විරුද්ධ කිසිදු උද්ඝෝෂණයක කොටසක් වශයෙන් හෝ නොයෙදුණු සංවිධානයක් බව ඉතා හොඳින් පැහැදිලි කර තිබීම මෙම පොතෙහි විශේෂත්වයකි.

ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයට විරුද්ධ ව චෝදනාවන් ඉදිරිපත් කරන ලේඛකයින්, පර්යේෂකයින්, ආගමික නායකයින් වැනි අය මෙම පොත තම වැරැදි චෝදනාවලට පැහැදිලි පිළිවදන් ඉදිරිපත් කළ විරෝධතා ලේඛනයක් ලෙසින් ද, තම මව් භාෂාවෙන් ම ජමාඅත්හි සැබෑ තත්ත්වය දැනගැනීමෙන්, ජමාඅතුල් මුස්ලිමීන් සම්බන්ධ තම වැරැදි අදහස් හා මත වෙනස් කර ගැනීමට බොහෝ සෙයින් උදව් වේ යැයි ද ස්තීරව ම විශ්වාස කරමි.

ශ්‍රීලංකාවේ පසුගිය 2019 අප්‍රේල් 21 වැනිදා සිදුවූ ම්ලේච්ඡ - අමානුෂික මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් පසුව ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය සැක මුසු ඇසකින් බලන තත්ත්වයක් බිහි වී ඇත. ජමාඅතුල් මුස්ලිමීන් පිළිබඳ සියළු චෝදනා ඉදිරිපත් කර තිබුණේ වැරැදි තොරතුරු සහ අනුමානයන් මත පදනම්ව ය. මෙවැනි අභූත චෝදනා පැහැදිලි සාධක සහිත ව ලේඛන අංශය විසින් මෙම පොතෙහි නිවැරදි පිළිතුරු ලබා දී ඇත.

ජමාඅතුල් මුස්ලිමීන් සම්බන්ධයෙන් ප්‍රබන්ධ කරන ලද සියළු චෝදනාවලට ප්‍රතික්ෂේපයක් ලෙසින් ජනතාව මධ්‍යයේ ජමාඅත්හි සැබෑ තත්ත්වය පැහැදිලි කරන අන්දමින් අල්ලාහ්ගේ උසස් උපකාරයෙන් මෙම පොත නිර්මාණය කළ ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයේ ලේඛන අංශයට මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

ජසාකල්ලාහු හයිරා

ඒ.ඒ. සියාද් (ජසීම්) ඉස්ලාමි
අමීර්
ජමාඅතුල් මුස්ලිමීන්,
ඒතාලේ,
පුත්තලම.
2023/05/20

# ජමාඅතුල් මුස්ලිමීන් යනු කුමක් ද?

## ජමාඅතුල් මුස්ලිමීන් යනු කුමක් ද?

ජමාඅතුල් මුස්ලිමීන් යනු වත්මන් ලෝකයේ ඉස්ලාමය ළඟා කරනවා යැයි කියා ගනිමින් ක්‍රියාත්මක වන විවිධාකාර පාර්ශව හෝ සංවිධාන වලට වෙනස් ව, අල්ලාහ්තආලා වෙතින් අවසන් දූතයාණන් විසින් එළිදැක්වුණු පිවිතුරු ඉස්ලාමය අනුගමනය කර ජීවත් වන මිනිස්සුන්ගෙන් යුත් එක ම එක් කණ්ඩායමයි.

අද කාලයේ පාර්ශවයන් අතරේ ජමාඅතුල් මුස්ලිමීන්වලට තිබෙන සුවිශේෂත්වය කුමක්ද යත්, මිනිසා විසින් තබාගත් නමක් නොව, අල්ලාහ්ගේ දූතයාණන් විසින් තබන ලද `ජමාඅතුල් මුස්ලිමීන්' යන නමින් ක්‍රියාත්මක වීමයි. එනම්, එදා අල්ලාහ්ගේ දූතයාණන් සහාබාවරුන් සමග වූ තම ජමාඅතයට `ජමාඅතුල් මුස්ලිමීන්' යැයි නම තබා තිබුණි. එපමණක් නොව අල්ලාහ්තආලාගේ වදන වන අල්කුර්ආනයත් අවසන් දූතයාණන්ගේ පිරිසිදු සුන්නාවනුත් පමණක් ආගම ලෙස අනුගමනය කිරීමත් මෙහි විශේෂත්වයයි. මන්ද මෙම තත්වය අනෙක් කිසිම පාර්ශවයක හෝ සංවිධානයක හෝ නොමැත.

## ජමාඅතුල් මුස්ලිමීන් යන නම තෝරාගැනීමට හේතුව

ජමාඅත් යනු කණ්ඩායම හෝ සංධානය යන තේරුම දෙයි. මුස්ලිමීන් යනු එකට වඩා වැඩි මුස්ලිම්වරුන්ව හඳුන්වයි. ඒ අනුව ජමාඅතුල් මුස්ලිමීන් යනු `මුස්ලිම්වරුන්ගේ කණ්ඩායම' හෝ `මුස්ලිම්වරුන්ගේ සංධානය' යන තේරුම දෙයි. අද ලෝකයේ විවිධ නම් වලින් ඉස්ලාමය කතා කරන සංවිධාන දක්නට ලැබුනත් ජමාඅතුල් මුස්ලිමීන් යන්න අවුරුදු 1444 පෙර මුහම්මද් නබි (ﷺ) දූතයාණන්ගේ ජමාඅතයට කුමන නමකින් දක්නට ලැබුනේද එම නමින් ම අදත් දක්නට ලැබෙයි.

මුළු ලොවම මවා සංරක්ෂණය කරන ඒකීය දෙවිදාණන්ව මුස්ලිම්වරු අරාබි භාෂාවෙන් `අල්ලාහ්' යන නමින් ආමන්ත්‍රණය කරති. ඉස්ලාම් යනු එම අල්ලාහ්තආලා විසින් මෙම පොළොවේ ජීවත්වන මිනිස්සුන්ට, එම මිනිසුන් මෙලොවෙහිත් එලොවෙහිත් අල්ලාහ්ගේ කැමැත්තට අයත් වූවන් විය යුතුය බැවින් පහළ කරන ලද ආගම යන්න මුස්ලිම්වරුන්ගේ මූලික විශ්වාසයයි. මෙම ආගම ය පළමු මිනිසාත් අල්ලාහ්ගේ පළමු නබිවරයාත් වන ආදම් (عليه السلام) සිට අවසානයේ ලොවට පැමිණි අවසන් දූතයාණන් වන මුහම්මද නබි (ﷺ) දක්වා දේශනා කළ ප්‍රතිපත්තිය වන්නේ ය යන්නත් මුස්ලිම්වරුන්ගේ ස්තිර විශ්වාසයයි. මෙම ප්‍රතිපත්තිය යමෙකු අනුගමනය කර ජීවත්වීමෙන් පමණි ඔහු මෙලොවෙහි සැනසීමෙන් ජීවත් වී, මරණයෙන් පසු තිබෙන නිත්‍ය - නොනැසෙන ජීවිතයේත් ස්තිර සතුටු ලබා ගැනීමට හැකියි යැයිද මුස්ලිම්වරු විශ්වාස කරති.

මෙම ධර්මය ලොවට ඉදිරිපත් කළ බොහෝ නබිවරු අතුරින් අවසානයේ මෙම ධර්මය ලෝවාසී මිනිසුන්ට ඉදිරිපත් කළේ අරාබියානු අර්ධ ද්වීපයේ `මක්කා' නම් ස්ථානයේ උපන් මුහම්මද් (ﷺ) වන්නේ ය. තම 40 වැනි වයසේ දී තමන්ව අල්ලාහ්ගේ වදන් මිනිස්සුන්ට පැහැදිලි කරන නබිවරයෙකු යැයි දැනුම් දුන් මුහම්මද් (ﷺ) තමාට දෙවිදාණන්ගෙන් දිව්‍ය පණිවිඩය - වහි - ලැබෙන බවත් දැන්වූහ. මුහම්මද් නබි (ﷺ) තුමාගේ මුවෙන් නිකුත් වූ අල්කුර්ආන් වදන් නබිතුමාගේ අනුවරයින් විසින් කටපාඩම් කිරීමෙන් හා රචනා කිරීමෙන් ආරක්ෂා කරන ලදී. මෙලෙස අවුරුදු 23 ක් අල්ලාහ්තආලාගෙන් අවස්ථානුකූලව පහළ කරන ලද වදන් තම මරණයට පෙර සම්පූර්ණයෙන්ම සම්පාදනය කර ආරක්ෂා කර තැබූහ.

එමෙන්ම මුහම්මද් නබිතුමාණෝ තමන් ව අල්ලාහ්ගේ නබිවරයා ලෙස දැනුම්දුන් පසු තමාට අල්ලාහ්ගෙන් ලැබුණු පණිවිඩ ජනතාවට දේශනා කිරීමෙන් නොනැවතී එම පණිවිඩවල කියැවෙන කරුණුවලට ක්‍රියාදර්ශය දී ජීවත් වී පෙන්වූහ.

මෙනිසා නබිතුමා ධර්මය අදාලව පැවැසූ වචන, ක්‍රියාවන් හා, අනෙක් අයගේ ක්‍රියාවලට දැක්වූ අනුමැතිය යන සියල්ල සාධක සහිතව එදා ජීවත් වූ නබිතුමාගේ සමීප අනුවරයන් විසින් වාර්තා කරගන්නා ලදී. ඒවා අද දිනය දක්වා මුස්ලිම්වරු විසින් විවිධාකාරයෙන් ආරක්ෂා වෙමින් පවතී. මෙවැනි නබිතුමාගේ විශ්වසනීය වචන, ක්‍රියා, අනුමැතීන් යනාදිය හදීස් යැයි අමතනු ලැබේ.

යමෙකු අල්කුර්ආනය හා හදීස් අනුගමනය කිරීමෙන් පමණි ඔහු මුස්ලිම් යන තත්වය ලබාගන්නේ. මුස්ලිම්වරයෙකුගේ මෙලොව, එලොව ජීවිතයේ සම්පූර්ණ ජයග්‍රහණය යනු ඔහු අල්කුර්ආනයත් හදීසුත් ස්තිරවම අනුගමනය කර එහි තිරව ජීවත්වීමේ රැඳී ඇත. අල්කුර්ආනය හා විශ්වසනීය හදීස්වලින් පමණක් මුස්ලිම්වරයෙකු තම ක්‍රියාවන්ට අවශ්‍ය සියළු සාධකයන් ලබාගනී. අල්කුර්ආනය හා විශ්වසනීය නබිතුමාගේ චාරිත්‍ර තම ජීවිතයේ පදනම වශයෙන් ගෙන ජීවත්වන අයෙකු වර්තමාන කාලයේ ඉස්ලාමයේ නාමයෙන් කියනා සකල බොරුත් ප්‍රබන්ධත් ප්‍රතික්ෂේප කරන අයෙකු වශයෙන් දැකීමට පුළුවන.

ඒ අනුව නබි (ﷺ) තුමා විසින් එදා බිහි කළ මුස්ලිම්වරු සඳහා වන සංධානයට `ජමාඅතුල් මුස්ලිමීන්' යන නම පමණක් දක්නට ලැබුණි. වෙනත් කිසිදු ආකාරයක නමකින් නබිතුමා තම සංවිධානය හැඳින්වූවේ නැත යන්න විශ්වසනීය හදීස්වලින් පැහැදිලිව අප අවබෝධ කරගත හැක. එමනිසා වත්මන් කාලයේ අල්කුර්ආනයත් හදීසයත් අනුගමනය කර ජීවත්වීම මගින් මරණයෙන් පසු සදාතන සතුටු ලබාගැනීමට කැමැති මිනිසෙකු අද අපගේ ඇස් ඉදිරියේ දක්නට ලැබෙන `ජමාඅතුල් මුස්ලිමීන්' සමග එකතු වී ජීවත්වීම මගින් පමණි එවැනි සන්තෘප්තිය ලබාගැනීමට හැකි වන්නේ.

නබි (ﷺ) තුමා විසින් බිහිකරන ලද මුස්ලිම්වරුන් සඳහා වන සංධානයට `ජමාඅතුල් මුස්ලිමීන්' යන නම පමණක් දක්නට ලැබුණු බවට පැහැදිලි සාධක දකිමු.

عَنْ أُمِّ عَطِيَّةَ قَالَتْ: «أُمِرْنَا أَنْ نُخْرِجَ الْحُيَّضَ يَوْمَ الْعِيدَيْنِ وَذَوَاتِ الْخُدُورِ فَيَشْهَدْنَ جَمَاعَةَ الْمُسْلِمِينَ وَدَعْوَتَهُمْ وَيَعْتَزِلُ الْحُيَّضُ عَنْ مُصَلَّاهُنَّ قَالَتِ امْرَأَةٌ: يَا رَسُولَ اللهِ إِحْدَانَا لَيْسَ لَهَا جِلْبَابٌ قَالَ: لِتُلْبِسْهَا صَاحِبَتُهَا مِنْ جِلْبَابِهَا. (صحيح البخاري : 351)

නබිතුමාගේ අනුවරියක වූ උම්මු අතිය්යා (ؓ) දැනුම් දෙති

අවුරුදු දින දෙකෙහි දී ඔසප් සමයේ කාන්තාවනුත් තිරය පිටුපස සිටින කන්‍යාවනුත් එළියට ගෙන (නමදින පිටියට) කැඳවාගෙන එන මෙන්ද, එම කාන්තාවන් නිවසෙන් පිට වී මුස්ලිම්වරු සාමුහිකව නමදින ස්ථානයට ගොස් ඔවුන් දේශනාවට සහභාගි විය යුතු යැයිද නමදින ස්ථානයෙන් ඔසප් සමයේ කාන්තාවන් ඈත් වී සිටිය යුතු යැයිද නියෝග කරනු ලැබූවෙමු. නබි (ﷺ) තුමාගේ මෙම නියෝගය අසා සිටි කාන්තාවක "අල්ලාහ්ගේ දූතයාණනි, අපගෙන් කව්රුන්ට හෝ ඇඳගැනීමට උඩු වැස්මක් නොමැති නම් කුමක් කරන්නේද?" යැයි ඇසූ විට, "ඇයගේ මිතුරිය තමාගේ (අතිරේක) උඩු වැස්ම මැයට ඇඳීමට දුන්නාවේ" යැයි නබි (ﷺ) තුමා පිළිතුරු දුන්හ. (සහීහුල් බුහාරි : 351)

ඉහත දැක්වූ ප්‍රවෘත්තියේ නබිතුමාණෝ මුස්ලිම්වරු සියළු දෙනාටම නමදින ස්ථානයට යන මෙන් නියෝග කරන අන්දම දැකිය හැකිය.

නබිතුමා බිහිකළ එම ජමාඅත් පමණක් නොව, නබිතුමාගේ මරණයෙන් පසුව අයෙකු සැබෑ මුස්ලිමෙකු ලෙස ජීවත්විය යුතු නම් ඉස්ලාමයේ නම කියමින් මිනිස්සුන්ව නොමග යවන සියළු කණ්ඩායම්වලින් අයෙකු ඉවත් වන අතර අතර පිවිතුරු ඉස්ලාමය පිළිපැද මෙලොවෙහිත් මිනිසුන් නොමග යෑම වලක්වා, එලොවෙහිත් නිත්‍ය ජීවිතය ඇති ස්වර්ගය ලබාගන්නා මාවත පැහැදිලි කරන ජමාඅතුල් මුස්ලිමීන් හි පමණක් බැඳී ජීවත්වන මෙන් නබිතුමා උපදෙස් දෙති.

حُذَيْفَةَ بْنَ الْيَمَانِ يَقُولُ «كَانَ النَّاسُ يَسْأَلُونَ رَسُولَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ عَنِ الْخَيْرِ وَكُنْتُ أَسْأَلُهُ عَنِ الشَّرِّ مَخَافَةَ أَنْ يُدْرِكَنِي فَقُلْتُ يَا رَسُولَ اللهِ إِنَّا كُنَّا فِي جَاهِلِيَّةٍ وَشَرٍّ فَجَاءَنَا اللهُ بِهَذَا الْخَيْرِ فَهَلْ بَعْدَ هَذَا الْخَيْرِ مِنْ شَرٍّ قَالَ نَعَمْ قُلْتُ وَهَلْ بَعْدَ ذَلِكَ الشَّرِّ مِنْ خَيْرٍ قَالَ نَعَمْ وَفِيهِ دَخَنٌ قُلْتُ وَمَا دَخَنُهُ قَالَ قَوْمٌ يَهْدُونَ بِغَيْرِ هَدْيِي تَعْرِفُ مِنْهُمْ وَتُنْكِرُ قُلْتُ فَهَلْ بَعْدَ ذَلِكَ الْخَيْرِ مِنْ شَرٍّ قَالَ نَعَمْ دُعَاةٌ إِلَى أَبْوَابِ جَهَنَّمَ مَنْ أَجَابَهُمْ إِلَيْهَا قَذَفُوهُ فِيهَا قُلْتُ يَا رَسُولَ اللهِ صِفْهُمْ لَنَا فَقَالَ هُمْ مِنْ جِلْدَتِنَا وَيَتَكَلَّمُونَ بِأَلْسِنَتِنَا قُلْتُ فَمَا تَأْمُرُنِي إِنْ أَدْرَكَنِي ذَلِكَ قَالَ تَلْزَمُ جَمَاعَةَ الْمُسْلِمِينَ وَإِمَامَهُمْ قُلْتُ فَإِنْ لَمْ يَكُنْ لَهُمْ جَمَاعَةٌ وَلَا إِمَامٌ قَالَ فَاعْتَزِلْ تِلْكَ الْفِرَقَ كُلَّهَا وَلَوْ أَنْ تَعَضَّ بِأَصْلِ شَجَرَةٍ حَتَّى يُدْرِكَكَ الْمَوْتُ وَأَنْتَ عَلَى ذَلِكَ (صحيح البخاري : 3606)

නබිතුමාගේ අනුවරයෙකු වූ හුදෙයිෆා ඉබ්නු යමානි (ؓ) දැනුම්දෙති

ජනතාව නබි (ﷺ) තුමාගෙන් යහපත ගැන විමසමින් සිටියා. මම නබිතුමාගෙන් අයහපත ගැන ඇසුවෙමි. එය මා අල්වාගනීදෝ යැයි බිය වූ නිසා (ඒ ගැන ඇසුවේ). මම, "අල්ලාහ්ගේ දූතයාණනි, අප අඥාණ කාලයේත් අයහපතේත් ගිලී සිටියා. එවිට අල්ලාහ් (ඉස්ලාම් නම්) යහපත අපට ගෙන ආවේය. මෙම යහපතට පසුව අයපහතක් (කැළඹීමක්) තියෙනවාද?" යැයි විමසුවා. එයට නබි (ﷺ)තුමා, "ඔව් (තිබේ)" යැයි පිළිතුරු දුන්නා.

මම, "මෙම අයහපතෙන් පසුව කිසියම් යහපතක් තිබේද?" යැයි ඇසුවා. නබි (ﷺ) තුමා, "ඔව්. නමුත් මඳ අපැහැදිලි ස්වභාවයක් (කැළඹීමක්) පවතීවි" යැයි පිළිතුරු දෙන විට මම, "එම අපැහැදිලි තත්වය කුමක්ද" යි ඇසුවා. එවිට එතුමා, "එක් සමූහයක් මගේ ඍජු මග නොවන යමක් ගෙන අනෙක් අයට මග පෙන්වනු ඇත. ඔවුන් තුළින් යහපතත් ඔබ දකීවි අයහපතත් ඔබ දකීවි" යැයි පිළිතුරු දුන්නා.

මම, "එම යහපතට පසුව අයහපතක් තිබේදැ?" යි විමසුවා. එයට එතුමා, "ඔව්. නිරයේ දොරටුවලට (පැමිණෙන මෙන්) ආරාධනා කරන සමහරු බිහිවේවි. ඔවුන්ගේ ආරාධනාව පිළිගන්නාව නිරයේ ඔවුන් වීසි කරාවි" යැයි පිළිතුරු දුන්නා. මම, "අල්ලාහ්ගේ දූතයාණනි, ඔවුන්(ගේ සලකුණු) අපට දැනුම්දෙන්න" යැයි ඉල්ලූ විට, නබි (ﷺ) තුමා, "ඔවුහු අපගේ ජාතියට අයත්වූවෝ වෙති. අපගේ භාෂාවෙන්ම කතාකරති" යැයි පිළිතුරු දුන්නා. මම, "මා මෙම (මිනිසුන් හමුවන) තත්වය ලැබුවහොත් කුමක් (කළ යුතුදැයි) මට නියෝග කරන්න යැයි" ඉල්ලුවා. එයට නබි (ﷺ) තුමා, "ඔබ ජමාඅතුල් මුස්ලිමීන් (මුස්ලිම්වරුන්ගේ සංධානය) හා ඔවුන්ගේ නායකයා (දැඩිව) අල්වාගන්න" යැයි පිළිතුරු දුන්නා.

එවිට මම, "ඔවුන්ට සංධානයක් හෝ නායකයෙකු නැති (විවිධ පාශීව වශයෙන් භින්න වී සිටිත්) නම් (කුමක් කළ යුතුද?)" යැයි ඇසුවා. නබි (ﷺ) තුමා, "එම කොටස් සියල්ලෙන් ම වෙන්වී පැත්තකට වෙන්න. ගසක මුල දත්වලින් අල්වා ගැනීමට සිදුවී එම තත්වයේම මරණය ඔබව වැළඳගත්තත් (කිසිම පාශීවයක් සමග එකතු නොවී හුදෙකලාවේ සිටිනු)" යැයි පිළිතුරු දුන්නා. (සහීහුල් බුහාරි : 3606)

ඉහත සාධකයන් ගෙන බලන විට `ජමාඅතුල් මුස්ලිමීන්' යන නම මුහම්මද් නබි (ﷺ) තුමා විසින් බිහිකරන ලද එතුමාගේ සංධානයට එදා දක්නට ලැබුණු අතර නබිතුමාගේ මරණයෙන් පසුව මිනිස්සුන්ව නොමග යෑමෙන් වලක්වා, අල්ලාහ්තආලා කැමැති වන

අන්දමේ මිනිසුන් - මුස්ලිම්වරු ජීවත්වන සංවිධානයත් එම නමින් ම දක්නට ලැබෙන බව පැහැදිලි ලෙස තහවුරු කරගග හැකිය.

එමනිසා අල්කුර්ආනයත් අල්ලාහ්ගේ අවසන් දූතයාණන් මුහම්මද් නබි (ﷺ) තුමාගේ දේශනාත් පමණක් අනුගමනය කර නිත්‍ය සතුට පිරුණු ස්වර්ගය අපගේ අරමුණ කරගනිමින් ජීවත්වන අප ඉහත සාධක අනුව අප අනුගමනය කර ජීවත්වන කණ්ඩායමටත් `ජමාඅතුල් මුස්ලිමීන්' යන නමින් හඳුන්වාගන්නා බව මෙමගින් පැහැදිලි කිරීමට කැමැත්තෙමු.

# ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති

## ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති

ජමාඅතුල් මුස්ලිමීන්හි පදනම අල්කුර්ආන් හදීස් බව පෙර පැහැදිලි කළෙමු. ඒ අනුව ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති හෝ නීති රීති යනාදිය පුද්ගලික රුචි අරුචිකම්වලට අඩංගු වූ ඒවා නොව. ඊට වෙනස්ව, ඒවා අල්කුර්ආන් හදීස් යන අල්ලාහ්ගේ වචන පදනම් කරගත් ඒවා වෙයි. මෙලොව ජීවත්වන විට ම අල්ලාහ්තආලාගේ වචනවලට මුළුමණින්ම අවනතව ජීවත්වීම මගින් ඔහුගේ පිළිගැනීමට පාත්‍ර වී එලොව ජීවිතයේ දී ස්වර්ගය ලබාගත යුතුයි යන්න ජමාඅතුල් මුස්ලිමීන්හි ජීවත් වන සෑම මුස්ලිමෙකුගේ ම මහත් ආශාවත් උත්සාහයත් වේ.

ජමාඅතුල් මුස්ලිමීන්ට අයත්වූවෙකු අල්ලාහ්ගේ නියෝග පිළිගෙන ජීවත්වීම හේතුවෙන් මෙලොව අනෙක් මිනිසුන් අනුභව කරන සීමාරහිත සතුට අහිමිවූවත් - දුක් කම්කටොළු වින්දත් විනාශ වී යන තාවකාලික මෙලොව සුළු සතුටට වඩා ඔහුගේ මුළු සිතුවිල්ලත් චින්තනයත් නිත්‍ය ජීවිතය වූ ස්වර්ගය ලබාගැනීමෙහි ම ඉලක්කගතව තිබෙයි. මේ හේතුවෙන්, ජමාඅතුල් මුස්ලිමීන්හි ජීවත්වන සෑම මුස්ලිමෙකු හා අල්ලාහ් අතර බැඳීම නම් ඔහු ලබනා දුකේදීත් සතුටේදීත් අල්ලාහ්ව ප්‍රශංසා කිරීමෙහිත් අල්ලාහ්ට ගැතිවීමෙහිත් ඉතා ස්තීරව දක්නට ලැබෙනු ඇත.

## ජමාඅතුල් මුස්ලිමීන් අනුගමනය කරන ප්‍රතිපත්ති හා ඒවාට වහි සාධක.

1. අප මවා පරිපෝෂණය කරන අල්ලාහ්ට කිසිම අයුරකින්වත් කිසිවක් ආදේශ නොකළ යුතුය.

وَإِذۡ قَالَ لُقۡمَٰنُ لِٱبۡنِهِۦ وَهُوَ يَعِظُهُۥ يَٰبُنَيَّ لَا تُشۡرِكۡ بِٱللَّهِۖ إِنَّ ٱلشِّرۡكَ لَظُلۡمٌ عَظِيمٞ [لقمان : 13]

ලුක්මාන් තම පුතුන්ට උපදෙස් දෙමින් මාගේ පුතණුවනි, අල්ලාහ්ට ආදේශ නොතබන්න. සැබැවින්ම ආදේශ තැබීම මහත් අපරාධයකි යැයි පැවසූ අවස්ථාව (සිහිපත් කරවු) (අල්කුර්ආන් 31:13)

2. අල්ලාහ්තආලා වෙතින් පහළ වූ අල්කුර්ආනයත් නබිමගත් පමණක් ධර්මයේ මූලාශ්‍රයන් වේ. ඒවා පමණක් අනුගමනය කළ යුතුය.

ٱتَّبِعُواْ مَآ أُنزِلَ إِلَيۡكُم مِّن رَّبِّكُمۡ وَلَا تَتَّبِعُواْ مِن دُونِهِۦٓ أَوۡلِيَآءَۗ قَلِيلٗا مَّا تَذَكَّرُونَ [الأعراف : 3]

(ජනයිනි!) නුඹලාගේ පරමාධිපතිගෙන් නුඹලා වෙත පහළ කරනු ලැබූ දෑ නුඹලා අනුගමනය කරවු. ඔහු හැර සෙසු (අය තම) භාරකරුවන් (ලෙස) නුඹලා අනුගමනය නොකරවු. නුඹලා උපදෙස් ලබනුයේ අල්ප ප්‍රමාණයෙකි. (අල්කුර්ආන් 7:3)

3. කිසිම ප්‍රාණයක් අයුක්ති සහගත ලෙස ඝාතනය නොකළ යුතුය.

مِنۡ أَجۡلِ ذَٰلِكَ كَتَبۡنَا عَلَىٰ بَنِيٓ إِسۡرَٰٓءِيلَ أَنَّهُۥ مَن قَتَلَ نَفۡسَۢا بِغَيۡرِ نَفۡسٍ أَوۡ فَسَادٖ فِي ٱلۡأَرۡضِ فَكَأَنَّمَا قَتَلَ ٱلنَّاسَ جَمِيعٗا وَمَنۡ أَحۡيَاهَا فَكَأَنَّمَآ أَحۡيَا ٱلنَّاسَ جَمِيعٗاۚ وَلَقَدۡ جَآءَتۡهُمۡ رُسُلُنَا بِٱلۡبَيِّنَٰتِ ثُمَّ إِنَّ كَثِيرٗا مِّنۡهُم بَعۡدَ ذَٰلِكَ فِي ٱلۡأَرۡضِ لَمُسۡرِفُونَ [المائدة : 32]

කවරෙකු (සම ප්‍රතිදඬුවමක් වශයෙන්) ආත්මය(ක් ඝාතනය කිරීම)කට මිස හෝ මිහිතලයෙහි (ඇති වන) කලහකාරකම(ක් වැලැක්වීම)කට මිස (අයුක්ති සහගතව තවත්) ආත්මාවක් ඝාතනය කරන්නේ ද ඔහු මිනිසුන් සියල්ල ඝාතනය කළ කෙනෙකු මෙන් වන්නේ ය යනුවෙන් ද කවරෙකු එය (ආත්මාව ඝාතනය නොකර) ජීවත් කරවන්නේ ද ඔහු මිනිසුන් සියල්ල (ආරක්ෂා කර) ජීවත් කරවන්නෙකු මෙන් වන්නේ ය යනුවෙන්ද ඉස්රාඊල්ගේ දරුවන්ට අපි නියම කළෙමු. සැබැවින්ම අපගේ ධර්ම දූතවරුන් ඔවුන් වෙත පැහැදිලි සාධක රැගෙන පැමිණියෝය. පසුව සැබැවින්ම ඔවුන් අතුරින් බොහෝ දෙනා එයට පසුව ද මිහිතලයෙහි සීමාව ඉක්මවන්නන් වූහ (අල්කුර්ආන් 5:32)

4. අප ජීවත් වන රටේ සාමයටත් සාමදානයටත් කිසිම ආකාරයක කැළැලක් හෝ කලබල හෝ ඇති නොකර සාමයට සහයෝගය දැක්විය යුතුය.

وَلَا تُفۡسِدُواْ فِي ٱلۡأَرۡضِ بَعۡدَ إِصۡلَٰحِهَا وَٱدۡعُوهُ خَوۡفٗا وَطَمَعًاۚ إِنَّ رَحۡمَتَ ٱللَّهِ قَرِيبٞ مِّنَ ٱلۡمُحۡسِنِينَ [الأعراف : 56]

තවද මිහිතලය මත එහි (යහක්‍රියා මගින්) සංස්කරණය කිරීමෙන් පසු නුඹලා කලහකම් නොකරවු. බියෙන් හා අපේක්ෂා පූර්වකව ඔහුව (අල්ලාහ්ව) අයැදිවු. සැබැවින්ම අල්ලාහ්ගේ කරුණාව යහකම් කරන්නන් හට සමීපය. (අල්කුර්ආන් 7:56)

5. නබිතුමාගේ චාරිත්‍ර මාර්ගයන් ප්‍රාණවත් කර එය අනුගමනය කර ජීවත්විය යුතුය.

لَّقَدۡ كَانَ لَكُمۡ فِي رَسُولِ ٱللَّهِ أُسۡوَةٌ حَسَنَةٞ لِّمَن كَانَ يَرۡجُواْ ٱللَّهَ وَٱلۡيَوۡمَ ٱلۡأٓخِرَ وَذَكَرَ ٱللَّهَ كَثِيرٗا [الأحزاب : 21]

සැබැවින්ම අල්ලාහ්ගේ ධර්ම දූතයාණන් තුළ නුඹලාට අලංකාරවත් ආදර්ශයක් ඇත. එනම් (එය ඇත්තේ) අල්ලාහ්ව ද පරමාන්ත දිනය ද අපේක්ෂා කොට අල්ලාහ්ව අධික ලෙස මෙනෙහි කරන්නන්ට ය. (අල්කුර්ආන් 33:21)

6. අල්කුර්ආන් හදීස්වලට පටහැණි නොවී හැකි පමණ අමීර්ට කීකරුව සිටිය යුතුය.

يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوٓاْ أَطِيعُواْ ٱللَّهَ وَأَطِيعُواْ ٱلرَّسُولَ وَأُوْلِي ٱلۡأَمۡرِ مِنكُمۡۖ فَإِن تَنَٰزَعۡتُمۡ فِي شَيۡءٖ فَرُدُّوهُ إِلَى ٱللَّهِ وَٱلرَّسُولِ إِن كُنتُمۡ تُؤۡمِنُونَ بِٱللَّهِ وَٱلۡيَوۡمِ ٱلۡأٓخِرِۚ ذَٰلِكَ خَيۡرٞ وَأَحۡسَنُ تَأۡوِيلًا [النساء : 59]

විශ්වාස කළවුනි, අල්ලාහ්ට අවනත වවු, තවද රසූල්වරයාට ද නුඹලා අතර වූ (ධාර්මික) භාරකරුවන්ට ද අවනත වවු. නුඹලා අල්ලාහ්ව ද පරමන්ත දිනය ද විශ්වාස කරන්නන්ව සිටින්නේ නම් යම් කරුණක නුඹලා මතභේද වුවහොත් නුඹලා අල්ලාහ් වෙතට ද රසූල්වරයා වෙතට ද එය යොමු කරවු. එය වඩා යහපත් හා අවසන් නිගමනයෙන් ඉතා අලංකාරය (අල්කුර්ආනය 4:59)

7. මහා පාපයන් හා ප්‍රසිද්ධ පාපයන් වන මිනිස් ඝාතනය, අනාචාරය, මත්පැන් පානය, පොලිය, සූදුව, හූනියම්, අවමන් සහගත ක්‍රියාවන්, සොරකම, වංචාව යනාදියෙන් මුළුමණින්ම වැළකී සිටිය යුතුය.

إِنَّ ٱلَّذِينَ يَكۡفُرُونَ بِـَٔايَٰتِ ٱللَّهِ وَيَقۡتُلُونَ ٱلنَّبِيِّـۧنَ بِغَيۡرِ حَقّٖ وَيَقۡتُلُونَ ٱلَّذِينَ يَأۡمُرُونَ بِٱلۡقِسۡطِ مِنَ ٱلنَّاسِ فَبَشِّرۡهُم بِعَذَابٍ أَلِيمٍ [آل عمران : 21]

සැබැවින්ම අල්ලාහ්ගේ වදන් ප්‍රතික්ෂේප කළවුන් ද (කිසිදු) යුක්තියකින් තොරව නබිවරුන්ව ඝාතනය කළවුන් ද ජනයින් අතුරින් සාධාරණත්වය විධානය කළවුන්ව ඝාතනය කළවුන් ද, ඔවුන් (සියල්ලන්)ට වේදනීය දඬුවමක් පිළිබඳව නුඹ සුභාරංචි පවසවු (අල්කුර්ආන් 3:21)

إِنَّمَا يُرِيدُ ٱلشَّيۡطَٰنُ أَن يُوقِعَ بَيۡنَكُمُ ٱلۡعَدَٰوَةَ وَٱلۡبَغۡضَآءَ فِي ٱلۡخَمۡرِ وَٱلۡمَيۡسِرِ وَيَصُدَّكُمۡ عَن ذِكۡرِ ٱللَّهِ وَعَنِ ٱلصَّلَوٰةِۖ فَهَلۡ أَنتُم مُّنتَهُونَ [المائدة : 91]

ෂෙයිතාන් අපේක්ෂා කරනුයේ ම සුරාව හා සූදුව මගින් නුඹලා අතර සතුරුකම ද ක්‍රෝධය ද ඇති කිරීමට හා අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් ද සලාතයෙන් නුඹලාව වැළැක්වීමට ය. එබැවින් නුඹලා එයින් වැළකී සිටින්නෙහුද! (අල්කුර්ආන් 5:91)

ٱلَّذِينَ يَأۡكُلُونَ ٱلرِّبَوٰاْ لَا يَقُومُونَ إِلَّا كَمَا يَقُومُ ٱلَّذِي يَتَخَبَّطُهُ ٱلشَّيۡطَٰنُ مِنَ ٱلۡمَسِّۚ ذَٰلِكَ بِأَنَّهُمۡ قَالُوٓاْ إِنَّمَا ٱلۡبَيۡعُ مِثۡلُ ٱلرِّبَوٰاْۗ وَأَحَلَّ ٱللَّهُ ٱلۡبَيۡعَ وَحَرَّمَ ٱلرِّبَوٰاْۚ فَمَن جَآءَهُۥ مَوۡعِظَةٞ مِّن رَّبِّهِۦ فَٱنتَهَىٰ فَلَهُۥ مَا سَلَفَ وَأَمۡرُهُۥٓ إِلَى ٱللَّهِۖ وَمَنۡ عَادَ فَأُوْلَٰٓئِكَ أَصۡحَٰبُ ٱلنَّارِۖ هُمۡ فِيهَا خَٰلِدُونَ [البقرة : 275]

පොලිය අනුභව කරන්නන්, ෂෙයිතාන් (තම) ස්පර්ශයෙන් කවරෙකුව උන්මාදයට පත් කරන්නේ ද එවැන්නෙකු නැගිටින්නා සේ මිස (මළවුන් නැගිටවනු ලබන දිනයේ) ඔවුහු නොනැගිටති. මෙ(ම දණ්ඩන)ය අලෙවිය ද පොලිය මෙන්ම යැයි ඔවුහු ප්‍රකාශ කළ හේතුවෙනි. අල්ලාහ් අලෙවිය අනුමත කර තිබෙන අතර පොලිය තහනම් කර තිබේ. කවරෙකු වෙත තම පරමාධිපතිගෙන් උපදෙසක් පැමිණ, (පොලියෙන්) වැළකෙන්නේ ද, එවිට පෙර වූ දෑ (පෙර ගත් පොලිය) ඔහුට අනුමතය. ඔහුගේ විෂය (පිළිබඳ විනිශ්චය) අල්ලාහ් වෙතය. කවරෙකු නැවත (පොලිය වෙත) යොමු වන්නේ ද, එවිට ඔවුන්ය (නිරා) ගින්නේ සගයින් වන්නේ. ඔවුහු එහි සදාතනිකයෝ වෙති. (අල්කුර්ආන් 2:275)

8. නින්ද, අමතක වීම, සිහිය විසඳවීම වැනි කාරණා හැර අයෙකු පස් වේල නැමදීම අතහැරිය නොහැක. එලෙස අතහැරියහොත් ඔහු කාෆිර් බවට පත් වෙයි.

سَمِعْتُ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يَقُولُ: إِنَّ بَيْنَ الرَّجُلِ وَبَيْنَ الشِّرْكِ وَالْكُفْرِ تَرْكَ الصَّلَاةِ ( صحيح مسلم : 82)

නබි (ﷺ) තුමා පැවැසූහ:
"නියතව ම මිනිසාත් ආදේශ පිහිටුවීම හා දේව ප්‍රතික්ෂේපය යනාදිය අතරත් (පාලමක් වන්නේ) නැමදීම අතහැරීම වන්නේ ය"
වාර්තාකරු - ජාබිර් බින් අබ්දිල්ලාහ් (﵁) / මූලාශ්‍රය - සහීහ් මුස්ලිම් : 134

9. සකාතය අනිවාර්ය වුවහොත් එය බයිතුල් මාල් අරමුදලට භාරදිය යුතුය.

عَنْ عَلِيٍّ رَضِيَ اللَّهُ عَنْهُ عَنِ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ بِبَعْضِ أَوَّلِ هَذَا الْحَدِيثِ قَالَ: «فَإِذَا كَانَتْ لَكَ مِائَتَا دِرْهَمٍ وَحَالَ عَلَيْهَا الْحَوْلُ فَفِيهَا خَمْسَةُ دَرَاهِمَ وَلَيْسَ عَلَيْكَ شَيْءٌ - يَعْنِي - فِي الذَّهَبِ حَتَّى يَكُونَ لَكَ عِشْرُونَ دِينَارًا فَإِذَا كَانَ لَكَ عِشْرُونَ دِينَارًا وَحَالَ عَلَيْهَا الْحَوْلُ فَفِيهَا نِصْفُ دِينَارٍ فَمَا زَادَ فَبِحِسَابِ ذَلِكَ» قَالَ: فَلَا أَدْرِي أَعَلِيٌّ يَقُولُ: فَبِحِسَابِ ذَلِكَ أَوْ رَفَعَهُ إِلَى النَّبِيِّ

صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ وَلَيْسَ فِي مَالٍ زَكَاةٌ حَتَّى يَحُولَ عَلَيْهِ الْحَوْلُ إِلَّا أَنَّ جَرِيرًا قَالَ ابْنُ وَهْبٍ «يَزِيدُ فِي الْحَدِيثِ عَنِ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ لَيْسَ فِي مَالٍ زَكَاةٌ حَتَّى يَحُولَ عَلَيْهِ الْحَوْلُ (سنن أبي داود : 1573)

නබි (ﷺ) තුමා පැවැසූහ:
"දීනාර් 20 අඩු දේවල්වලින් සකාත් අනිවාර්ය නොවේ. දීනාර් 20 ක් අවුරුද්දක් පුරා ඔබ සතුව තිබුණේ නම් එයට ඔබ සකාත් ගෙවිය යුතුය".
වාර්තාකරු - අලි (ؓ) / මූලාශ්‍රය - අබූදාවූද් : 1573

10. විශ්වාසී කාන්තාවක තම මහ්රම් වූ සහායක් නොමැතිව කිලෝ මීටර් 9 දුරක් ගමන් නොකළ යුතුය.

عَنِ ابْنِ عَبَّاسٍ رَضِيَ اللهُ عَنْهُمَا: أَنَّهُ سَمِعَ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يَقُولُ: «لَا يَخْلُوَنَّ رَجُلٌ بِامْرَأَةٍ وَلَا تُسَافِرَنَّ امْرَأَةٌ إِلَّا وَمَعَهَا مَحْرَمٌ فَقَامَ رَجُلٌ فَقَالَ: يَا رَسُولَ اللهِ اكْتُتِبْتُ فِي غَزْوَةِ كَذَا وَكَذَا وَخَرَجَتِ امْرَأَتِي حَاجَّةً قَالَ: اذْهَبْ فَحُجَّ مَعَ امْرَأَتِكَ
(صحيح البخاري : 3006)

"පිරිමියෙකු කාන්තාවක සමග තනි නොවන්න. කිසිම කාන්තාවක තමා විවාහ වීම තහනම් ඥාතියෙකු (මහ්රම්) සිටිනා අවස්ථාවක හැර ගමන් නොයන්න" යැයි අල්ලාහ්ගේ දූතයාණන් පැවැසූහ. එවිට අයෙකු නැගිට, "අල්ලාහ්ගේ දූතයාණනි, මම පූජණීය යුද්ධයේ සහභාගි වීමට මම මගේ නම ලියාපදිංචි කර ඇත්තෙමි. මගේ බිරිඳ හජ් වන්දනාවට පිටත් වූවාය. (මෙවැනි තත්වයක මම කුමක් කළ යුතුදැයි)" විමසූ විට, නබි (ﷺ) තුමා පැවැසූහ, "ඔබ ගොස් ඔබේ බිරිඳ සමග හජ් කරන්න".
වාර්තාකරු - ඉබ්නු අබ්බාස් (ؓ) / මූලාශ්‍රය - සහීහුල් බුහාරි : 3006

11. අල්ලාහ්ගේ අණ පනත් වෙනස් කරන සියළු කරුණුවල සහභාගි වීම, ඒ සඳහා වූ ක්‍රියාවල යෙදීම සහයෝගය දීම වැනි සියළු කාර්ණාවලින් මුළුමණින්ම වැලැකී සිටිය යුතුය.

قُلْ هَلْ أُنَبِّئُكُم بِشَرٍّ مِّن ذَٰلِكَ مَثُوبَةً عِندَ ٱللَّهِ مَن لَّعَنَهُ ٱللَّهُ وَغَضِبَ عَلَيْهِ وَجَعَلَ مِنْهُمُ ٱلْقِرَدَةَ وَٱلْخَنَازِيرَ وَعَبَدَ ٱلطَّٰغُوتَ أُوْلَٰٓئِكَ شَرٌّ مَّكَانًا وَأَضَلُّ عَن سَوَآءِ ٱلسَّبِيلِ [المائدة : 60]

අල්ලාහ් අබියස ප්‍රතිවිපාකයෙන් එ(ලෙස ඔවුන් පිළිකුල්යැයි සිතන දෑ)යට වඩා අයහපත් දෑ පිළිබඳව නුඹලාට මා දන්වන්න ද? කවරෙකුව අල්ලාහ් ශාප කර, ඔහු කෙරෙහි ඔහු කෝපයට පත් වූයේද ඔහු ද ඔවුන් අතුරින් වඳුරන් බවට ද සූකරයින් බවට ද පත් කළවුන් ද කවරෙකු තාඝූත්වරුන්ට (ෂෙයිතානුන්ට) නැමදුම් කළේ ද මොවුන් (සියල්ල) ස්ථානයෙන් අයහපත් (වූවන්) ය. තවද ඍජු මාර්ගයෙන් දැඩි (ලෙස) මුළාවූවන් යැයි ද නුඹ පවසවු. (අල්කුර්ආන් 5:60)

12. සංගීතය ඇසීම මුළුමණින්ම වලක්වා ගත යුතු ය.

أَبُو عَامِرٍ أَوْ أَبُو مَالِكٍ الْأَشْعَرِيُّ وَاللهِ مَا كَذَبَنِي سَمِعَ النَّبِيَّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ يَقُولُ: لَيَكُونَنَّ مِنْ أُمَّتِي أَقْوَامٌ يَسْتَحِلُّونَ الْحِرَ وَالْحَرِيرَ وَالْخَمْرَ وَالْمَعَازِفَ وَلَيَنْزِلَنَّ أَقْوَامٌ إِلَى جَنْبِ عَلَمٍ يَرُوحُ عَلَيْهِمْ بِسَارِحَةٍ لَهُمْ يَأْتِيهِمْ يَعْنِي الْفَقِيرَ لِحَاجَةٍ فَيَقُولُوا ارْجِعْ إِلَيْنَا غَدًا فَيُبَيِّتُهُمُ اللهُ وَيَضَعُ الْعَلَمَ وَيَمْسَخُ آخَرِينَ قِرَدَةً وَخَنَازِيرَ إِلَى يَوْمِ الْقِيَامَةِ (صحيح البخاري : 5590)

අල්ලාහ්ගේ දූතයාණන් මෙලෙස පැවැසූහ:
"මගේ සමාජයේ සමහර පිරිස් බිහිවෙති. ඔවුහු අනාචාර(යේ යෙදීම), පට රෙදි (පිරිමින් ඇඳීම), මත්පැන් (පානය), සංගීත භාණ්ඩ (වාදනය) යනාදිය අනුමත කළ දේවල් ලෙස සලකති. තවද සමහර පිරිස් කඳු මුදුන්වල පදිංචිවෙති. ඔවුන්ගේ එළුවන් එඬේරා (උදේ ගෙනගොස්) සවස ඔවුන් වෙත දක්කාගෙන එයි. ඔවුන් වෙත තම අවශ්‍යතා සඳහා දුගියා (උදව් ඉල්ලා) යයි. එවිට ඔවුන්, හෙට අප වෙත එනු යැයි පවසති. එහෙත් අල්ලාහ් රාත්‍රියේ

ම ඔවුන් මත කන්ද පෙරළා ඔවුන්(ගෙන් බහුතරයක්) විනාශ කර දමයි. (ඉතිරි වූ) අනෙක් අය වඳුරන් හා සූකරයින් ලෙස පරමාන්ත දිනය දක්වා රූපය වෙනස් කරයි.
වාර්තාකරු - අබූ ආමිර් (﵁) / මූලාශ්‍රය - සහීහුල් බුහාරි : 5590

13. සත්‍යය වසං නොකර ප්‍රකාශ කළ යුතුය.

فَٱصۡدَعۡ بِمَا تُؤۡمَرُ وَأَعۡرِضۡ عَنِ ٱلۡمُشۡرِكِينَ [الحجر : 94]

නුඹට අණ කරනු ලැබූ දෑ නුඹ පැහැදිලිව ප්‍රකාශ කරවූ. ආදේශ තබන්නන්ව නුඹ නොසලකා හරිවූ. (අල්කුර්ආන් 15:94)

14. නිශ්ඵල තර්ක, වාදවල යෙදීම වලක්වාගෙන ඉවසීමෙන් සිටිය යුතුය.

وَٱلَّذِينَ هُمۡ عَنِ ٱللَّغۡوِ مُعۡرِضُونَ [المؤمنون: 3]

ඔවුහු නිශ්ඵල දෑයින් වැළකෙන්නන් වෙති (අල්කුර්ආන් 23:3)

15. මුස්ලිම්වරු මධ්‍යයේ සලාමය පැතිරවිය යුතුය. ගසක් හෝ බිත්තියක් හරස් වූවා නම් නැවතත් සලාම් කියා ගත යුතුය.

عَنْ أَبِي هُرَيْرَةَ قَالَ: قَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ: لَا تَدْخُلُونَ الْجَنَّةَ حَتَّى تُؤْمِنُوا وَلَا تُؤْمِنُوا حَتَّى تَحَابُّوا أَوَلَا أَدُلُّكُمْ عَلَى شَيْءٍ إِذَا فَعَلْتُمُوهُ تَحَابَبْتُمْ أَفْشُوا السَّلَامَ بَيْنَكُمْ (صحيح مسلم : 54)

අල්ලාහ්ගේ දූතයාණන් පැවැසූහ:
"ඔබ දේව විශ්වාසය නොකරනා තුරු ස්වර්ගයට ඇතුළු විය නොහැක. ඔබ එකිනෙකා ආදරය නොකරනා තුරු (පූර්ණ) දේව විශ්වාසියෙකු විය නොහැක. ඔබට එක් කාරණාවක් දැනුම් දෙන්නද? එය ඔබ ක්‍රියාත්මක කළහොත් එකිනෙකා ආදරය කළ හැක. ඔබලා අතර සලාමය පතුරුවන්න".
වාර්තාකරු - අබූහුරෙයිරා (﵁) / මූලාශ්‍රය - සහීහුල් මුස්ලිම් : 93

16. ජමාඅතුල් මුස්ලිමීන්ට අයත් පල්ලි සහ නමදින ස්ථානවල හැකි පමණ වන්දනා මානවල යෙදීමට උත්සාහ කරගත යුතුය.

عَنْ أَبِي هُرَيْرَةَ عَنِ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ: صَلَاةُ الْجَمِيعِ تَزِيدُ عَلَى صَلَاتِهِ فِي بَيْتِهِ وَصَلَاتِهِ فِي سُوقِهِ خَمْسًا وَعِشْرِينَ دَرَجَةً فَإِنَّ أَحَدَكُمْ إِذَا تَوَضَّأَ فَأَحْسَنَ وَأَتَى الْمَسْجِدَ لَا يُرِيدُ إِلَّا الصَّلَاةَ لَمْ يَخْطُ خُطْوَةً إِلَّا رَفَعَهُ اللهُ بِهَا دَرَجَةً وَحَطَّ عَنْهُ خَطِيئَةً حَتَّى يَدْخُلَ الْمَسْجِدَ وَإِذَا دَخَلَ الْمَسْجِدَ كَانَ فِي صَلَاةٍ مَا كَانَتْ تَحْبِسُهُ وَتُصَلِّي يَعْنِي عَلَيْهِ الْمَلَائِكَةُ مَا دَامَ فِي مَجْلِسِهِ الَّذِي يُصَلِّي فِيهِ: اللَّهُمَّ اغْفِرْ لَهُ اللَّهُمَّ ارْحَمْهُ مَا لَمْ يُحْدِثْ فِيهِ (صحيح البخاري : 477)

අල්ලාහ්ගේ දූතයාණන් පැවැසූහ
"අයෙකු තම නිවසේ නමදිනවාට වඩා කඩ වීදියේ නමදිනවාට වඩා සමූහය සමග නැමදීම විසි පස් ගුණයකින් වටිනාකමෙන් වැඩිය. ඔබගෙන් යමෙකු වුළූ කර, එය අලංකාරව ඉටුකොට, නැමදීමේ එකම අරමුණින් පල්ලියට පැමිණියහොත්, ඔහු පල්ලියට පැමිණීම දක්වා තබන සෑම පියවරකටම ඔහුගේ තත්වය අල්ලාහ් උසස් කරන්නේය එක පාපයක් ඔහුගෙන් ඉවත් කරන්නේය. නැමදීම අපේක්ෂාවෙන් ඔහු පල්ලියේ වාඩි වී සිටිනා විට ඔහු නැමදීමේ යෙදෙන්නෙකු ලෙස සැලකේ. නැමදීම ඉටුකළ ස්ථානයේම ඔහු සිටිනා තුරු ඔහු වෙනුවෙන් මලක්වරු ප්‍රාර්ථනයේ යෙදෙති. සුළු කිල්ලක් මගින් මලක්වරුන්ට අපහසුතාවයක් ඇති නොකරනා තුරු `දෙවිඳුණි මොහුට කමා කරනු මැන! දෙවිඳුණි මොහුට දයා කරනු මැන!' යැයි පවසති".
වාර්තාකරු - අබූහුරෙයිරා (﵁) / මූලාශ්‍රය - සහීහුල් බුහාරි : 477

17. මත් කළ හැකි බීඩි, සිගරට්, කංසා වැනි සියළුම මත්ද්‍රව්‍ය වලින් මුළුමණින් ම වැලැකී සිටිය යුතුය.

عَنِ ابْنِ عُمَرَ أَنَّ رَسُولَ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ قَالَ: «كُلُّ مُسْكِرٍ خَمْرٌ وَكُلُّ مُسْكِرٍ حَرَامٌ (صحيح مسلم : 2003)

අල්ලාහ්ගේ දූතයාණන් පැවැසූහ
"මත ඇති කරන සියල්ල මත්ද්‍රව්‍ය ය. මත ඇති කරන සියල්ල තහනම් කරනු ලැබූ ඒවාය".
වාර්තාකරු - ඉබුනු උමර් (﵁) / මූලාශ්‍රය - සහීහුල් මුස්ලිම් : 4077

18. මුස්ලිම් පිරිමි සියළු දෙනා තම යටි රැවුල පරිපූර්ණ ව වවා උඩු රැවුල කැපිය යුතුය.

عَنِ ابْنِ عُمَرَ عَنِ النَّبِيِّ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ أَنَّهُ: «أَمَرَ بِإِحْفَاءِ الشَّوَارِبِ وَإِعْفَاءِ اللِّحْيَةِ (صحيح مسلم : 53)

"උඩු රැවුල තදට කපන්න. යටි රැවුල වැවෙන්නට ඉඩ හරින්න".
වාර්තාකරු - ඉබුනු උමර් (﵁) / මූලාශ්‍රය - සහීහුල් මුස්ලිම් : 432

19. කෙස් පැසුනහොත් එයට කළු පාට හැර වෙනත් සායම් දමාගත යුතුය.

عَنْ جَابِرِ بْنِ عَبْدِ اللهِ قَالَ: أُتِيَ بِأَبِي قُحَافَةَ يَوْمَ فَتْحِ مَكَّةَ وَرَأْسُهُ وَلِحْيَتُهُ كَالثَّغَامَةِ بَيَاضًا فَقَالَ رَسُولُ اللهِ صَلَّى اللهُ عَلَيْهِ وَسَلَّمَ: «غَيِّرُوا هَذَا بِشَيْءٍ وَاجْتَنِبُوا السَّوَادَ (صحيح مسلم : 79)

මක්කා ජයග්‍රහණය දිනයේ දී (අබූබක්ර් (﵁) තුමාගේ පියා) අබූ කුහාෆා, (නබි (ﷺ) තුමා) වෙත ගෙනෙනු ලැබුවේය. ඔහුගේ හිස කෙස් හා රැවුල් කෙස් සුදු පාටින් තිබුණි. එවිට නබි (ﷺ) තුමා "මෙ(ම සුදු පාට) කිසියම් (සායම්)වලින් වෙනස් කරන්න. කළු පාට වලක්වා ගන්න" යැයි පැවැසූහ.
වාර්තාකරු - ජාබිර් (﵁) / මූලාශ්‍රය - සහීහුල් මුස්ලිම් : 4270

20. පිරිමින් තම ඇඳම් වළළුකරට ඉහළින් ඇඳගත යුතුය.

مَا أَسْفَلَ مِنَ الْكَعْبَيْنِ مِنَ الْإِزَارِ فَفِي النَّارِ (صحيح البخاري : 5787)

අල්ලාහ්ගේ දූතයාණන් පැවැසූහ
"වළළුකරට පහළින් වැටෙන (අන්දමට) පහළ ඇඳුම (අඳින්නාගේ) වළළුකර දෙකම නිරයේ (ඇතුළ්කරනු ලැබේ) ".
වාර්තාකරු - අබූහුරෙයිරා (﵁) / මූලාශ්‍රය - සහීහුල් මුස්ලිම් : 5787

21. වැඩිවියට පත් කාන්තාවන් සියල්ලෝම තමාව අන්‍ය පිරිමින්ගෙන් මුළුමණින්ම වසා ගත යුතුය.

قُل لِّلْمُؤْمِنِينَ يَغُضُّوا۟ مِنْ أَبْصَٰرِهِمْ وَيَحْفَظُوا۟ فُرُوجَهُمْ ۚ ذَٰلِكَ أَزْكَىٰ لَهُمْ ۗ إِنَّ ٱللَّهَ خَبِيرٌۢ بِمَا يَصْنَعُونَ ٣٠ وَقُل لِّلْمُؤْمِنَٰتِ يَغْضُضْنَ مِنْ أَبْصَٰرِهِنَّ وَيَحْفَظْنَ فُرُوجَهُنَّ وَلَا يُبْدِينَ زِينَتَهُنَّ إِلَّا مَا ظَهَرَ مِنْهَا ۖ وَلْيَضْرِبْنَ بِخُمُرِهِنَّ عَلَىٰ جُيُوبِهِنَّ ۖ وَلَا يُبْدِينَ زِينَتَهُنَّ إِلَّا لِبُعُولَتِهِنَّ أَوْ ءَابَآئِهِنَّ أَوْ ءَابَآءِ بُعُولَتِهِنَّ أَوْ أَبْنَآئِهِنَّ أَوْ أَبْنَآءِ بُعُولَتِهِنَّ أَوْ إِخْوَٰنِهِنَّ أَوْ بَنِىٓ إِخْوَٰنِهِنَّ أَوْ بَنِىٓ أَخَوَٰتِهِنَّ أَوْ نِسَآئِهِنَّ أَوْ مَا مَلَكَتْ أَيْمَٰنُهُنَّ أَوِ ٱلتَّٰبِعِينَ غَيْرِ أُو۟لِى ٱلْإِرْبَةِ مِنَ ٱلرِّجَالِ أَوِ ٱلطِّفْلِ ٱلَّذِينَ لَمْ يَظْهَرُوا۟ عَلَىٰ عَوْرَٰتِ ٱلنِّسَآءِ ۖ وَلَا يَضْرِبْنَ بِأَرْجُلِهِنَّ لِيُعْلَمَ مَا يُخْفِينَ مِن زِينَتِهِنَّ ۚ وَتُوبُوٓا۟ إِلَى ٱللَّهِ جَمِيعًا أَيُّهَ ٱلْمُؤْمِنُونَ لَعَلَّكُمْ تُفْلِحُونَ [النور : 30 -31]

තවද (නබිවරය,) විශ්වාසික කාන්තාවන්ට (බැලීමට තහනම් දැයින්) තමන්ගේ බැල්ම පහත හෙළන මෙන් ද තමන්ගේ ලිංගික අවයව (පාපයන්ගෙන්) ආරක්ෂා කරගන්නා මෙන් ද තමන්ගේ අලංකාරයන් එයින් එළිපිට පෙනෙන දෑ හැර (සෙසු දෑ) හෙළි

නොකරන මෙන් ද තම හිස් ආවරණ මගින් තමන්ගේ ළය පෙදෙස් ද ආවරණය කරන මෙන් ද තමන්ගේ සැමියන්ට ද තමන්ගේ පියවරුන්ට ද තම සැමියන්ගේ පියවරුන්ට ද තම පිරිමි දරුවන්ට ද තම සැමියන්ගේ පිරිමි දරුවන්ට ද තම සහෝදරයින්ට ද තම සහෝදරයින්ගේ පිරිමි දරුවන්ට ද තම සහෝදරියන්ගේ පිරිමි දරුවන්ට ද තම කාන්තාවන්ට ද තම දකුණත හිමි කරගත් අයට (වහලුන්ට) ද පිරමින් අතුරින් කාමාශාවෙන් තොර වූ උපස්ථායකයින්ට ද කාන්තාවන්ගේ රහසඟ පිළිබඳව පැහැදීමක් නොමැති පිරිමි දරුවන්ට ද මිස (වෙනත් කිසිවෙකුට) තම අලංකාරය හෙළි නොදක්වන මෙන් ද ඔවුන් සඟවා ඇති ඔවුන්ගේ අලංකාර දෑ (අන් අය විසින්) දැනගනු ලබන ආකාරයට තම පාද නොගසන මෙන් ද පවසවු. තවද අහෝ විශ්වාසිකයිනි, නුඹලා ජයග්‍රහණය ලබනු පිණිස නුඹලා සියල්ලෝම අල්ලාහ් වෙත පශ්චාත්ත වවී යොමු වවු. (අල්කුර්ආන් 24:31)

22. හැකියාව ඇති අය අවස්ථාවන් පහසුකම් ලැබුනහොත් හජ්, උම්රා යුතුකම් ඉටුකරගත යුතුය.

وَأَتِمُّواْ ٱلۡحَجَّ وَٱلۡعُمۡرَةَ لِلَّهِۚ فَإِنۡ أُحۡصِرۡتُمۡ فَمَا ٱسۡتَيۡسَرَ مِنَ ٱلۡهَدۡيِۖ وَلَا تَحۡلِقُواْ رُءُوسَكُمۡ حَتَّىٰ يَبۡلُغَ ٱلۡهَدۡيُ مَحِلَّهُۥۚ فَمَن كَانَ مِنكُم مَّرِيضًا أَوۡ بِهِۦٓ أَذٗى مِّن رَّأۡسِهِۦ فَفِدۡيَةٞ مِّن صِيَامٍ أَوۡ صَدَقَةٍ أَوۡ نُسُكٖۚ فَإِذَآ أَمِنتُمۡ فَمَن تَمَتَّعَ بِٱلۡعُمۡرَةِ إِلَى ٱلۡحَجِّ فَمَا ٱسۡتَيۡسَرَ مِنَ ٱلۡهَدۡيِۚ فَمَن لَّمۡ يَجِدۡ فَصِيَامُ ثَلَٰثَةِ أَيَّامٖ فِي ٱلۡحَجِّ وَسَبۡعَةٍ إِذَا رَجَعۡتُمۡۗ تِلۡكَ عَشَرَةٞ كَامِلَةٞۗ ذَٰلِكَ لِمَن لَّمۡ يَكُنۡ أَهۡلُهُۥ حَاضِرِي ٱلۡمَسۡجِدِ ٱلۡحَرَامِۚ وَٱتَّقُواْ ٱللَّهَ وَٱعۡلَمُوٓاْ أَنَّ ٱللَّهَ شَدِيدُ ٱلۡعِقَابِ [البقرة : 196]

හජ් හා උම්රා අල්ලාහ් වෙනුවෙන් නුඹලා සම්පූර්ණ කරවු. (එය සම්පූර්ණ කිරීමෙන්) නුඹලාව වළක්වනු ලැබුයේ නම් හද්යයෙන් (සත්ව කැප කිරීමකින්) පහසු වන දෑ (නුඹලා කැප කළ යුතුය) ඇත. හද්යය එහි නිශ්චිත ස්ථානයට පැමිණෙන තෙක් නුඹලාගේ හිස් මුඩු නොකරවු. නුඹලාගෙන් කවරෙකු රෝගියෙකුව හෝ එසේත් නොමැති නම් ඔහුට තම හිසෙහි වේදනාවක් ඇති වූ විටෙක (එමගින් හිස මුඩු ගෑමට සිදු වුවහොත් ඒ සඳහා) උපවාසයෙන් හෝ සදකාවෙන් හෝ සත්ව කැප කිරීමෙන් වන්දියක් (ගෙවිය යුතුව) ඇත. නුඹලා (යම් බාධකයකින්) සුරක්ෂිත වූයේ නම්, එවට කවරෙකු උම්රාවෙන් (පසු) හජ් වන තෙක් (ඉහ්රාමය මගින් තහනම් වන දෑහි නියැලීමෙන්) ප්‍රයෝජනයක් ලබන්නේ ද (ඔහු) හද්යයෙන් පහසු දෑ (කැප කළ යුතුව) ඇත. කවරෙකු (හද්ය දීමට හැකියාව) නොලැබුවේ ද හජ්හි දින තුනක ද නුඹලා නැවත (තම නිවෙස් කරා) පැමිණි පසු දින සතක ද උපවාස ශීලය (ඉටු කළ යුතුව) ඇත. එය පූර්ණ දින දහයකි. මෙ(ම නීති)ය තම පවුල මස්ජිද් හරාම්හි පදිංචිකරුවන් නොවන අයටය. නුඹලා අල්ලාහ් බිය භක්තිමත් වවු. අල්ලාහ් දඬුවම් දීමෙහි දැඩි බව නුඹලා දැන ගනිවු. (අල්කුර්ආන් 2:196)

23. මුස්ලිම්වරු අතර ඇතිවන ආගම අදාල මතභේද විසඳීමට අල්කුර්ආන් හදීස් වෙත යොමුවිය යුතුය.

මේ සඳහා මජ්ලිසුස් ෂූරා යන අමීර්ගේ නායකත්වය යටතේ උලමාවරු හා බුද්ධිමතුන්ගෙන් සැදුම්ලත් පර්යේෂණ කණ්ඩායමක් ක්‍රියාත්මක වෙයි.

وَٱلَّذِينَ ٱسۡتَجَابُواْ لِرَبِّهِمۡ وَأَقَامُواْ ٱلصَّلَوٰةَ وَأَمۡرُهُمۡ شُورَىٰ بَيۡنَهُمۡ وَمِمَّا رَزَقۡنَٰهُمۡ يُنفِقُونَ [الشورى : 38]

තවද ඔවුන් තම පරමාධිපතිට ප්‍රතිචාර දක්වා සලාතය ස්ථාපිත කොට ඔවුන්ගේ කරුණු ඔවුන් අතර සාකච්ඡා කරන්නන් ද වෙති. තවද අපි ඔවුනට ලබා දුන් දැයින් ඔවුහු වියදම් කරති. (අල්කුර්ආන් 42:38)

අල්කුර්ආන් හදීස් සාධක මත උපුටා දැක්වූ කරුණු ය ජමාඅතුල් මුස්ලිමීන් අනුගමනය කරන හෝ බලකරන ප්‍රතිපත්ති හෝ නීති රීති වන්නේ. මෙම නීති රීති ජමාඅතුල් මුස්ලිමීන්ට අයත් අයෙකු තමාට හැකි පමණින් අනුගමනය කර ජීවත්විය යුතුය. නින්ද, අමතක වීම, බලකිරීම වැනි අවස්ථාවල ඉහත නීති රීතිවල අයෙකු වරදක් සිදුකළ විට හෝ ඒවා අනුමගනය නොකළ විටෙක අල්ලාහ්තආලාගෙන් ඔහුට සමාව දෙනු ලැබේ යන වහිය පදනම් කරගෙන ජමාඅතුල් මුස්ලිමීන් පවසයි.

මේවා හැර අනෙක් සියළුම අවස්ථාවල ඉහත නීති රීති අනුගමනය කර ජීවත් විය යුතුය. මෙම නීති රීති මුළු ලොවම මවා පරිපෝෂණය කරන අල්ලාහ්තආලා විසින් නිර්මාණය කර අපට පිරිනැමූ ඒවා වේ. අපගේ මිනිස් දැනුමට සමහර අවස්ථාවල එම ප්‍රතිපත්ති නුසුදුසු හෝ අනුගමනය කිරීමට අපහසු ලෙස දක්නට ලැබුනත් එම නීති මානව සමාජයේ යහජීවනය සඳහා ලෝවාසීන් සියළු දෙනා මත දයාබරිත අල්ලාහ්තආලා වෙතින් බිහිකරන ලද ඒවා යැයි මුස්ලිම්වරු ස්තිරව ම විශ්වාස කර ක්‍රියාත්මක කරති.

මෙම නීති රීති අනුගමනය කර පිලිපැදීම මගින් පුද්ගලික, පවුල්, සමාජ ජීවිතයේ ඉතා විශිෂ්ඨ දියුණු ලබාගන්නා අතර පුද්ගල නිදහස, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, කාන්තාවන් සඳහා උසස් රැකවරණය, කාන්තාවන්ගේ දේපල හිමිකාරිත්වය, සියළුම පාර්ශවයන් සඳහා වූ ආර්ථික අයිතිවාසිකම්, ජාතින් අතර අවබෝධය, මතින් තොර සමාජ ක්‍රමය, අපරාධ ඉතා අවම පරිසරය වැනි උසස් යහපත් ලබාගැනීම සමග උසස් සදාචාර ධර්ම සහිත සමාජ ව්‍යුහයක් ගොඩනැංවිය හැකි බව ජමාඅතුල් මුස්ලිමීන් මෙමගින් බලකරයි.

# ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාකාරකම්

## ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාකාරකම්

ඉස්ලාම් ධර්මය යනු අල්ලාහ්තආලා විසින් භූතලයේ ජීවත් වන මානව සමාජයට පහළ කළ පරිපූර්ණ ජීවන සැලැසුමකි. මෙම ජීවන සැලැසුම තුලට ස්ව කැමැත්තෙන් බැඳෙන්නන්වයි ඉස්ලාමයත් `මුස්ලිම්' යන අලංකාර වචනයෙන් අමතන්නේ. ඒ අනුව අද ජමාඅතුල් මුස්ලිමීන් අල්කුර්ආන් නම් අල්ලාහ්ගේ වදන් සහ හදීස් නම් අවසාන ධර්ම දූතයාණන් මුහම්මද් නබි (සල්) තුමාගේ යහ දේශනා පමණක් අනුගමනය කරමින් මිනිස් අදහස් හා නීති රීති මුළුමණින්ම බැහැර කර තම ප්‍රතිපත්තිය බිහිකර තිබෙන බැවින්, මෙම ජමාඅතුල් මුස්ලිමීන් හි පූර්ණ එකඟතාවය මත බැඳෙන තැනැත්තන් ව පමණක් `මුස්ලිම්' යැයි ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයත් හඳුන්වයි.

ඉස්ලාම් නම් ජීවන ක්‍රමය මිනිස් සමාජයට ජීවිතාදර්ශයෙන් පෙන්වීමට එම මිනිසුන් අතුරින් අල්ලාහ්තආලා බොහෝ දූතවරුන් තෝරාගත්තේ ය. එවැනි දූතවරු අතුරින් අවසානය වශයෙන් අල්ලාහ්තආලා තෝරාගත් දූතයාණන් මුහම්මද් නබිතුමා වෙති. මුහම්මද් නබිතුමාගෙන් දූතයින්ගේ පැමිණීම නවතින තත්වයක මුස්ලිම්වරුන්ව මෙහෙයවීමට - ඒ සඳහා නායකත්වයක් දක්නට ලැබීම අත්‍යාවශ්‍ය ය. ඒ මන්ද ඉස්ලාම් යනු එක් නායකත්වයක් සහිත එකම සංධානයක්ව පවතිනවා මිසෙක කුඩා කණ්ඩායම් කල්ලි වශයෙන් මුස්ලිම්වරු බෙදී ජීවත් විය නොහැක. එලෙස සංධානයක් අවශ්‍ය නොවේ, නායකත්වයක් අවශ්‍ය නොවේ යැයි යමෙකු තර්ක කරන්නේ නම්, එවැන්නන් `ධර්මය පරිපූර්ණව නොදත්තවුන්' (ජාහිල්) යැයි ඉස්ලාමය තීරණය කරයි. එලෙස ජමාඅතයේ ස්ව කැමැත්තෙන් බැඳීමට පැමිණෙන අයගෙන් නායක අමීර් හෝ ශාඛා අමීර්වරු බයිඅත් නම් (සත්‍ය සඳහා දිව්රුම) සිදුකරති.

# ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාකාරකම් ලෙස පහත කරුණු දැක්විය හැක.

**01)** නායකත්වය තෝරාගැනීම

ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය අල්ලාහ්ගේ ධර්මය හොඳින් උගත් වියතුන් අතුරින් නායකත්ව යෝග්‍යතාවය ඇති අය, තම නායකත්වයට සුදුස්සන් ලෙස එහි ජීවත්වන මුස්ලිම්වරු ඒකච්ඡන්දයෙන් තෝරාගනිති. මෙලෙස තෝරාගන්නා එම නායකත්වය, මුස්ලිම්වරුන්ගේ කටයුතු හොඳින් අවධානය කර - ඔවුන්ව අල්ලාහ්ගේ ධර්මය (අල්කුර්ආන්, හදීස්) මගින් මෙහෙයවීම හේතුවෙන් අමීර් (භාරකරු) හෝ ඉමාම් (මගපෙන්වන්නා) යන වදන් වලින් මුස්ලිම්වරු විසින් අමතනු ලැබෙති. ජමාඅතුල් මුස්ලිමීන්ගේ අමීර් හෝ ඉමාම් කෙනෙකුගේ කාර්යය ආගමික, සමාජ, දේශපාලනය වැනි බොහෝ ක්ෂේත්‍ර දෙස දක්නට ලැබේ.

අමීර්වරයෙකු තමා එම වගකීමෙන් ඉවත්වන තත්වයක් ඇතිවුවහොත්, නායකත්වයට සුදුසු අයෙකු කැමැති නම් ඔහු විසින්ම පත් කළ හැක. නැතිනම් පෙර සඳහන් කළ අන්දමට මුස්ලිම්වරු සුදුසු පුද්ගලයෙකු තමන්ගේ අමීර් ලෙස තෝරාගනිති. ජමාඅතුල් මුස්ලිමීන්හි වැඩකටයුතු අනුව මෙම ජමාඅත්හි ප්‍රධාන පාලකයා ලෙස අමීර්වරයා දක්නට ලැබෙන බැවින් අමීර්ගේ අධීක්ෂණය මගපෙන්වීම පදනම් කරමින් ජමාඅත්හි සියළු වැඩකටයුතු සිදුවේ.

**02)** ජමාඅත්හි ශාඛා පිහිටුවීම හා ඒවා පාලනය කිරීම

ශ්‍රීලංකාවේ මුස්ලිම්වරු ජීවත්වන ප්‍රදේශවල ජමාඅතුල් මුස්ලිමීන්හි ශාඛා ගණනාවක් දක්නට ලැබේ. අද වනවිට ශාඛා 30 ක් ක්‍රියාත්මක වේ. එම ශාඛාවල අවම වශයෙන් සාමාජික මුස්ලිම්වරු තුන් දෙනෙකුවත් දක්නට ලැබෙති. උපරිම ගණන සීමා පනවා නැත. එම ශාඛාවලට නායක අමීර්ගේ නියෝජිතයින් වශයෙන් ශාඛා අමීර්වරු දක්නට ලැබෙති. ශාඛා අමීර්වරුන්ව නායක අමීර්වරයාම සුදුසු යෝග්‍යතා මත පත්කරයි. ශාඛා අමීර්වරුන්ගේ ක්‍රියාකාරකම් නායක අමීර්ගේ ක්‍රියාකාරකම් ආදේශකරමින් ද නායක අමීර්ගේ උපදෙස් පදනම් කරමින් ද දක්නට ලැබෙයි.

ශාඛා අමීර්වරයෙකුගේ ප්‍රධාන ක්‍රියාවන් ලෙස:

- නැමදීම නායකත්වය ගෙන පැවැත්වීම.
- සිකුරාදා ජුම්ආ නම් විශේෂ නැමදුමත් එහි ධර්ම දේශනාවත් සිදුකිරීම.
- තම ශාඛාව තුල ජීවත් වන සංවිධානයේ සාමාජික මුස්ලිම්වරු අතුරින් කිසිවෙකුට හෝ කිසියම් ආර්ථික අවශ්‍යතාවයක් දක්නට ලැබෙන අවස්ථාවක නායක අමීර් සමග සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- රෝගීන් හමුවීම සහ ඔවුන්ට අවශ්‍ය උදව් කිරීම.
- මරණයට පත්වූ සහෝදරවරුන් සහෝදරියන්ගේ භූමදානය හා ප්‍රාර්ථනාවෙහි සහභාගී වීම.
- සහෝදරවරුන්ගේ විවාහ මංගල්‍යවල සහභාගී වීමත් විවාහ දේශනය පැවැත්වීමත්.

- සකාත්, සකාතුල් ෆිත්රා, ජමාඅත්ට ලැබෙන පරිත්‍යාග යනාදිය ඉතිරිකර තැබීම සඳහා කුඩා අරමුදලක් බිහිකර එහි භාරකරු ලෙස ක්‍රියාකිරීම.
- කාන්තාවන් හා ළමුන්ට සතිපතා, මාසිකව ධර්මය පැහැදිලි කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**03)** ශාඛා අමීර්වරු උලමාවරු වැනි අය සඳහා හමු පැවැත්වීම.

ජමාඅතුල් මුස්ලිමීන් වැදගත් ක්‍රියාකාරකම්වලින් එකක් ලෙස නායකත්වයේ නියෝජිතයින් වන ශාඛා අමීර්වරු රැස් කර ඔවුන්ට පැහැදිලි කිරීම් හමු පැවැත්වීම දැක්විය හැක. මෙම රැස්වීම්වලදී ධර්මය උගත් වියතුන් (මව්ලවි / උලමාවරු) බුද්ධිමතුන් වැනි අයත් එකතු කරගනු ලැබෙති.

මෙම රැස්වීම්වල දී ජමාඅත්හි වැදගත් පරිපාලන කරුණු, පසුගිය කාලවල ක්‍රියාකාරකම්, සාමාජික මුස්ලිම්වරුන්ගේ ප්‍රශ්න, ආගමික විවරණ, ජමාඅත්හි අනාගත සංවර්ධන සැලැසුම්, රටේ නීති රීතිවලට අවනත ව කටයුතු කිරීම අදාල උපදෙස්, පොත් සඟරා එළිදැක්වීම් වැනි කරුණු පැහැදිලි කරන අන්දමින් මෙම රැස්වීම් පවත්වනු දක්නට හැකිය. මෙම රැස්වීම් මාස තුනකට වරක් සාමාජික මුස්ලිම්වරු ජීවත් වන ප්‍රදේශවල තිබෙන ශාඛා තෝරාගෙන එම ශාඛාවලට අයත් පල්ලිවල සති අන්ත දිනයක පවත්වනු ලැබේ. මෙම රැස්වීම් නායක අමීර්ගේ ප්‍රධානත්වෙයන් පැවැත්වේ.

මෙම රැස්වීම් සඳහා ආහාර පාන ඇතුළු සියළුම වියදම් අදාල ශාඛාවේ වගකීම වෙයි. අදාල ශාඛාවේ සාමාජිකයින් මේ සඳහා ආර්ථික ආධාර කරති.

**04)** සහෝදරවරු මධ්‍යයේ ඇතිවන ප්‍රශ්න සුහදව විසඳීම.

ජමාඅතුල් මුස්ලිමීන් තවත් ක්‍රියාකාරකමක් ලෙස දක්නට ලැබෙන්නේ ජමාඅත්හි සාමාජික මුස්ලිම්වරු මධ්‍යයේ විටින් විට පැන නැගිය හැකි කුඩා ආරවුල්, හිත් අමනාපවීම් ආදිය අදාල පුද්ගලයින් එකට කැඳවා හෝ ඔවුන් වෙත ගොස් අදාල ප්‍රශ්න හොඳින් නිරීක්ෂණය කර සුහදව සාකච්ඡා කර ප්‍රශ්නය විසඳීම දැක්විය හැක. මෙම ප්‍රශ්න බරපතල නොවන අතර නීතිමය ප්‍රවේශයකට තරම් බලවත් නොවන ඒවා ලෙස දක්නට ලැබේ.

මුස්ලිම්වරු සියල්ලෝම සහෝදරයින්ය, එක ගොඩනැගිල්ලක තිබෙන ගඩොල්වලට හෝ ශරීරයේ අවයවවලට සමාන වූවන් යැයි ඉස්ලාමය අදහස් කරන බැවින් සහෝදරයින් අතර සිදුවන හිත් අමනාපකම්, ආරවුල් යනාදිය එලෙසම තිබෙන්නට නොහැර කෙටි කාලයක් තුල නායක අමීර්ගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් සාකච්ඡා මගින් අලංකාර ලෙස විසඳා සහෝදරවරු මධ්‍යයේ සාමදානය ඇතිකරනු ලැබේ.

**05)** සකාත් නම් ආර්ථික සැලැසුම ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ජමාඅතුල් මුස්ලිමීන්හි වැදගත් ක්‍රියාකාරකමක් ලෙස සකාත් නම් ධනවතුන්ගෙන් ලබාගන්නා අරමුදල් හා භාණ්ඩ අල්කුර්ආනයේ සඳහන් වන කණ්ඩායම් අටට බෙදාදීම දැක්විය හැක. ජමාඅතුල් මුස්ලිමීන්හි ජීවත් වන ධනවත් මුස්ලිම්වරුන් අතුරින් ඔවුන්ගේ දේපලවලින් අල්ලාහ්ගේ ධර්මයේ නියම කර දක්වා තිබෙන ප්‍රමාණයේ මුදල් හෝ භාණ්ඩ අයකරගෙන අල්ලාහ්ගේ ධර්මයේ සඳහන් කණ්ඩායම් අටට නායකත්වය හරහා ඒවා බෙදා හරිනු ලැබේ.

අන්ත දුගීන්, දුප්පතුන්, ගමන් මගීන්, සංචාරකයින් (අහම්බෙන්), අල්ලාහ්ගේ මාර්ගයේ ඔහුගේ ධර්මය වෙනුවෙන් වෙහෙසෙන්නන්, ණයගැතියන්, ඉස්ලාමයට අළුතින් බැඳුනු අය, සකාත් රාජකාරියේ යෙදී සිටින්නන් ආදීන්ට මෙම සකාත් අරමුදල්, භාණ්ඩ සෑම වර්ෂයකම බෙදාහරිනු ලැබේ. මේ හේතුව නිසා වස්තුව ධනවතුන් අතේ පමණක් සංචරණය නොවෙමින් සෑම දෙනා අතරටම සංචරණය විය හැකි තත්වයක් ඇති කිරීමට ජමාඅතුල් මුස්ලිමීන් උත්සාහ කරයි.

**06)** අවශ්‍යතා සහිත සහෝදරවරු, රෝගීන් වැනි අය හඳුනාගෙන ඔවුන්ගේ ආර්ථික අවශ්‍යතා සම්පූර්ණ කිරීම

ජමාඅතුල් මුස්ලිමීන්හි මීළඟ ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස දක්නට ලැබෙන්නේ ජමාඅත් සාමාජිකයින් අතර සිටින අවශ්‍යතා ඇති අය, රෝගීන් වැනි අය හඳුනාගෙන අවශ්‍ය ආර්ථික උදව් ඔවුන්ට ලබාදීම හැඳින්විය හැක.

ජමාඅතුල් මුස්ලිමීන්හි ජීවත්වන සහෝදර සහෝදරියන් හෝ සාමාජික මුස්ලිම්වරුන්ගේ දරුවන්ට රෝගී තත්වයක් ඇති වී, එම රෝගවලට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමට ප්‍රමාණවත් ආර්ථික පහසුකම් නොමැති අය ජමාඅත් නායකත්වයට විධිමත් ආකාරයට දැනුම්දීමෙන් එවැනි සහෝදරවරු වෙනුවෙන් ජමාඅත්හි ජීවත් වන සියළුම සහෝදරවරුන්ගෙනුත් නායකත්වය විසින් ඔවුන් කැමැති තොගයක් මුල්‍යාධාර ලෙස ලබාගෙන අදාල අවශ්‍යතාවය සහිතවූවන්ට එම තොගය එලෙසම ප්‍රදානය කෙරේ.

මෙමගින් අදාල එම සහෝදරයා තම රෝගයට අවශ්‍ය ප්‍රතිකාර පහසුවෙන් කරගැනීමට, අල්ලාහ්ගේ තෘප්තිය පමණක් අපේක්ෂාවෙන් සහෝදර සහෝදරියන් තමන්ට හැකි ප්‍රමාණයෙන් උදව් කිරීම මගින් එම රෝගීන් හා ඔවුන්ගේ පවුල්වලට විශාල සැනසීමක් ඇතිකිරීමට ජමාඅත් නායකත්වය මෙවැනි උත්සාහයන් කරමින් සිටී.

**07)** වීදි ප්‍රචාරයන් සිදුකිරීම

ජමාඅතුල් මුස්ලිමීන්හි ඊළඟ වැදගත් ක්‍රියාකාරකමක් ලෙස දක්නට ලැබෙන්නේ වීදි ප්‍රචාරක කටයුතු බව සඳහන් කළ හැකිය. මෙම ක්‍රියාකාරකම සම්බන්ධයෙන් විවිධ අංශයන් අඩංගු කර හොඳින් සැලැසුම් සහගතව ජනතාව අතර පිබිදීම ඇතිකිරීමට ජමාඅතුල් මුස්ලිමීන් තමාට හැකි උත්සාහයන් සිදුකරයි.

පිවිතුරු ඉස්ලාමය ජනතාව ඉදිරියේ තැබීමට මත්ද්‍රව්‍ය වැලැක්වීම, ජාතීන් අතර සාමදානය, තරුණයින් - යුවතියන්ගේ යහ ගුණ වර්ධනය, කාන්තාවන් හා ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැලැක්වීම, ගෘහස්ත ප්‍රචණ්ඩත්වයෙන් කාන්තාවන් රැකගැනීම, රටේ කලබල ඇතිකරන කාරණාවලින් තරුණයින් හා තරුණ ළමුන් අවදි කිරීම, අලංකාර සදාචාර ධර්ම ජනතාවට දේශනා කිරීමෙහි අවධානය යොමු කිරීම වැනි බොහෝ කරුණු පදනම් කරමින් මෙම වීදි ප්‍රචාරක කටයුතු ජමාඅතුල් මුස්ලිමීන් සිදුකරයි.

**08)** තරුණ හමු පැවැත්වීම

ජමාඅතුල් මුස්ලිමීන් තවත් වැදගත් ක්‍රියාකාරකමක් වන්නේ සාමාජික මුස්ලිම් තරුණයින් සඳහා හමු පැවැත්වීම හැඳින්විය හැකිය. හෙට සමාජය මෙහෙයවිය හැක්කේ අද තරුණයින් ය. එවැනි තරුණයින් වැරැදි පාරේ නොගොස් අල්කුර්ආන් හා නබිතුමාගේ

දේශනාවන් අඩංගු ඉතා නිවැරදි මාවතේ ගමන් කරවීම සඳහා වන හමු පැවැත්වීම ජමාඅතුල් මුස්ලිමීන් නිතර සිදුකරයි.

තරුණයින් සඳහා වන මෙවැනි හමු මාස හයකට වතාවක් හෝ වාර්ෂිකව ජාතික මට්ටමෙන් පැවැත්වේ. මෙවැනි හමුවලදී ශ්‍රීලංකාවේ සියළු ප්‍රදේශවලින් අවුරුදු 18 සිට 30 දක්වා වයස සම්පූර්ණ කළ සියළුම සාමාජික මුස්ලිම් තරුණයින් සහභාගි වෙති.

මෙහි දී විවිධ කරුණුත් නායක අමීර් සහ අනෙක් උලමාවරු වැනි අය මගින් පැහැදිලි කරනු ලැබේ. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයෙන් තරුණයින් ආරක්ෂා කිරීම, දෑවැද්ද හා නාස්තියෙන් තොර සරල විවාහ මංගල්‍ය උත්සව, නැමදීම ඇතුළු සියළුම ආගමික කරුණුවල උවමනාවෙන් යෙදීම, රටට විරුද්ධ අන්තවාදී ක්‍රියා සහ රජයට එරෙහි උද්ඝෝෂණ, ප්‍රචන්ඩ ක්‍රියා යනාදියෙහි නොයෙදෙන අන්දමට තරුණයින් ආරක්ෂා කිරීම වැනි වැදගත් කරුණු මෙහි සාකච්ඡා කර, තරුණයින්ව ඉස්ලාම් පවසන ඉතා නිවැරදි මාර්ගයේ ගමන් කිරීමට සාධනීය උත්සාහයන් කරයි.

**09)** රජයේ අනුමතිය ලැබූ මද්රසා හා පාසල් පැවැත්වීම

ජමාඅතුල් මුස්ලිමීන්හි ඊළඟ වැදගත් උත්සාහයක් වන්නේ මද්රසා සහ පාසල් පැවැත්වීමයි. හයවැනි ශ්‍රේණිය සමත් පිරිමි සිසුන්ගෙන් මෙම මද්රසා ක්‍රියාත්මක වෙයි. මෙම මද්රසාවෙහි ධාර්මික අධ්‍යාපනය උගන්වන අතර සිසුන් සඳහා වූ විනය ධර්මය, සද්ගුණාංග, අන්‍යයින් සමග සහජීවනයෙන් හැසිරෙන අන්දම, සමාජය මගපෙන්වීමට අවශ්‍ය පෞරුෂත්වය වර්ධනය කිරීම ආදිය ඇතුළුව රජයේ පාසලක උගන්වන විෂයයන් අඩංගු පාසල් අධ්‍යාපන කටයුතුත් මෙහි සිදුවේ.

පාසල් අධ්‍යාපනය හා ආගමික අධ්‍යාපනය ඒකාබද්ධව මෙහි ඉගැන්වේ. සිසුන්ගේ ආගමික අධ්‍යාපනය අවුරුදු හතරක පාඨමාලාවකි. ඉන්පසු ඔවුන් ආගමික අධ්‍යාපනය විශිෂ්ඨ අයුරින් උගත් වියතුන් වශයෙන් ඉන් පිටත් වී, පසුව අ.පො.ස. (සා/පෙ) විභාගයට පෙනී සිටිය හැක. මෙමගින් එකම ස්ථානයේ පාසල් අධ්‍යාපනයත් ආගමික අධ්‍යාපනයත් උගත් ආචාරවත් මිනිසුන් ලෙස රටටත් සමාජයටත් සේවය කළ හැකි ශිෂ්‍ය සමාජයක් බිහිකිරීමට ජමාඅතුල් මුස්ලිමීන් උත්සායහන් දරමින් සිටී.

**10)** මජ්ලිසුෂ් ෂූරා නම් උපදේශන මණ්ඩලයක් පවත්වාගැනීම

ජමාඅතුල් මුස්ලිමීන් තවත් වැදගත් ක්‍රියාකාරකමක් ලෙස දක්නට ලැබෙන්නේ මජ්ලිසුෂ් ෂූරා නම් උපදේශන මණ්ඩලයක් ස්ථාපනය කර තම ක්‍රියාකාරකම් නායකත්වය, උලමාවරු, බුද්ධිමතුන් වැනි අය මගින් පර්යේෂණය කර ඉන්පසු එය ක්‍රියාත්මක කරයි. ජමාඅත්හි ක්‍රියාත්මක කරන ඕනෑම කරුණක් වුවත් ඉතා දීර්ඝ පර්යේෂණයන්ගෙන් පසු ඒවා සාමාජික මුස්ලිම්වරුන්ට ක්‍රියාත්මක කරති. මේ හේතුව නිසා ජමාඅතුල් මුස්ලිමීන්හි මූලික ප්‍රතිපත්තිවල ඉතා ඉහළ ස්තීරත්වයක් දක්නට ලැබේ.

ජමාඅත්හි සියළුම තීන්දු අල්කුර්ආන් හදීස්වලට පටහැණි නොවන අන්දමට වියතුන්ගෙන් සමන්විත උපදේශන සභාවේ හොඳින් සංවාද කර අවසන් තීරණය ගනු ලැබීම හේතුවෙන් මිනිස් නීතිවලට වඩා ඉතා උසස් අල්ලාහ්ගේ ධර්මයට ඇතුලත් අන්දමට ජමාඅත්හි තීන්දු දක්නට ලැබේ. මෙලෙස ජමාඅත්හි සියළු තීන්දු අල්ලාහ්ගේ ධර්මයට අනුකූලව ගැනීම හේතුවෙන් එම තීන්දු මුස්ලිම්වරුන් තුල උසස් විශ්වාසයක් පැවැතීම හොඳින් අවධානය කළ හැක.

# ලංකාවේ ජමාඅතුල් මුස්ලිමීන් ආරම්භය හා වර්ධනය

## ජමාඅතුල් මුස්ලිමීන් බිහිවීම හා වර්ධනය

ශ්‍රීලංකාවේ 1988 අවසන් භාගයේ පුත්තලම - ඒතාලේ ග්‍රාමයේ ආගමික වියතුන් කිහිප දෙනෙකු සහ ආගමට උනන්දුවක් දක්වන මිනිසුන් කිහිප දෙනෙකු එකතු වී මෙම `ජමාඅතුල් මුස්ලිමීන්' සංවිධානය බිහිකළා. මෙලෙස බිහිකර ගත් ජමාඅතුල් මුස්ලිමීන්හි ප්‍රධාන ප්‍රතිපත්ති ලෙස:

- අල්ලාහ්ගේ වදන් වූ අල්කුර්ආනය හා නබිතුමාගේ ජීවන ක්‍රමය වන සහීහ් වූ හදීස් යන දෙක පමණක් ඉස්ලාමයේ මූලාශ්‍ර වේ.
- මුස්ලිම්වරු සියළු දෙනා එකම සංධානයක් - ජමාඅත් වශයෙන් සිටීම අවශ්‍ය ය.
- මුස්ලිම්වරු අල්ලාහ්ගේ ධර්මය අනුකූලව තමන්ව මෙහෙයවන අයෙකු අමීර් ලෙස පත්කර ඔහුට කීකරුව සිටිය යුතුය.
- ජමාඅතුල් මුස්ලිමීන්හි බැඳෙන අයෙකු සත්‍යය පිළිගන්නා ප්‍රතිඥාව (බයිඅත්) අමීර් වෙත සිදුකරගත යුතුය.
- ආගමික තීන්දු දීමේදී, අල්කුර්ආන් සහ හදීස් මත පදනම්ව පමණක් තීන්දු කළ යුතුයි යන්න දක්නට තිබුණි.

ජමාඅතුල් මුස්ලිමීන් ඉතිහාසයේ ජමාඅතුල් මුස්ලිමීන් අමීර්ගෙන් බයිඅත් කර ස්ව කැමැත්තෙන් තමන් ව එහි බඳවාගත් අය වෙන්වී ගිය අවස්ථාවන් සිදු ව ඇත. ඒවා මෙහි කෙටියෙන් බලමු.

# ජමාඅතුල් මුස්ලිමීන්යෙන් යම් පාර්ශවකරුවන් වෙන්වී යාමට හේතු.

සිද්ධිය **01**

1997 දී කිහිප දෙනෙකු ජමාඅතුල් මුස්ලිමීන්යෙන් වෙන් වී ගියහ. ඔවුන්ගේ මුල් කාලීන ප්‍රධාන තර්කය වූයේ `රටේ රජයේ (පොදු) නීතියට අවනත නොවිය යුතු' බව දැක්වුණි. ඒ අනුව ජාතික හැඳුනුම් පත, වාහන බලපත්‍රය, විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට්), විවාහ ලියාපදිංචිය යනාදිය දැනට තිබෙන මුස්ලිම්වරු තබාගත යුතු වුවත් අළුතින් ලබා නොගත යුතුයි යන තර්කය ඉදිරිපත් කළහ. එමෙන්ම අවසානයේ ජමාඅත්යෙන් පිට වී යන අවස්ථාවේ දී ශබ්ද විකාශනයෙන් අදාන් නොකිව යුතුය. මන්ද, නබිතුමාගේ කාලයේ ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා නොවීය, එහෙත් ජමාඅතුල් මුස්ලිමීන් හි අදාන් කීමට ශබ්ද විකාශන භාවිතා වේ වැනි ආගමික පර්යේෂණාත්මක තර්කයන් ඉදිරිපත් කර වෙන් වී ගියහ.

සිද්ධිය **02**

2005 දී තවත් පාර්ශවයක් "වහියට පටහැණි වුවත් සමාජ ප්‍රතිසංස්කරණය අවශ්‍යයි", "සෑම පාර්ශවයක්ම (සියල්ලෝම) මුස්ලිම්වරුය" යන අදහස ඉදිරිපත් කර ජමාඅතුල්

මුස්ලිමීන්යෙන් වෙන් වී ගියහ. අල්කුර්ආනය නොපැවසූ නීති 28 ක් නායකත්වය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතුයි යැයි පැවැසූ අය, එක් අවස්ථාවක නායකත්වය වහියට පටහැණි නීති ක්‍රියාත්මක කරන බව පවසමින් ජමාඅත්යෙන් වෙන් වී ගිය බව සැලකිය යුතුය.

සිද්ධිය 03

2011 පමණ ජමාඅත් අභ්‍යන්තරයේ කැළඹීම ඇති කළ පාර්ශවයක් ජමාඅතුල් මුස්ලිමීන්යෙන් වෙන් වී ගියහ. ඔවුන් ඉදිරිපත් කළ ප්‍රධාන තර්කය නම්, "චින්තනයට නිවැරදි ලෙස දක්නට ලැබෙන කරුණු ඒවා මුස්ලිම්වරුන්ට නො තේරුනත් නායකත්වය ඒවා ක්‍රියාත්මක කළ යුතුය" යන්නයි. මොවුහු ජමාඅතුල් මුස්ලිමීන් ඇතුලත සිටිමින් දිගටම කැළඹීම් ඇති කරමින් සිටීම නිසා "මතභේදාත්මක කරුණුවල සාකච්ඡා පවත්වා තීරණයකට පැමිණෙන තුරු ඒවා ප්‍රචාරය නොකළ යුතුයි" යැයි අදාල පාර්ශවකරුවන්ට නායකත්වය විසින් පරිපාලනමය වාරණයක් පනවා තිබියදීත් "එයට අප අවනත නොවෙමු, දිගටම ප්‍රචාරක කටයුතු වල යෙදෙමු" යැයි නායකත්වයේ තීරණයට එරෙහි අදහස් ඉදිරිපත් කළ අවස්ථාවේ එම පාර්ශවය ජමාඅතුල් මුස්ලිමීන්යෙන් වෙන් වී ගියහ. එමනිසා මෙය පදනම වශයෙන් ගෙන අදාල පාර්ශවය "අමීර්ගේ නියෝගයට අවනත නොවී ජමාඅත්යට එරෙහි වීම හේතුවෙන් ජමාඅතුල් මුස්ලිමීන්යෙන් වෙන් වූ බව නායකත්වය දැනුම් දුන්නේය".

සිද්ධිය 04

2015 දී පමණ ජමාඅතුල් මුස්ලිමීන්යෙන් තවත් පාර්ශවයක් අල්කුර්ආන්, හදීස් යනාදිය සමග නබිතුමාගේ අනුවරයින් (සහාබාවරුන්)ගේ වචන, ක්‍රියා ආදියත් ආගමික මූලාශ්‍ර වේ. ඒවාත් මුස්ලිම්වරයෙකු අනුගමනය කළ යුතුය යන අදහස ඉදිරිපත් කරමින් ජමාඅත්යෙන් ඉවත් වී ගියහ. පාකිස්තානයේ තිබෙන සංවිධානයක ප්‍රතිපත්තිමය බලපෑම මොවුන් මෙලෙස වෙන් වී යාමට ප්‍රධාන හේතුව විය.

ඉහත දැක්වූ අන්දමට ජමාඅතුල් මුස්ලිමීන් වර්ධන මාවතේ සමහර පාර්ශවයන් ආගම පිළිබඳ පූර්ණ පැහැදිලිකම නොමැති වීම හේතුවෙන් සමහර කැළඹිලි ඇතිකර පසුව වෙන් වී ගිය බව අවධානය කළ හැකිය.

# හිටපු අමීර් මව්ලවි උමර් අලිගේ පකිස්තානු ගමන

1988 අවසන් භාගයේ පුත්තලම - ඒතාලේ ග්‍රාමයේ ජමාඅතුල් මුස්ලිමීන් ආරම්භ කරන ලදී. ජමාඅතුල් මුස්ලිමීන් මූලාරම්භකයින්ගෙන් අයෙකු වූ මව්ලවි උමර් අලි (රියාදි) මෙම සංවිධානයේ 1992 සිට 2016 දක්වා අමීර් වශයෙන් ක්‍රියාකළේය. 1992 සිට 2015 කාලය දක්වා පකිස්තානයේ තිබෙන සංවිධානයක් සමග බැදී එම සංවිධානයේ ශාඛාවක් ලෙස මව්ලවි උමර් අලි (රියාදි)ගේ නායකත්වය යටතේ ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාත්මක වීය.

ලංකාවේ ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය ආරම්භ කළ කාලයේ, සමහරු මෙවැනි ප්‍රතිපත්ති හා මත සමග පකිස්ථානයේ කරච්චි නගරයේ සංවිධානයක් තිබෙන බව ලංකාවේ නැගෙනහිර පළාතේ අයෙකු තමන් සමග සවුදි අරාබියේ සේවය කළ අයෙකු පැවැසූ බවට ලැබුණු තොරතුර පදනම් කරමින් මව්ලවි උමර් අලි සහ තවත් කිහිප දෙනෙකු එම පකිස්තාන් සංවිධානයේ සැබෑ තත්වය දැනගැනීමට 1990 දී පකිස්තානය බලා ගමන ආරම්භ කළහ.

පකිස්තානයේ අදාල සංවිධානය සොයා දැනගැනීමට උත්සාහ කළ කාලසීමාවේ මව්ලවි උමර් අලි හැර අනෙක් අයගේ විදේශ ගමන් බලපත්‍ර වලංගු කාලය අවසන් වන තත්වයක සියල්ලෝම ලංකාවට හැරුණා. එහෙත් පකිස්තානයේ බොහෝ ස්ථානවල සොයා අවසානයේ එම සංවිධායකයින් හමු වූ මව්ලවි උමර් අලි ඔවුන්ගේ විවෘතභාවය දැක `එම සංවිධානයත් අපිත් එකම ප්‍රතිපත්තියක් සහිතවූවන්' යැයි තීරණය කර, එය ලංකාවේ තිබෙන ජමාඅතුල් මුස්ලිමීන් වාගේම දක්නට ලැබුණ නිසා "අල්ලාහ්ගේ කඹය තදින් ග්‍රහණය කරගනිවු" (3:103) යන අල්කුර්ආන් වදනට අනුව ලංකාවේ 1988 වර්ෂයේ අවසාන භාගයේ බිහිවූ ඔබගේ සංවිධානයට වඩා පකිස්තානයේ තිබෙන සංවිධානය මුලින් වීම මත පදනම් ව එය සමග බැඳී එහි ලංකා ශාඛාව වශයෙන් ක්‍රියාත්මක වීමට තීරණය කළහ.

පකිස්තානයේ පිහිටි එම සංවිධානයේ මූලික ප්‍රතිපත්තියක් වන්නේ "අල්කුර්ආන් හදීස් ආදිය සමග නබිතුමාගේ අනුචරයින්ගේ ස්වයං මත, ක්‍රියාකාරකම්, විවරණයන් යනාදියත් ධර්මය වේ" යන ප්‍රතිපත්තියයි. එතැනින් පමණක් ඔවුන් නොනැවතී මෙවැනි ස්වයං පුද්ගල අදහස් සියල්ල, `මේවා සියල්ල අල්ලාහ්ගෙන් පැමිණි ඒවාය' යන නොමඟ ගිය නිරූපණයත් පවසමින් සිටියහ.

මෙවැනි ප්‍රෝඩාකාරී කරුණු සියල්ල ලංකාවේ තිබෙන ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයට නිවැරදිව අවබෝධ නොවී තිබුණි. මෙයට ප්‍රධාන හේතුවලින් එකක් වන්නේ භාෂාව ප්‍රශ්නයයි. ලංකාවේ දෙමළ කථාකරන මුස්ලිම්වරුන්ගෙන් ස්වල්ප දෙනෙකු හැර බහුතරයට පකිස්තාන් සංවිධානය භාවිතා කරන උර්දු භාෂාව ලිවීමට හෝ කියැවීමට නොදැන සිටීමය. ඊටත් වඩා අති භයානක කාරණාවක් ද තිබුණි. එය කුමක් ද යත්, පකිස්තාන් සංවිධානය තමන් තුල තිබූ තමන් නිවැරදි ලෙස සැලකූ සමහර වැදගත් නොමඟයන් ලංකාවේ තිබෙන සංවිධානයට ප්‍රසිද්ධ නොකර වසං කිරීමත් වේ.

එමෙන්ම ලංකාවේ උර්දු භාෂාව දන්නා කිහිප දෙනෙකුත් පකිස්තාන් සංවිධානයේ වංචනික කපටකම නොදැන ඔවුන්ව ගැඹුරින් නොහදාරා විවෘතව හොඳහිත මත පමණක් ගමන් කළහ. මීට හේතුව, එකී සංවිධානයේ නායකයින් සහ අනෙක් ප්‍රධානීන් ලංකාවට පැමිණෙන අවස්ථාවල ප්‍රසිද්ධියේ කුර්ආන් හදීස් පමණක් ධර්මය යැයි පැවැසීමත්, තම රටට ගිය පසු කුර්ආන් හදීස් සමග අනෙක් ඓතිහාසික සිද්ධීන්, වියතුන්ගේ ස්වයං මත සහ, ධර්මයේ නොමැති ස්වයං තීරණත් ආගම යැයි පැවැසීමත් ඔවුන්ගේ ප්‍රධාන නරග ගුණයන්ගෙන් එකකි.

මේවා එම පකිස්තාන් සංවිධානයේ නායකත්වය සහ ප්‍රධානීන් සමහර අවස්ථාවල ඔවුන් නොදැන එළිකරමින් ද සිටියහ. මේවා දකින ලංකාවේ තිබෙන සංවිධානයේ මුස්ලිම්වරු ඔවුන්ගේ මෙම ප්‍රෝඩාව පෙන්වා ප්‍රශ්න කරන අවස්ථාවල, පකිස්තාන් සංවිධායකයින් "එවැනි අඩුපාඩු අප නොදැනුවත්ව නිකුත්වුණා. ඒවා වහාම අපගේ පොත්වලින් ඉවත් කරගන්නෙමු" යැයි ලංකාවේ සංවිධානයේ සාමාජික මුස්ලිම්වරුන්ට පොරොන්දු දීමත්, පකිස්තානයට ගියහොත්, අප ඉවත් කරන බව පවසන නොමගයන් නොදුටුවා සේ සිටීමත්, දිගටම ඔවුන්ගේ මෙම නොමඟ ප්‍රෝඩාවන් ඔවුන්ගේ ප්‍රායෝගිකයේ දක්නට ලැබීමත්, ලංකාවේ තිබෙන ජමාඅතුල් මුස්ලිමීන්යට සැකය තවත් වැඩිකරන්නක් වීය.

ඒ අනුව කාලයක් ගත වූ පසු ඔවුන්ගේ සායම අල්ලාහ්තආලා හේදුවේය. එය කෙසේද යත්, ලංකාවේ තිබෙන ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය මගින් පකිස්තානයේ තිබෙන එම සංවිධානයෙන් නිකුත් කළ පොත් කිහිපයක් කියවමින් සිටින අවස්ථාවේ එම පොත්වල ඉස්ලාමයේ පදනම බිඳිය හැකි සමහර අංශ දැකීමට සිදුවිය. ඒවා කුමක් ද යත්, "අල්ලාහ්ගේ ධර්මයේ සඳහන් නොවන නබිතුමාගේ අනුචරයින්ගේ සාමුහික මත

(ඉජ්මාවුස් සහාබා) ලෙස සටහන් වී තිබෙන කරුණුත් අල්ලාහ්ගේ ධර්මයේ ඇති දැය" යැයි අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන්ට එරෙහි ව ප්‍රබන්ධ ගෙතීමයි. එමෙන් නබිතුමා නොපැවසූ ආගමික කරුණු සහාබාවරු පැවසූ බවත් සිදුකළ බවත් නබිතුමාගේ අනුවරයින් මත මෙම පකිස්තාන් සංවිධානය ප්‍රබන්ධ කර ලියා තිබුණහ.

ඒවාගේම තවත් බොහෝ නොමගයන් එවැනි පොත්වල සොයාගන්නා ලදී. සමහර වැදගත් සත්‍යයන් එළියට පැමිණියේ එවිට ය. ඒවා කුමක්ද යත්, මෙම පකිස්තාන් සංවිධානය ආරම්භ කළ අවස්ථාවේම අල්ලාහ්ගේ ධර්මයේ නොමැති මෙවැනි නොමගයන් ඔවුන් සමග තිබුණු බවත් මෙම නොමගයන් ආරම්භයේ ඔවුන් සමග සිටි කිහිප දෙනෙකු විසින් පෙන්වා දුන්නත් ඒවා එම සංවිධානය නිවැරදි නොකර ප්‍රතික්ෂේප කරමින් සාධාරණීකරනය කිරීමත් දැනගන්නට ලැබුණි. එවැනි තත්වයක තමා ලංකාවේ තිබෙන මෙම සත්‍ය කණ්ඩායම ඔවුන්ව හමුවූ වේලාවේ තමන්ගේ නොමගය වසං කර මෙම මුස්ලිම්වරුන්ගේ සංධානය රවටා තමන් සමග එකතු කර ගමන්කිරීම ආරම්භ කිරීමත් ප්‍රසිද්ධ විය.

## පැහැදිලි නොමග ගිය පාර්ශව

මෙවැනි පසුබිමෙක ලංකාවේ තිබෙන සංවිධානය තුල මේ පිළිබඳව මතභේද ඇතිවන්නට වීය. ඒවා කුමක්ද යත්, මෙම පකිස්තාන් සංවිධානය පැහැදිලි නොමග ගිය පාර්ශවයක් බැවින් පළමුව ඉන් ඉවත් වී අප වෙන්විය යුතු බව එක තර්කයක් සහ, අප හදිසි වී ඉවත් නොවී ඔවුන්ට අවසාන අවස්ථාවක් ලබා දී ඔවුන්ව අප නිවැරදිකර සත්‍යය තවත් පැහැදිලි කළ යුතුයි යැයි අදහසක් ද ඉදිරිපත් කරනු ලැබුවා.

ඒ අනුව ලංකාවේ තිබෙන මෙම සංවිධානයේ නායකත්වය තීරණයක් ගත්තේය. එය කුමක්ද යත්, එම පකිස්තාන් පාර්ශවයට මාස තුනක කාලයක් අවස්ථාව ලබා දී ඒ අතරතුර ඔවුන් තමන්ව නිවැරදි කරගත්තොත් ඔවුන් සමග එකතු වී ගමන් කරනවා යැයි තීරණය කරන ලදී.

එහෙත් එම පකිස්තාන් පාර්ශවය, අපගේ සංවිධානයේ නායකයා ලියූ පොතෙහි කිසිවක් අප වෙනස් නොකරන්නෙමු. අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් විසින් නොපවසන ලද ඓතිහාසික සිදුවීම් ඉස්ලාමයේ මූලාශ්‍රවලින් එකකි යන මතයෙහි දැඩිව සිටියහ. එතැනින් නොනැවතී එම විශ්වාසය ලංකාවේ තිබෙන මෙම සංවිධානයත් අනුගමනය කළ යුතුයි යැයි නියෝග කළා. එවිට ය, මෙම පකිස්තාන් සංවිධානය නබිතුමා විසින් අවවාද කරන ලද නිරයට කැඳවන පාර්ශවවලින් එකක් යන කරුණ සත්‍යයේ සිටින මෙම මුස්ලිම්වරු සියල්ලන්ටම වඩා පැහැදිලිව නිරූපණය වූයේ.

"සියළු බෙදීම්වලින් ඉවත්වන්න" (සහීහුල් බුහාරි : 3606) යන නියෝගය අනුව එම නොමග ගිය පාර්ශවයෙන් මෙම සත්‍ය සංධානය 2015 වසරේ දී ඉවත් විය. ඒ අතර ලංකාවේ සිටින මෙම සත්‍ය සංධානයේ බැඳී සිටි සමහරු මෙම සත්‍යයෙන් පිට වී එම කාලවකවානුවේ ම පකිස්තානයේ එම අසත්‍ය සංධානයේ බැඳුනහ.

1988 සිට "අල්කුර්ආන් හදීස් පමණයි ඉස්ලාමයේ පදනම" යැයි ජමාඅතුල් මුස්ලිමීන්හි බැඳී එහි ප්‍රතිපත්තිය අනුගමනය කර ජීවත්වූවෝ, 2015 සිට අල්කුර්ආන් හදීස් යනාදිය සමග තුන්වැනි මූලාශ්‍රයක් වූ `ඉජ්මාඋස් සහාබා' යන සහාබාවරුන්ගේ වදන් සහ ක්‍රියා ධර්මය ලෙස පිළිපැදිය යුතුයි යන නොමග ගිය ප්‍රතිපත්තිය තුලට ප්‍රවිශ්ඨ වෙති. මොවුන් ය, ජමාඅතුල් මුස්ලිමීන්යෙන් අවසානයේ ඉවත් වී ගිය පාර්ශවය වන්නේ.

# ප්‍රචලිත විවාදය

ජමාඅතුල් මුස්ලිමීන් තම ඉතිහාසයේ විවිධ පාර්ශවකරුවන් සමග සංවාද සාකච්ඡා සුහද අන්දමින් පවත්වා ඇත. ඉන් බෙහෙවින් ප්‍රචලිතව දක්නට ලැබෙන්නේ, 1993.07.14 වැනිදා දකුණු ඉන්දියාවේ තමිල්නාඩුවේ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග පුත්තලම නගර ශාලාවේ පැවැති විවාදය දැක්විය හැක. එවක තව්හීද් පාර්ශවයත් ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයත් අතර පැවැති මෙම විවාදයේ ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයට සුවිශාල ජයග්‍රහණයක් අල්ලාහ්තආලා ලබාදුන්නේය.

විවාදයේ ගිවිසුම අනුව දෙපාර්ශවයටම මිනිත්තු 45 බැගින් තම ප්‍රතිපත්ති පැහැදිලි කිරීමට ලබා දී තිබුණි. ඒ අනුව ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයට නායකත්වය දුන් එම සංවිධානයේ එවක අමීර් මව්ලවි උමර් අලි (රියාදි) එම විවාදයේ ආරම්භය වශයෙන් ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්තිය ඉතා පැහැදිලිව ඉදිරිපත් කර තිබුණා. පසුව තව්හීද් පාර්ශවයේ ප්‍රතිපත්තිය පැහැදිලි කිරීමට ඉදිරිපත් වූ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් තම ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම අතහැර කෙළින්ම විවාදයට ඇතුළ් වන බව පවසා "බයිඅත් සම්බන්ධ හදීසය වාර්තාකළ නාෆි ඔබලාට මෙය සෘජුවම වාර්තා කළාද" යැයි ප්‍රශ්න කිරීමට පටන් ගත්තා.

මෙහි දී අප අවධානයට ලක්කළ යුතු කාරණාව නම්, විවාද ගිවිසුම අනුව මිනිත්තු 45 ක් තම ප්‍රතිපත්තිය පැහැදිලි කළ යුතු මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්, ඉන් ඉවත්වී කෙළින්ම විවාදයට ඇතුළ් වුණා. ජමාඅතුල් මුස්ලිමීන් යන වහිය පමණක් පදනම් කරගත් සත්‍යය ඉදිරිපත් කරමින් සිටින පාර්ශවය ඉදිරියේ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් තම ප්‍රතිපත්තිය පැහැදිලි කිරීම නොකර සෘජුව විවාදයට ඇතුළ් වීම ඔහුගේ උපක්‍රමික ක්‍රියාවක් ලෙස දැකිය හැක.

මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ගේ ප්‍රතිපත්තිය කුමක්ද? මිනිත්තු 45 කින් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් තම ප්‍රතිපත්තිය ලෙස කුමන දේවල් ඉදිරිපත් කරනු ඇත්ද? මෙම ලෝකයේ ජීවත්වන කලිමාව පැවැසූ සියල්ලෝම මුස්ලිම්වරුය. ඔවුහු කුමනාකාරයේ ෂිර්ක්වල හෝ කුෆ්ර්වල හෝ යෙදුනත් ඔවුන් මුස්ලිම්වරු ලෙස සැලකිය යුතුය. මෙලෙස හුදු පේළි දෙකකින් තම ප්‍රතිපත්තිය ඉදිරිපත් කළ හැකි අයෙකු මිනිත්තු 45 ක් අරගත යුත්තේ කුමටද? කලිමාව පැවැසූ සියල්ලෝම මුස්ලිම්වරුය. ඔවුන් නැමදීම නොකළත් උපවාසය නොරැක්කත් හජ් නොකළත් මුස්ලිම්වරුය. දර්හාවල කබ්රුමයි ජීවිතේ යැයි දිවිගෙවන්නන් පවා මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ට අනුව මුස්ලිම්වරුය. එනම් `ආදේශ පිහිටුවන මුස්ලිම්වරු' ය. මෙයයි, මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ගේ ප්‍රතිපත්තිය වන්නේ.

මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් ඇතුළු ඔහුගේ පාර්ශවකරුවන් ඉස්ලාම් පවසන බයිඅත් නොමැත්තන් වෙති. එමනිසා ඔවුන් මුස්ලිම් නොවේ, ඔවුන්ව මුස්ලිම් යැයි පිලිගැනීමට නොහැක යන තර්කය ජමාඅතුල් මුස්ලිමීන්හි එවක අමීර් උමර් අලි (රියාදි) එම විවාදයේ දී ඉදිරිපත් කළා. එය ප්‍රතික්ෂේප කර අපත් මුස්ලිම්වරු තමා යැයි සාධක සහිතව නිරූපණය කළ යුතු මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් ඇතුළු ඔහුගේ තව්හීද් පාර්ශවකරුවන් අදාල බයිඅත් සම්බන්ධ හදීසය වාර්තා කළ වාර්තාකරු වන නාෆි ඔබලාට මෙය සෘජුවම වාර්තා කළාද? යැයි විවාදයට කිසිසේත්ම සම්බන්ධ නොවන තර්කය ඉදිරිපත් කරමින් ම සිටියා. `බයිඅත් නොකළත් තමනුත් තමා ව අනුගමනය කරන තව්හීද් පාර්ශවයත් මුස්ලිම්වරු ම තමා' යැයි සාධක මගින් ඒ වේලාවේ තහවුරු කිරීමේ වගකීම පැවැරී තිබුණු මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් එය එම ස්ථානයේ ඉටුකිරීමට අපොහොසත් වූවේය යන්නයි යථාර්ථය.

ඇත්තෙන්ම මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් බයිඅත් නොකළත් අපිත් මුස්ලිම් තමා යන්නට සාධක ඉදිරිපත් කර, ජමාඅතුල් මුස්ලිමීන් තර්කය බිඳිනු ඇත, අදින් ජමාඅතුල් මුස්ලිමීන් කතාව අවසන් යැයි මහත් ආශාවෙන් බලා සිටි සියළුම තව්හීද් පාර්ශවකරුන්ට මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ගේ මෙම ක්‍රියාව මහත් භංගත්වයක් වීය. මෙය ජමාඅතුල් මුස්ලිමීන්ට අල්ලාහ් එම ස්ථානයේ ම ලබාදුන් ජයග්‍රහණයකි, අල්හම්දුලිල්ලාහ්.

මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සහ විවාදයට සහභාගි වූ ඔවුගේ තව්හීද් පාර්ශවකරුවන් ජමාඅතුල් මුස්ලිමීන් ඉදිරිපත් කළ සත්‍යය පිළි නොගෙන, එය ප්‍රතික්ෂේප කරන අන්දමට කිසිම සාධකයක් ඉදිරිපත් නොකර, දිගින් දිගටම විවාද මාතෘකාවට සම්බන්ධයක් නැතිව කතාකරමින් සිටි නිසා, වහියේ මගපෙන්වීම අනුව ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය පී. ජෙයිනුල් ආබ්දීන් සහ විවාදයට සහභාගි වූ ඔහුගේ පාර්ශවකරුවන්ව මුබාහලා නම් විනාශ දිවුරුමට කැඳවීය.

එහෙත් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්, මෙහි මුබාහලා කළ නොහැකියි පැවැසූ අතර තමිල්නාඩුවට මුබාහලා කිරීමට පැමිණෙන මෙන් පවසමින් සිටියා. ඉන්දියාවේ සිට දහස් ගණන් වියදම් කර ලංකාවට පැමිණි ඔබ, විවාදය පැවැති ස්ථානයේ ම `මුබාහලා' අවසන් කර යෑම තමා බුද්ධිමත් ක්‍රියාව. මුබාහලා සඳහා පමණක් ඉන්දියාවට පැමිණීම අධික වියදම් ඇතිකරයි යැයි මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් පාර්ශවයට ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය කිහිප වතාවක්ම පැවැසූවත් ඔවුහු තම මතයේ ම මුරණ්ඩුව සිටියා.

මේ හේතුව නිසා ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය මුබාහලා කිරීමට ඉන්දියාවට යාමට උත්සාහ කළත් විදේශගත වීමේ ලේඛණ ලබාගැනීමේ දී ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයට සිදුවූ ප්‍රමාදයන් නිසා ගමන අදාල සංවිධාන කටයුතුත් පමා වෙමින් තිබුණා. මේ අතර, ගමනට සිදුවන ප්‍රමාදය අදාල කරුණු පැහැදිලි කරමින් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සහ ජමාඅතුල් මුස්ලිමීන් අතර ලිපි හුවමාරු වෙමින් තිබුණි. මෙම තත්වයේ හදිසියේම මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් විසින් `ජමාඅතුල් මුස්ලිමීන් සමග මුබාහලා අවලංගු කරන්නෙමු' යන දැන්වීමක් පළ කළේය. මෙම දැන්වීම `ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශයව මුබාහලා සඳහා ඕනෑම වේලාවක ඉන්දියාවට පැමිණිය හැක' යැයි ආරම්භයේ ලිඛිතව පවසා තිබීමට පටහැණි දැන්වීමකි.

තව්හීද් පාර්ශවයේ මව්ලවිවරුන් වන එම්.එස්. අබ්දුල් වදූද් (ජිෆ්රි), පී.එම්. සිද්දීක් (කාසිමි), එම්.සී. අන්සාර් (රියාදි) වැනි අය මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග විවාදයේ සහභාගි වූවෝ වෙති. ඔවුනුත් එකතු කරමින්ය විවාද මාතෘකාව තබා තිබුණේ. විවාදය පැවැති දිනයේ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් විසින් මුබාහලා සිදුකිරීමට නොහැකි විය. එමෙන්ම ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය අපටද ඉන්දියාවට යාම සඳහා ලේඛණ සකස් කිරීමේ ප්‍රමාදයන් ඇතිවූ තත්වයක් හේතුවෙන් මව්ලවිවරු වන එම්.එස්. අබ්දුල් වදූද් (ජිෆ්රි), බී.එම්. සිද්දීක් (කාසිමි), එම්.සී. අන්සාර් (රියාදි) යනාදීන් ව ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය සමග මුබාහලාවට පැමිණෙන මෙන් දිනයක් දන්වා 1994.04.23 වැනිදා කැඳවීමක් කළෙමු. මේ සඳහා අදාල එම දිනයේ ජමාඅතුල් මුස්ලිමීන්යේ ඒතාලේ මස්ජිදුල් මුස්ලිමීන් පල්ලියේ මිදුලේ ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය මුබාහලා කිරීමට සූදානම් ව තව්හීද් පාර්ශවයේ පැමිණීම අපේක්ෂාවෙන් සිටියත් තව්හීද් පාර්ශවයේ කිසිවෙකුවත් පැමිණියේ නැත.

ඉන් පසු, මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් අවුරුදු දෙකකට පසුව නැවතත් ලංකාවට පැමිණියා. එම අවස්ථාවේදී ඔහුව මුබාහලා කිරීමට පැමිණෙන මෙන් නැවතත් තව්හීද් පාර්ශවයට ලිපි මගින් අප ආරාධනා කළෙමු. එහෙත් එම ආරාධනාවටත් තව්හීද් පාර්ශවය කිසිම කටයුත්තක් සිදු නොකර ඉවත් වූවා.

මෙලෙස විවාදය පැවැති දිනයේ ම මුබාහලාවට කැඳවූවත් එය සිදුකිරීමට තව්හීද් පාර්ශවය ඉදිරිපත් නොවීම, ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය මුබාහලාවට ඕනෑම අවස්ථාවක ඉන්දියාවට පැමිණිය හැකිය යැයි ආරම්භයේ ලිඛිතව පවසා තිබීමට වෙනස් වන හදිසියේ මුබාහලාව අවලංගු කළ බව මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් පැවැසීම, ලංකාවේ සිටින මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග විවාදයේ සහභාගි වූවන්ව මුබාහලාවට කැඳවූවත් ඔවුනුත් පැමිණීම ප්‍රතික්ෂේප කිරීම, අවුරුදු දෙකකට පසු ලංකාවට මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් පැමිණි අවස්ථාවේ නැවතත් ඔහුව මුබාහලාවට කැඳවාගෙන එන මෙන් තව්හීද් පාර්ශවයට ලිපි මගින් ආරාධනා කර තිබුණත් එයටත් පැමිණීම ප්‍රතික්ෂේප කිරීම වැනි කාරණා මුබාහලි විෂයය මධ්‍යස්ථව බලන විට මුබාහලා කිරීමට බොහෝ අවස්ථා ඇති වූවත් ඒවා ප්‍රයෝජනයට නොගෙන ඉවත් වූ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සහ තව්හීද් පාර්ශවයේ සැලැසුම් සහගත පසුබැසීම් නිසා ඇත්තෙන්ම අල්ලාහ්තආලා ජමාඅතුල් මුස්ලිමීන්ට දුන් සුවිශාල ජයග්‍රහණයන් වූ බව දැකිය හැක, අල්හම්දුලිල්ලාහ්

## විවාදයෙන් පසු ජමාඅතුල් මුස්ලිමීන් ක්ෂණික වර්ධනය

1993 මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග සිදු වූ විවාදයෙන් පසු ජමාඅතුල් මුස්ලිමීන් කඳවුර කඩාවැටුණා යැයිද ජමාඅතුල් මුස්ලිමීන් තුළ කොටසක් වෙන් වී ගියා යැයි ද සමහරු ප්‍රබන්ධ කතා මිනිසුන් අතර පතුරුවා ඇත. මෙම කතාවල මදක් හෝ ඇත්තක් තිබෙනවා දැයි නිරීක්ෂණය කරමු.

මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග සිදු වූ විවාදය මධ්‍යස්ථව බලන අයෙකු, ඇත්තෙන්ම අදාල විවාදය මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ටත් හෝ ඔහු අයත් තව්හීද් සංවිධානවලටත් සඳහන් කළ හැකි තරම් විශේෂිත ජයග්‍රහණයක් අත්කර නොදුන් බව අවබෝධ කරගනු ඇත. හේතුව, ජමාඅතුල් මුස්ලිමීන් ඉදිරිපත් කළ තර්කවලට අල්කුර්ආන් හදීස් සාධක පදනම් කරමින් ප්‍රතිතර්කයේ නොයෙදී අදාල බයිඅත් හදීසය වාර්තාකළ වාර්තාකරු ගැන ම මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් දිගින් දිගටම අසමින් සිටියේය. මෙම අවස්ථාවේදී ම, මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් වක්‍රව තම නොහැකියාව පිළිගත්තේය. බොහෝ විවාද වලදී සාධකයන් විසුරුවමින් ප්‍රතිවාදීන්ගේ තර්ක සුනු විසුනු කරන හැකියාව ඇති මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් මෙම විවාදයේත් එවැනි හැකියාවක් පෙන්වා ජමාඅතුල් මුස්ලිමීන්හි බයිඅත් නම් පදනම බිඳුනු ඇතැයි අපේක්ෂාවෙන් සිටි තව්හීද් පාර්ශවයට විශාල භංගත්වයක් ඇති වීය.

සහීහුල් මුස්ලිම් නම් හදීස් ග්‍රන්ථයේ සඳහන් වන බයිඅත් අදාල හදීසය "කාගේ බෙල්ලෙහි බයිඅත් නොමැත්තේ ද ඔහුගේ මරණය ජාහිලීය මරණයකි" (3771) යන හදීසය සහීහ් යැයි පිළිගෙන තිබූ පී. ජෙයිනුල් ආබ්දීන් එම විවාදයේ දී `බයිඅත් සම්බන්ධ හදීසය වාර්තාකළ වාර්තාරු නාෆි මෙය සෘජුවම ඔබලාට දැනුම්දුන්නාද?' යැයි විවාදයට කිසිම සම්බන්ධකමක් නැති තර්කය දිගටම ඉදිරිපත් කරමින් සිටියේය.

ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයට මුහුණ දීමට තමා සතුව එක සාධකයක් හෝ නොමැති බව ඔහු එම අවස්ථාවේ ප්‍රසිද්ධ කරගත්තේ ය. එමනිසා අදාල විවාදයෙන් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් පසුබැස්ස බව විවාදය දෙස මධ්‍යස්ථව බලන්නෙකුට පැවැසිය හැක. මෙම විවාදයෙන් ඔහු ජය ගෙන තිබුණා නම් හෝ ජමාඅතුල් මුස්ලිමීන් ඉදිරිපත් කළ තර්ක බිඳින අන්දමට සාධක කිහිපයක් හෝ ඉදිරිපත් කළා නම් ජමාඅතුල් මුස්ලිමීන් කූඩාරම කඩාවැටුණේය, ජමාඅතුල් මුස්ලිමීන් අභ්‍යන්තරයේ මෙම විවාදය අදාලව භේදයන් ඇති වීය වැනි කරුණු යම් තරමකට පිළිගැනීමට පුළුවන. එහෙත් එම විවාදයේ කිසිම දියුණුවක් එළිනොදැක්වූ මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් විසින් ජමාඅතුල් මුස්ලිමීන් කඳවුර කඩාවැටුණේ ය, ජමාඅතුල් මුස්ලිමීන් තුල අභ්‍යන්තර භේද ඇති වුණේ ය යනාදී මත මධ්‍යස්ථව විවාදය අවධානය කළ කිසිවෙකු නොපවසනු ඇත.

මෙම විවාදයෙන් පසුව ජමාඅතුල් මුස්ලිමීන්හි වර්ධනය ගත් කළ මෙම විවාදය පැවැත්වීම දක්වා දහසක පමණ පිරිසක් දක්නට ලැබුණු සාමාජික සංඛ්‍යාව අද වනවිට අල්ලාහ්ගේ මහෝපකාරයෙන් තවත් අධික වී දක්නට ලැබේ. ඒ සමග එදා ලංකාවේ දක්නට ලැබුණු ශාඛා 12 අද වනවිට ශාඛා 30 දක්වා වර්ධනය වී ඇත. එමෙන්ම ලංකාවේ පමණක් තිබුණු ජමාඅතුල් මුස්ලිමීන් ශාඛා මෙම විවාදයෙන් පසු මුහුද තරණය කර බිහිවීමත් මෙහිලා අවධානයට ලක් කළ යුතු අංශ වේ.

ඉන්දියාවේ තමිල්නාඩුවේ ජමාඅතුල් මුස්ලිමීන් ශාඛා ආරම්භ කිරීමටත් විවිධ පාර්ශවවල අසත්‍යයේ ජීවත් වූ මිනිසුන් සත්‍ය ඉස්ලාමය අනුගමනය කර ජමාඅතුල් මුස්ලිමීන්හි තමන්ව බඳවාගෙන ජීවත්වීමටත් පී. ජෙයිනුල් ආබ්දීන් සමග වූ විවාදය මූලික හේතුව වූයේ ය. ඒ අනුව තමිල්නාඩුවේ තෙන්කාසි දිස්ත්‍රික්කයේ ජමාඅතුල් මුස්ලිමීන් තමිල්නාඩු ශාඛාව දක්නට ලැබීම විශේෂය. ඉහත කරුණු අවධානයට ලක්කිරීමේ දී මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග වූ ඉහත විවාදයෙන් පසු ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවයට අල්ලාහ්තආලා සුවිශාල ජයග්‍රහණයන් ලබා දී ඇති බව යථාර්තයකි, අල්හම්දුලිල්ලාහ්

ජමාඅතුල් මුස්ලිමීන් වෙතින් සමහර පාර්ශවයන් වෙන් වී ගොස් තිබුණත් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග වූ විවාදයෙන් පසුව එම විවාදය අදාලව කිසිම භේදයක් සිදු නොවූ බව ඇත්ත තත්වයයි. ජමාඅතුල් මුස්ලිමීන් වෙතින් සමහර පාර්ශව වෙන් වී යාමට ඉදිරපත් කළ හේතු කාරණා ඉතා පැහැදිලි ලෙස පෙර පැහැදිලි කර ඇත්තෙමු. මෙම හේතුවලින් එකක්වත් මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන්ගේ විවාදයට සමානව දැකිය නොහැක.

එමෙන්ම අදාල විවාදය වීඩියෝ නොකළ යුතු බව ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය කොන්දේසි පනවා තිබුණත් තව්හීද් පාර්ශවය ඊට එකඟ නොවී වීඩියෝ කළේ ය. එලෙස ඔවුන් වීඩියෝ කළ එම වීඩියෝව අද වනතුරු තව්හීද් පාර්ශවය එළිනොදක්වා සඟවා තබා ඇති බවත් ජනතාවට පෙන්වා දීමට කැමැත්තෙමු.

එමනිසා ඉහත කරුණු පදනම් කරගෙන බලන විට 1993 පුත්තලම නගර ශාලාවේ පැවැති තව්හීද් පාර්ශවය සහ ජමාඅතුල් මුස්ලිමීන් පාර්ශවය අතර විවාදය, ජමාඅතුල් මුස්ලිමීන් වර්ධනයේ සත්‍යයට ලැබුණු සුවිශාල ජයග්‍රහණයක් ලෙසත් අසත්‍යවාදින්ට ඉන් විශේෂයෙන්ම තව්හීද් පාර්ශවයට එදා ඇති වූ අවමානයක් වීමත් සඳහන් කළ යුතුය. එමනිසා, මව්ලවි පී. ජෙයිනුල් ආබ්දීන් සමග වූ විවාදයෙන් පසු ජමාඅතුල් මුස්ලිමීන් කඳවුර කඩාවැටී ජමාඅතුල් මුස්ලිමීන් අභ්‍යන්තරයේ භේදයන් ඇති වී අද වනවිට ස්වල්ප දෙනෙකු පමණක් ජමාඅතුල් මුස්ලිමීන්හි ඉතිරි වී සිටිති ආදී බොරු ජනතාව අතර පතුරුවා ප්‍රචාරය නොකරන මෙන් අදාල පාර්ශවයන්ගෙන් කාරුණික ව ඉල්ලා සිටිමු.

එපමණක් නොව, ජමාඅතුල් මුස්ලිමීන් අද ලංකාවේ ක්‍රියාත්මක වන සියළුම පාර්ශව සමග අලංකාර සාකච්ඡා පැවැත්වීමටත් ඕනෑම වේලාවක සූදානමින් සිටියි, ඉන්ෂා අල්ලාහ්. ඕනෑම පාර්ශවයකට අයත් වූවෙකු වූවත් පුද්ගලිකව හෝ තමා සම්බන්ධ සංවිධානය මගින් හෝ සුහදව අලංකාර ලෙස සංවාද සාකච්ඡා - සුහද ව පැවැත්වීමට - ජමාඅතුල් මුස්ලිමීන් සමග සම්බන්ධීකරණය විය හැකි බව මෙමගින් ජනවාතට ප්‍රකාශ කිරීමට කැමැත්තෙමු. ඒ අතර ජමාඅතුල් මුස්ලිමීන් වෙතින් වෙන් වී ගිය පාර්ශව සමග කිසිම සංවාදයක්, විවාදයක් හෝ, සාකච්ඡාවක් සිදුනොකිරීමේ තීරණයේ ජමාඅතුල් මුස්ලිමීන් දැඩිව සිටී.

එනිසා මද වශයෙන් හෝ කල්පනා නොකර ප්‍රබන්ධයන් ජනතාවට ඉදිරිපත් කරන බොරුකාරයින්ගේ අපවාද අසා මින් ඉදිරියටත් නොරැවටී ජමාඅතුල් මුස්ලිමීන්හි ඉතිහාසය එහි ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් අදාල සෑම සැකයක්ම, ප්‍රශ්නයක්ම, පැහැදිලි

කිරීමක් සඳහා ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය හෝ ශාඛා අමීර්වරුන්ගෙන් හෝ එහි උලමාවරු සම්බන්ධ කරගෙන ලබාගන්නා මෙන් ඉල්ලා සිටිමු.

# ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් අන්තවාදය පොළඹවනවා ද?

## ජමාඅතුල් මුස්ලිමීන් සහ අන්තවාදය

`අන්තවාදය' හෝ `ප්‍රචන්ඩත්වය' යන වචන `ප්‍රශ්න නිරාකරණය කරගැනීමට අදාල පාර්ශවයන් මධ්‍යස්ථ නොවන දැඩි මතධාරී ක්‍රියාමාර්ග ගන්නා තත්ත්වයක්' සඳහන් කරයි. ජමාඅතුල් මුස්ලිමීන් දේශපාලන නැඹුරුතාවයෙන් තොර අධ්‍යාත්මික සංවිධානයකි. මෙම සංවිධානයේ ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් සියල්ල තමන් ජීවත් වන රටටත් මුළු ලොවටත් ශාන්තිය, සාමදානය, සමාන්මතාවය, යහධර්ම යනාදිය ඉහළම තලයෙන් දේශනා කරන ඒවා වෙයි. ජමාඅතුල් මුස්ලිමීන් බිහිවීම, වර්ධනය, ප්‍රචාරණය, ප්‍රකාශණ, සාමාජිකයින්ගේ ජීවන ක්‍රමය යනාදිය මධ්‍යස්ථව බලන විට ඒවා ලෞකික ආශාවන්ගෙන් තොර ජීවිතය, මරණයෙන් පසු සොහොන් ජීවිතය, පරමාන්ත ජීවිතය, ස්වර්ගය, නිරය යනාදිය කේන්ද්‍ර කරමින් පවතින බව ඕනෑම අයෙකු ප්‍රතික්ෂේප කළ නොහැක.

### ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති

- ☐ අල්ලාහ්ට කිසිම අයුරකින්වත් කිසිවක් ආදේශ නොකළ යුතුය.
- ☐ අල්කුර්ආනයත් නබිමගත් පමණක් ධර්මයේ මූලාශ්‍රයන් වේ. ඒවා පමණක් අනුගමනය කළ යුතුය.
- ☐ කිසිම ප්‍රාණයක් අයුක්ති සහගත ලෙස ඝාතනය නොකළ යුතුය.
- ☐ අප ජීවත් වන රටේ සාමයටත් සාමදානයටත් කිසිම ආකාරයක කැළැලක් හෝ කලබල හෝ ඇති නොකර සාමයට සහයෝගය දැක්විය යුතුය.
- ☐ නබිතුමාගේ චාරිත්‍ර මාර්ගයන් ප්‍රාණවත් කර එය අනුගමනය කර ජීවත්විය යුතුය.
- ☐ අල්කුර්ආන් හදීස්වලට පටහැණි නොවී හැකි පමණ අමීර්ට කීකරුව සිටිය යුතුය.
- ☐ මහා පාපයන් හා ප්‍රසිද්ධ පාපයන් වන මිනිස් ඝාතනය, අනාචාරය, මත්පැන් පානය, පොලිය, සූදුව, හූනියම්, අවමන් සහගත ක්‍රියාවන්, සොරකම, වංචාව යනාදියෙන් මුළුමණින්ම වැළැකී සිටිය යුතුය.
- ☐ නින්ද, අමතක වීම, සිහිය විසඳවීම වැනි කාරණා හැර අයෙකු පස් වේල නැමදීම අතහැරිය නොහැක. එලෙස අතහැරියහොත් ඔහු කාෆිර් බවට පත් වෙයි.
- ☐ සකාතය අනිවාර්ය වුවහොත් එය බයිතුල් මාල් අරමුදලට භාරදිය යුතුය.

☐ විශ්වාසී කාන්තාවක තම මහ්රම් වූ සහායක් නොමැතිව කිලෝ මීටර් 9 දුරක් ගමන් නොකළ යුතුය.

☐ අල්ලාහ්ගේ අණ පනත් වෙනස් කරන සියළු කරුණුවලින් මුළුමණින්ම වැලැකී සිටිය යුතුය.

☐ සංගීතය ඇසීම මුළුමණින්ම වලක්වා ගත යුතු ය.

☐ සත්‍යය වසං නොකර ප්‍රකාශ කළ යුතුය.

☐ නිශ්ඵල තර්ක, වාදවල යෙදීම වලක්වාගෙන ඉවසීමෙන් සිටිය යුතුය.

☐ මුස්ලිම්වරු මධ්‍යයේ සලාමය පැතිරවිය යුතුය.

☐ ජමාඅතුල් මුස්ලිමීන්ට අයත් පල්ලි සහ නමදින ස්ථානවල හැකි පමණ වන්දනා මානවල යෙදීමට උත්සාහ කරගත යුතුය.

☐ මත් කළ හැකි බීඩි, සිගරට්, කංසා වැනි සියළුම මත්ද්‍රව්‍ය වලින් මුළුමණින් ම වැලැකී සිටිය යුතුය.

☐ මුස්ලිම් පිරිමි සියළු දෙනා තම යටි රැවුල පරිපූර්ණ ව වවා උඩු රැවුල කැපිය යුතුය.
☐ කෙස් පැසුනහොත් එයට කළු පාට හැර වෙනත් සායම් දමාගත යුතුය.

☐ පිරිමින් තම ඇඳුම් වළළුකරට ඉහළින් ඇඳගත යුතුය.

☐ වැඩිවියට පත් කාන්තාවන් සියල්ලෝම තමාව අන්‍ය පිරිමින්ගෙන් මුළුමණින්ම වසා ගත යුතුය.

☐ හැකියාව ඇති අය අවස්ථාවන් පහසුකම් ලැබුනහොත් හජ්, උම්රා යුතුකම් ඉටුකරගත යුතුය.

☐ මුස්ලිම්වරු අතර ඇතිවන ආගම අදාල මතභේද විසඳීමට අල්කුර්ආන් හදීස් වෙත යොමුවිය යුතුය. මේ සඳහා මජ්ලිසුස් ෂූරා යන අමීර්ගේ නායකත්වය යටතේ උලමාවරු හා බුද්ධිමතුන්ගෙන් සැදුම්ලත් පර්යේෂණ කණ්ඩායමක් ක්‍රියාත්මක වෙයි.

## ජමාඅතුල් මුස්ලිමීන් ක්‍රියාකාරකම්

- නායකත්වය තෝරාගැනීම.
- ජමාඅතුල් මුස්ලිමීන් ශාඛා පිහිටුවීම හා පරිපාලනය කිරීම.
- ශාඛා අමීර්වරු, උලමාවරු යනාදීන් සඳහා හමු පැවැත්වීම.
- සහෝදරවරු මධ්‍යයේ ඇතිවන ප්‍රශ්න සුහද ව නිරාකරණය කිරීම.

- සකාත් නම් ආර්ථික සැලැසුම ක්‍රියාත්මක කිරීම.

- අවශ්‍යතා ඇති සහෝදරවරුන්, රෝගීන් වැනි අය හඳුනාගෙන ඔවුන්ගේ ආර්ථික වශ්‍යතා සම්පූර්ණ කිරීම.

- වීදි ප්‍රචාරය සිදුකිරීම.

- තරුණයින් සඳහා හමු පැවැත්වීම.

- රජයේ අනුමත මද්රසා සහ පාසල් පැවැත්වීම.

- මජ්ලිසුෂ් ෂූරා නම් උපදේශන මණ්ඩලය පවත්වා ගැනීම.

ඉහත දැක්වූ කරුණු ජමාඅතුල් මුස්ලිමීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් වේ. ඉහත ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් මධ්‍යස්ථව බලන අයෙකු එම ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් කිසිම මිනිසෙකුටවත් කිසිදු හානියක් සිදුනොකරන ඒවා බව දක්නට ලැබෙන බව විවෘත මනසකින් පිලිගනු ඇත. අනෙක් මිනිසාට වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කිසිම හානියක සිදුනොකරන ඒවා පිහිටා ඇති බව ඔහු කිසිවිටෙකත් ප්‍රතික්ෂේප නොකරයි. එමෙන්ම මෙම රට ගත් කළ, මෙරටේ ජීවත්වන අනෙක් ආගම්, ජාතින්, භාෂාවන් කථා කරන අයට ඉතා සුළු හානියක්වත් සිදුකරනා අන්දමට ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්ති දක්නට නොලැබෙන බව සියළු පාර්ශවයන් ප්‍රතික්ෂේප කිරීමකින් තොරව පිලිගත යුතුම ය.

ජමාඅතුල් මුස්ලිමීන් දේශපාලනික පක්ෂග්‍රාහි නොවන අධ්‍යාත්මය පමණක් ජනතාවට දේශනා කරන සංවිධානයකි. ප්‍රායෝගික දේශපාලනයේ කිසියම් පාර්ශවයකට සහය දක්වන මෙන් එහි නායකත්වය හෝ එහි උලමාවරු සෘජුව හෝ අනෙක් ධර්ම දේශනාවලදී වක්‍රව හෝ කිසිදු දේශපාලනික පක්ෂග්‍රාහි කතා සිදුනොකරන අතර දේශපාලනයේ දී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය පවා අල්කුර්ආන් හදීස් පදනම් කරමින් තීරණය කරගන්නා මෙන් තම සාමාජිකයින්ට ජමාඅතුල් මුස්ලිමීන් බලකරයි.

වත්මන් ජමාඅතුල් මුස්ලිමීන් තම සියළු කටයුතුවලට, එදා ජමාඅතුල් මුස්ලිමීන්හි මගපෙන්වන්නා වූ නබි (ﷺ) තුමා පූර්වාදර්ශය වශයෙන් ගනියි. මුහම්මද් නබි (ﷺ) තුමා ජීවත් ව සිටි කාලයේ සියළු ජන සමාජයන් සමග සුහදතාවය ආරක්ෂා කරමින් ජීවත් වූ බව විශ්වසනීය බොහෝ පුවත් දක්නට ලැබේ. නබිනායක (ﷺ) තුමා විසින් සහ එතුමාගේ අනුවරයින් විසින් නිර්මාණය කළ පල්ලියේ මුස්ලිම් නොවන අයෙකු මූත්‍රා කරමින් සිටි අවස්ථාවේ එය වැලැක්වීමට උත්සාහ කළ තම අනුවරයින් ව වැලැක්වූ නබිතුමා, ඔහු කැඳවා "මෙය දෙවිඳුන් නමදින ස්ථානයක්. මෙහි මෙවැනි ක්‍රියා නොකළ යුතුයි" යැයි අනුශාසනා කර පිටත් කළහ.

එමෙන්ම යුදෙව් ජාතික කාන්තාවක් නබිතුමාව සංග්‍රහයකට ආරාධනා කර එම සංග්‍රහයේ වස කළවම් කළාය. එය නොදැන අනුභව කළ නබිතුමා ආහාරවල වස කලවම් කර තිබෙන බව දැනගත්තත් එම යුදෙව් කාන්තාවට කිසිම දඬුවමක් දුන්නේ නැත. නබිනායක (ﷺ) තුමා අභාවප්‍රාප්ත වීමට දින කිහිපයකට පෙර තම සන්නාහය (යුධ ඇඳුම) යුදෙව් ජාතියෙකු වෙත උගස් කර බඩුබාහිරාදිය ගෙන තිබුණහ. එම උගස බේරා නොගෙන ම එතුමා මරණයට පත් වූ බව සාධක සහිත පුවත් දක්නට ලැබේ.

නබිනායක (ﷺ) තුමා එදා ජීවත් වූ යුදෙව්වන්, කතෝලිකයින්, ගින්න - පිළිම වන්දනා කරන්නන් වැනි සියළු සමාජයන් සමග දයාවෙන් සුහදව හැසිරී ජීවත් වූ බව දැකගත හැක. නබිනායක (ﷺ) තුමා එතුමාගේ ක්‍රියාකාරකම් මගපෙන්වීම් වැනි දේවල් පමණක්

පූර්වාදර්ශ ලෙස ගෙන මෙලොවෙහිත් එලොවෙහිත් දෙවිඳාණන්ගේ තෘප්තියට පත් වන අන්දමට තම ජීවිතය සකසා ගත යුතුයි යන පදනම ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානය තම සාමාජිකයින්ට අඛණ්ඩව බලකරමින් සිටී.

ඉස්ලාම් යනු ශාන්තිය, සාමදානය යන තේරුමදෙයි. ඉස්ලාම් යනු අල්ලාහ්තආලා විසින් මෙලොවට පහළ කරනු ලැබූ ධර්මයයි. ඉස්ලාමයේ දේශනා ලෝවාසීන් සඳහා වූ දයාවත් කරුණාවත් සමානාත්මතාවයත් දේශනා කරන ඒවා බව සියල්ලෝම පිලිගනිති. ඉස්ලාම් ධර්මයේ අවසාන නබි මුහම්මද් (ﷺ) තුමා විසින් ඉස්ලාමය පිලිගත් ජනතාව වෙනුවෙන් බිහිකළ සංවිධානයකි `මුස්ලිම්වරුන්ගේ සංධානය' යන තේරුම දෙන `ජමාඅතුල් මුස්ලිමීන්' බව පෙර සාධක මගින් පැහැදිලි කළෙමු.

නබිනායක (ﷺ) තුමා අවසාන ධර්ම දූතයාණන් ලෙස දෙවිඳාණන් විසින් තෝරාගනු ලැබීමෙන් පසු මෙලොව ජනතාව දෙස බලා ඉස්ලාමය පවසන ශාන්තිය, සාමදානය, සමාන්මතාවය ඇතුළු මුළු ජීවිතයටම අවශ්‍ය සියළුම මගපෙන්වීම් ජනතාවට දේශනා කළේ ය. නබිනායක (ﷺ) තුමාගේ දේශනාවලින් බෙහෙවින් ආකර්ශණය වූ මිනිසුන් එතුමා වෙත රොතු වශයෙන් පැමිණ, එතුමා පැවැසූ ඉස්ලාමික ප්‍රතිපත්ති එතුමා ඉදිරියේම පිලිගත්හ. මෙලෙස පිලිගත් මිනිස්සු වෙනුවෙන් නබිනායක (ﷺ) තුමා විසින් බිහිකරන ලද්දකි ජමාඅතුල් මුස්ලිමීන් වනුයේ.

මෙලෙස නබිනායක (ﷺ) තුමා විසින් බිහිකරන ලද එම ජමාඅතුල් මුස්ලිමීන් කලීෆා (පාලකයින්) දොළොස් දෙනා දක්වා ස්ථාවර ව පවතින බවත් ඉන්පසු එහි භේදයන් ඇතිවන බවත් නබිනායක (ﷺ) තුමා ජීවත් ව සිටියදී ම අනාවැකි පවසා තිබුණා. නබිනායක (ﷺ) තුමා තමා විසින් බිහිකළ ජමාඅතුල් මුස්ලිමීන්හි කලීෆාවරු දොළොස් දෙනා සමග එහි ස්ථාවරභාවය නැති වන බව අනාවැකි කළ අන්දමට දැඩි අවවාදයක් ද ජනතාවට කළා. එනම් ජමාඅතුල් මුස්ලිමීන්හි භේද ඇති වී කුඩා කණ්ඩායම් සහ කල්ලි වශයෙන් ජනතාව ජීවත් වන වකවානුවක යමෙකු ඉස්ලාමය පිලිපැද ජීවත්විය යුතු නම් ඔහු නබිතුමා විසින් එදා බිහිකළාක් වැනි සංවිධාන ලක්ෂණ සහිත මුස්ලිම්වරුන්ගේ සංවිධානයක් දක්නට ලැබේ නම් පමණක් එවැනි අය වෙත පැමිණ ඔවුන් සමග එකතු වී ඉස්ලාමය පිලිපදිමින් ජීවත්වන මෙන් ද එවැනි ලක්ෂණ සහිත සංවිධානයක් නොමැති අවස්ථාවක කිසිම පාර්ශවයක හෝ සංවිධානයකට එකතු නොවී හුදෙකලාවේ ජීවත් වී මරණයට පත් වන මෙන් ද එම අවවාදයේ ඉදිරිපත් කර තිබූහ.

නබිතුමාගේ තවත් දැනුම්දීමක් අනුව, අල්ලාහ්තආලාව වන්දනයට සුදුසු දෙවිඳාණන් ලෙසත් නබිනායක (ﷺ) තුමාව එම දෙවිඳාණන්ගේ අවසන් දූතයාණන් ලෙසත් පිලිගත් සමාජය කොටස් 73 කට බෙදෙන බවත් ඉන් එක කොටසක් පමණක් ස්වර්ගයට ඇතුළ් වන බවත් අනෙක් කොටස් 72 නිරයට යන තවත් තවත් අවස්ථාවක අවවාද කර තිබූහ. එලෙස ස්වර්ගයට යන එම එක කණ්ඩායම ගැන නබිනායක (ﷺ) තුමාගේ විමසූ විට, "මමත් මගේ අනුවරයිනුත් කුමන ප්‍රතිපත්තිය මත ජීවත් වෙන්නෙම් ද එලෙස ජීවත් වන්නෝ" යැයි පැවැසූහ.

එමනිසා අද අයෙකු මුස්ලිම්වරයෙකු ලෙස ජීවත් වී ස්වර්ගයට ඇතුළ් වීමට කැමැති නම් ඔහු අල්ලාහ්ව පමණක් තමා වන්දනය නැමදීම කළ යුතු දෙවිඳාණන් ලෙසත් නබි මුහම්මද් (ﷺ) තුමා දෙවිඳාණන්ගේ අවසාන ධර්ම දූතයාණන් බවත් පිලිගන්නා අතර නබිනායක (ﷺ) තුමා සහ එතුමාගේ අනුවරයින් කුමනාකාරයේ සංවිධානයේ - ප්‍රතිපත්තියේ ජීවත්වූවෝද එලෙස ජීවත්වීම මගින් පමණි නිත්‍ය සතුට පිරුණු ස්වර්ගය ලබාගත හැක්කේ. නබිනායක (ﷺ) තුමාත් එතුමාගේ උතුම් වූ අනුවරයිනුත් කුමන ප්‍රතිපත්තියේ එදා ජීවත්වුනෝ ද එම ප්‍රතිපත්තියේ ම අදත් ජීවත් වී, මරණයෙන් පසු ජීවිතයේ ස්වර්ගය ලබාගත යුතුයි යන

උසස් අරමුණ සඳහා ආගමික වියතුන් හා පොදු මිනිස්සුන්ගෙන් කිහිප දෙනෙකු විසින් 1988 අවසාන භාගයේ පුත්තලම ඒතාලේ ගම්මානයේ නැවතත් පණ ගන්වන ලද්දකි වත්මන් ජමාඅතුල් මුස්ලිමීන්.

වත්මන් ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්තීන් සියල්ල නබිනායක (ﷺ) තුමාගේ ජමාඅතුල් මුස්ලිමීන් ප්‍රතිපත්තිය මුළුමණින් ම පිළිපදින අන්දමින් පවතී. නබිනායක (ﷺ) තුමා මුළු ලොවටම දයාව, සාමදානය, සමානාත්මතාවය යනාදිය දේශනා කළ අන්දමට ජමාඅතුල් මුස්ලිමීන්ද මෙලොවට දයාව, සාමදානය, සමානාත්මතාවය යනාදිය පමණක් දේශනා කරයි.

ජමාඅතුල් මුස්ලිමීන්හි වැඩසටහන් ව්‍යාපෘති වලට අවශ්‍ය මුදල් හා ජමාඅතුල් මුස්ලිමීන් සාමාජිකයින්ගේ විවිධ මුදල් අවශ්‍යතා වැනි ආර්ථික මූල්‍ය අවශ්‍යතාවලදී පවා දේශීය විදේශීය රජයන් සහ අනෙක් සංවිධානවල උදව් සුළු ප්‍රමාණයක් හෝ අපේක්ෂා නොකරයි. අප අතුරින් අප විසින්ම ඒවා සම්පූර්ණ කරගැනීමට අවධානය යොමුකරමින් සිටින්නෙමු. එමෙන්ම අද මෙරටේ හෝ විදේශයේ හෝ මූලධර්මවාදී කණ්ඩායම් ලෙස රජයෙන් හෝ ජාත්‍යන්තරයෙන් හඳුනාගන්නා ලද කිසිම සන්නද්ධ කණ්ඩායම් ද වක්‍රව හෝ ප්‍රසිද්ධියේ එදා සිට අද දක්වා අප සහයෝගය නොදක්වන අතර එම සංවිධාන ද ඉස්ලාමික හෝ මුස්ලිම් සංවිධාන වශයෙන් අප කිසිවිටෙක පිළිගන්නේ ද නැත. 1988 සිට අද දිනය දක්වා ජමාඅතුල් මුස්ලිමීන් ඉතිහාසය දෙස බලද්දී රජයටත් ආණ්ඩුවටත් විරුද්ධ කිසිම උද්ඝෝෂණයක හෝ විරෝධතාවයක හෝ රජය පෙරළීමේ කැරැල්ලක ජමාඅතුල් මුස්ලිමීන් සුළු කොටසක් වශයෙන්වත් සහභාගි නොවූ බව මෙරටේ සියළුම පාලකයින්, රාජ්‍ය නිලධාරින්, පර්යේෂකයින් ඇතුළු සියළු ජාතින්වල ජනතාවගේ අවධානයට ලක්කිරීමට කැමැත්තෙමු.

ලංකා ඉතිහාසයේ මෑත කාලයේ සිදුවූ ඉතා ඛේදනීය සිදුවීම ලෙස සැලකෙන අප්‍රේල් 21 ප්‍රහාරය දැඩිව හෙළාදකින අප, එම ප්‍රහාරය සිදුකළා යැයි සැලකෙන පුද්ගලයින් පවා පූර්ණ ආගමික දැනුමක් නැති - පැහැදිලි චින්තනයක් නැති පුද්ගලයින් ලෙස සලකන්නෙමු. තම සමාජයේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථාවක දී, ඊට විරුද්ධව ආත්මාරක්ෂක ක්‍රියාකාරකම්වල යෙදිය යුතු බලකිරීමක් ඇතිවන අවස්ථාවක පවා තනි පුද්ගලයින් හෝ කුඩා කණ්ඩායම් එම ක්‍රියාවල කිසිවිටෙක යෙදිය නොහැකි අතර `ව්‍යස්ථාපිත රජයක්' මගින් එවැනි ආත්මාරක්ෂක උත්සාහයන් සිදුකළ යුතුයි යැයි ජමාඅතුල් මුස්ලිමීන් එදා සිට බලකරමින් සිටී.

ඒ සියල්ලට වඩා නබිනායක (ﷺ) තුමා එතුමා දේශනා කළ ප්‍රතිපත්ති සහ සිද්ධාන්ත මිනිස් සමාජයේ එකතුමුකම, සමානාත්මතාවය, සහෝදරත්වය යනාදිය ගොඩනැංවිය හැකි අන්දමට තිබෙන බව මුස්ලිම් නොවන ආගමික උගතුන් හා මධ්‍යස්ථ මතධාරින් පිළිගන්නා තත්ත්වයක එම ප්‍රතිපත්තිය තම ප්‍රතිපත්තිය ලෙස ගෙන 1988 සිට රාජ්‍ය විරෝධි ගමන ස්වල්පයක්වත් නොමැති ව ක්‍රියාත්මක වන ජමාඅතුල් මුස්ලිමීන් සංවිධානයට, මෑත කාලයේ සිට සමහර ලේඛකයින් `දැඩි මතධාරි' චින්තනය සහිත සංවිධානයක් ලෙස රජයටත් මෙරට ජනතාවටත් පෙන්වීමට උත්සාහ කිරීමත් එමගින් රජයෙන් හඳුනාගන්නා ලද අනෙක් දැඩි මතධාරි සංවිධාන තුලට ඇතුළ් කිරීමට උත්සාහ කිරීමත් ඇත්තෙන්ම වේදනාකාරී පක්ෂපාතිත්වයෙන් තොරව හෙළාදැකිය යුතු කාරණා වේ.

එමෙන්ම අදාල පර්යේෂණ සිදුකරන ලේඛකයින් සහ පර්යේෂකයින්ගේ අසම්පූර්ණ පර්යේෂණයේ ප්‍රකාශන ලෙස හෝ ඒකාපර්ශවීය පර්යේෂණ ලෙස ජමාඅතුල් මුස්ලිමීන් එවැනි පර්යේෂණ සලකයි. ජමාඅතුල් මුස්ලිමීන් ඉතිහාසය, ප්‍රතිපත්ති,

ක්‍රියාකාරකම්, අරමුණු, ඉලක්ක සහ සාමාජිකයින්ගේ ජීවන ක්‍රමය යනාදිය ගැන පූර්ණ පැහැදිලිභාවයෙන් තොරවීම මෙම පර්යේෂණවල ඒකපාර්ශවීය නිගමනවලට මූලික හේතුව බව අප සිතන්නෙමු.

එනිසා ඉහත දැක්වූ කරුණු එකට ගෙන බැලීමේ දී, 1988 වර්ෂයේ පුත්තලම ඒතාලේ ගම්මානයේ ආරම්භ කරන ලද මෙම සංවිධානය අද දිනය දක්වා කිසිදු දැඩි මතධාරී බවක් නොපෙන්වූ පසුබිමෙක ජමාඅතුල් මුස්ලිමීන් යනු දැඩි මතධාරී සංවිධානයක් ලෙස හුවා දැක්වීමට උත්සාහ කරන සමහර ලේඛකයින් හා පර්යේෂකයින් පක්ෂග්‍රාහී නොවී මධ්‍යස්ථව තම පර්යේෂණයන් සිදුකරන මෙන් ද, ජමාඅතුල් මුස්ලිමීන්හි යථා තත්ත්වය ජනතාව ඉදිරියේ පෙන්වීමට උත්සාහ කරන මෙන් ද, ජමාඅතුල් මුස්ලිමීන් ඉතිහාසය, එහි ප්‍රතිපත්ති සහ, ක්‍රියාකාරකම් අදාල ඕනෑම සැකයක් ප්‍රශ්න කිරීමක් හෝ පැහැදිලි කිරීම් සඳහා ජමාඅතුල් මුස්ලිමීන් නායකත්වය හෝ ශාඛා අමීර්වරුන්ගෙන් හෝ එහි උලමාවරු සමග සම්බන්ධීකරණ වී ලබාගන්නා මෙන් ද බැගෑපත් ව ඉල්ලා සිටිමු.

# පරිශිෂ්ඨ ඇමුණුම්

## මෙම පොතෙහි භාවිතා කර තිබෙන අරාබි වදන් වල කෙටි විවරණය

### මුස්ලිම්

මුස්ලිම් යනු `අවනතවූ තැනැත්තා' යන අර්ථය දෙයි. අල්ලාහ්ගේ වදන්වලට මුළුමණින්ම අවනත වී, ඔහුගේ නීති නියෝග මුළුමණින්ම පිලිපැද මෙලොවෙහි ජීවත් වී පෙන්වූ මුහම්මද් නබි (ﷺ) තුමාව මුළුමණින්ම අනුගමනය කර ජීවත්වන්නෝ `මුස්ලිම්' වෙති. මුස්ලිම් යන නම කුර්ආනයේ අල්ලාහ්තආලා විසින් ම ඔහුගේ නීති නියෝග මුළුමණින්ම පිලිපැද මුහම්මද් නබි (ﷺ) තුමාව මුණමණින්ම අනුගමනය කර ජීවත්වන්නන් ව හඳුන්වයි. එමනිසා අල්ලාහ්ට අවනත වී, නබිතුමා අනුගමනය කර ජීවත්වන්නන්ව `මුස්ලිම්' යැයි පමණක් හැඳින්විය යුතුය. වෙනත් සංවිධාන නම්වලින් ඇමතීම වැරැදි ය. වත්මන් ලෝකයේ එකම එක කණ්ඩායමක් පමණක් මුස්ලිම් ලෙස ජීවත්විය හැකි බව ඉස්ලාමය පවසයි. අනෙක් තැනැත්තෝ පෙනුමෙන් මුස්ලිම් ලෙස ජීවත්වූවත් ඇත්තෙන්ම ඔවුන් මුස්ලිම් නොවන්නෝ ය.

### වහි

වහි යනු `ප්‍රවෘත්තිය' යන තේරුම දෙයි. ඉස්ලාමික දැක්මෙන් වහි යනු අල්ලාහ්තආලාගෙන් නබිවරුන්ට පහළ කරන ලද පණිවිඩ වේ. මෙම පණිවිඩ නබිවරුන්ට ලබාදීම සඳහා `මලක්' යැයි හඳුන්වන දූතයින් අල්ලාහ් පොළොවට එවන්නේ ය. එලෙස අල්ලාහ් විසින් පොළොවට පහළ කළ පණිවිඩ ලෙස අල්කුර්ආනයත් නබිතුමාගේ සාධකපූර්ණ ජීවන ක්‍රමයත් දක්නට ලැබේ. වහි පමණක් යමෙකු අනුගමනය කර ජීවත් වීමෙන් ඔහු මුස්ලිම් වේ. වහි සමග වහි නොවන දෑ - මිනිස් මත - අනුගමනය කරන අයෙකු තමාව මුස්ලිම් යැයි පවසා ගත්තත් ඔහු ඉස්ලාමයේ දැක්මෙන් මුස්ලිම් නොවන්නෙකු යන්න වහියේ තීරණයයි.

### අල්කුර්ආන්

අල්ලාහ්තආලා වෙතින් මානව සමාජයට කාලයෙන් කාලයට දිව්‍ය පණිවිඩ පහළ කරමින් පැවැතුණි. එලෙස පහළ කරන ලද පණිවිඩ තෝරාගත් ජන සමූහයන්ටත් එම කාල වකවානුවටත් සීමා වූ ඒවා ලෙසින් දක්නට තිබුණි. එලෙස පහළ කරන ලද පණිවිඩ අතුරින් අවසානය ලෙසත් මුළු ලෝවාසී සියළු දෙනා වෙනුවෙනුත් ලෝකය විනාශ වන දිනය දක්වා මිනිසුන් අනුගමනය කළ හැකි අයුරිනුත් අල්ලාහ්තආලගෙන් අවුරුදු 23 කාලයක් පුරා පහළ කරන ලද ධර්මය අල්කුර්ආන් වෙයි. මුහම්මද් නබිතුමාට පහළ කරන ලද මෙම කුර්ආනය එතුමාගේ කාලයේ දී ම පූර්ණ ව ආරක්ෂා කරන ලදී.

### හදීස්

හදීස් යනු `ක්‍රම මාර්ගය' තේරුම දෙයි. ඉස්ලාමික දැක්මෙන් නබි මුහම්මද් (ﷺ) තුමාගේ සාධක සහිත වදන්, ක්‍රියා, අනෙක් අයෙකුගේ ක්‍රියාවලට එතුමා දුන් අනුමැතිය යනාදිය හදීස් වෙයි. හදීන් යන පදයට සමාන පදයක් ලෙස `සුන්නා' යන පදයත් භාවිතා වෙයි. හදීස් පර්යේෂණය කර සාධක සහිත වාර්තා පමණක් ජමාඅතුල් මුස්ලිමීන් පිලිගනියි.

මහ්රම්

මහ්රම් යනු `තහනම් කරනු ලැබූ තැනැත්තා' යන තේරුම දෙයි. ඉස්ලාමික දැක්මෙන් කාන්තාවක් එම කාන්තාව විවාහ කරගැනීමට තහනම් කරනු ලැබූවන් මෙම වචනයෙන් හඳුන්වයි. නිදසුන් ලෙස පියා, එක කුස උපන් සහෝදරයා, පුතා, එක කුස උපන් සහෝදර සහෝදරියන්ගේ පුතුන් වැනි අය දැක්විය හැක.

සලාම්

සලාම් යනු `ශාන්තිය' යන තේරුම දෙයි. `අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු' යනු සලාම් කීමෙහි සම්පූර්ණ හැඩයයි. මුස්ලිම්වරු එකිනෙකා හමුවෙද්දී සලාම් කියාගන්නා අතර, අතට අත දී තම සහෝදරත්වය බෙදා ගත යුතුය. මෙය ඉස්ලාමය පෙන්වා දෙන ක්‍රමයකි.

හජ්

හජ් යනු ඉස්ලාමීය යුතුකම් අතුරෙන් පස්වැනි හා අවසාන යුතුකම වේ. ශරීර ශක්තිය තිබෙන, ආර්ථික පහසුකම් ඇති මුස්ලිම්වරු සවුදි අරාබියාවට ගොස් එහි තිබෙන මක්කා, මදීනා ආදි නගර දෙකෙහි වැඳුම් පිදුම්වල යෙදීම මෙය හඳුන්වයි. ඉස්ලාමිය ඉතිහාසයේ ඉබ්‍රාහීම් නබි (ﷺ) තුමාගේ බිරිඳ සහ ඔහුගේ පුතා ආදීන්ගේ කැපවීම සිහිපත් කරනා අන්දමින් මෙම හජ් වන්දනය මුස්ලිම්වරු විසින් සිදුකරනු ලැබේ.

උම්රා

ක්‍රියාකාරකම් අතුරින් හජ් යුතුකම වැනි එක් යුතුකමකි. එහෙත් එය හජ් වැනි අනිවාර්ය යුතුකමක් නොවේ. හජ් යුතුකම ඉටුකළ හැකි අය උම්රාවත් එකතු කර සිදුකරති. සමහරු උම්රාවට යැයි වෙනම මක්කාවට ගොස් එම යුතුකම ඉටුකරති.

මව්ලවි

මව්ලවි යනු ධර්මය උගත් මුස්ලිම් වියතුන්ව හඳුන්වන වදනකි. මොවුහු අරාබි භාෂාවේ නිපුණතාවය ඇති අය ලෙස දක්නට ලැබෙන අතර ආගමික නීතිමය දැනුම ඇත්තන් ලෙස ද දක්නට ලැබෙති. මොවුහු ආලිම්, උස්තාද් යන වචනවලින් ද අමතනු ලැබෙති.

කලීෆා

කලීෆා යනු `නියෝජිතයා' ය. ඉස්ලාමික දැක්මෙන් කලීෆා යනු `ජනතාවගේ නායකයින්' ය. අනෙක් රටවල ජනාධිපති හෝ අග්‍රාමාත්‍ය වැනි වචන වලට සමාන වචනයක් ලෙස කලීෆා යන වචනය දක්නට ලැබේ. ජනතාවගේ නායකයා වන කලීෆාව අමීර්, ඉමාම් වැනි වචනවලින්ද අමතනු ලැබේ.

අල්ලාහ්

ලෝකයන් සියල්ල මවා පරිපෝෂණය කරන ආදේශ, සහායක, උපමා, සමානතා නොහැකි ඒකීය දෙවිදාණන්ට අරාබි භාෂාවෙන් කියන නම අල්ලාහ් වේ. අනෙක් ආගම්වල දෙවියා, භගවාන්, දේවන් වැනි වචන භාවිතා කළත් එවැනි වචනවලට ව්‍යාකරණයට අනුව බහු වචන හා ලිංග භේද ඇති කළ හැක. එහෙත් අල්ලාහ් නම් වචනයට

ව්‍යාකරණානුකූලව බහු වචන හෝ ලිංග භේදයක් ඇති කළ නොහැක. අල්ලාහ් යනු මුස්ලිම්වරුන්ට පමණක් අයත් දෙවිදෙකු නොවේ. මුළු ලෝවාසීන් සියල්ලෝම වන්දනා මාන කළ යුතු ඒක දෙවිඳාණන්ට මුස්ලිම්වරු කිව හැකි නම අල්ලාහ් යන්නයි. අල්ලාහ්තආලා ඒකීයවත් කිසිම අවශ්‍යතාවන් රහිත වූත් මව පියා බිරිඳ දරුවන් වැනි ඥාතීන් නොමැති වූවෙකු ලෙසත් ඉස්ලාමය හඳුන්වා දෙයි.

නබි

නබි යන්න `දැනුම්දෙන්නා' යන තේරුම දෙයි. අල්ලාහ්තආලාගේ දිව්‍ය පණිවිඩ ජනතාවට දැනුම්දීම සඳහා ඔහු විසින් තෝරාගන්නා ලද සද් මිනිසුන් `නබි' යන වදනෙන් අල්කුර්ආනය හඳුන්වයි. ලෝකයේ සෑම සමාජයකටම සියළුම ප්‍රදේශවලට නබිවරු යැවූ බව ඉස්ලාමය පවසයි.

රසූල්

රසූල් යනු `දූතයා' අරුත දෙයි. නබිවරු අතුරින් කිහිප දෙනෙකු රසූල්වරු ලෙසත් දක්නට ලැබුණු බව කුර්ආනය පවසයි. අල්ලාහ්තආලා විසින් එවනු ලැබූ නබිවරු අතුරින් අවසාන රසූල්වරයා වූ මුහම්මද් නබි (ﷺ) තුමා දක්නට ලැබෙති. නබිත්වය යන වගකීම පොදුවූවක් ලෙසින් ද රසූල්වරු සඳහා වූ දූතධූරය විශේෂිතවූවක් ලෙසින්ද දක්නට ලැබේ.

මුහම්මද්

මුහම්මද් යනු ඉස්ලාමය මෙලොවට දේශනා නබිවරු අතුරින් අවසානයා වේ. මෙතුමා වත්මන් සවුදි අරාබියාවේ මක්කා නම් නගරයේ උපන්නේ ය. මදීනා නම් නගරයේ භූමදානය කරනු ලැබ ඇති බව විශ්වසනීය පුවත් දක්නට ලැබේ. අල්ලාහ්තආලාගේ දූත මෙහෙවර ලෝකයට දේශනා කළ නබිවරුන්ගෙන් අවසානයා වූ මුහම්මද් නබි (ﷺ) තුමාව යමෙකු පිළිනොගනියි නම් ඔහු මුස්ලිම් විය නොහැක යැයි ඉස්ලාමය පවසයි.

ඉස්ලාම්

ඉස්ලාම් යන වචනයෙහි තේරුම ශාන්තිය, සාමදානය වෙයි. අල්ලාහ්තආලා විසින් ඔහුගෙන් භූමියේ ජීවත් වන මිනිසුන්ට පහළ කළ ධර්මය ඉස්ලාම් වෙයි. ඉස්ලාමයේ සියළු නීති රීති අල්ලාහ්තආලා බිහිකරනු ලැබූ ඒවා වෙයි. මුහම්මද් නබි (ﷺ) තුමා එවැනි නීතී ප්‍රකාරව ජීවතාදර්ශයෙන් පෙන්වූ තැනැත්තා වෙයි. ඉස්ලාමය පිළිගෙන අනුගමනය කරන්නෝ මුස්ලිම්වරු යැයි අල්කුර්ආනයේ අල්ලාහ්තආලා පවසයි.

ජාහිල්

ජාහිල් යන වචනය `නොදන්නවුන්' (අඥාණ) වැනි තේරුම් දෙයි. මුස්ලිම් යන වචනයට ප්‍රතිවිරුද්ධ වචනය මෙය වෙයි. ඉස්ලාමික නීති රීති මුළුමණින් ම නොදැන එම නීති රීතිවලට පටහැණි ව වැඩකරන්නෝ ධර්මය මුළුමණින් ම නොදන්නවුන් යන තේරුමෙන් ජාහිල් යන වචනයෙන් මුස්ලිම්වරු හඳුන්වති.

ජමාඅත්

මෙහි තේරුම `කණ්ඩායම හෝ සංධානය' වෙයි. අවම වශයෙන් මුස්ලිම්වරු තුන් දෙනෙකු එක ස්ථානයක ජීවත්වෙනවා නම් ඔවුන්ගෙන් අල්ලාහ්ගේ වහිය හොඳින් දැන

උගත් තැනැත්තෙකු මග පෙන්වන්නෙකු ලෙස ගෙන සාමුහිකයක් ලෙස ජීවත්වන මෙන් ද නැමදීම වැනි වතාවත් සාමුහික ව සිදුකරන මෙන් ද ඉස්ලාමය නියෝග කරයි.

කාෆිර්

මෙම වචනයෙන් `ප්‍රතික්ෂේප කරන්නා' හැදින්වේ. මුස්ලිම්වරයෙකු නින්ද, අමතක වීම, සිහිය විසඥවීම වැනි කාරණා හැර පස්වේල නැමදීම ඉටුනොකර අතහරින්නේ නම්, ඔහු `අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන්නා' යන තත්වයට පත් වෙයි. එමෙන්ම යමෙකු ඉස්ලාමයේ කිසියම් යුතුකමක් උවමනාවෙන් ම ප්‍රතික්ෂේප කරයි නම් ඔහුත් කාෆිර් වෙයි. තවද ඉස්ලාමයේ දේශනා ඉදිරිපත් කරද්දී මුස්ලිම් නොවන අයෙකු එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ඔහුගේ අයිතිවාසිකමකි. එහෙත් ඉස්ලාමය දැඩව එරෙහි වී, ඉස්ලාම් ධර්මය විනාශ කිරීමට උත්සාහ කරන්නන් ද කාෆිර් යන වචනය හදුන්වා සිටී.

අමීර් / ඉමාම්

මෙම වචන `වගකියන්නා හෝ මගපෙන්වන්නා' යන තේරුම් දෙයි. මුස්ලිම්වරු තමන්ට යැයි අල්ලාහ්ගේ ධර්මයට අනුව තමාව මගපෙන්වන නායකයෙකු පත්කර, ඔහුට තමන්ට හැකි පමණ කීකරු ව ජීවත්විය යුතුයි. මෙලෙස මුස්ලිම්වරුන්ගේ සංධානයට නායකත්වය දරන්නා මුස්ලිම්වරු අමීර්, ඉමාම්, කලීෆා වැනි වචනවලින් හදුන්වති. එමෙන්ම ඉස්ලාමයේ දෙවැනි යුතුකම වූ නැමදීම සාමුහික ව ඉටුකරන වේලාවේ එයට නායකත්වය දරන්නාත් මුහම්මද් නබි (ﷺ) තුමාගේ ජීවිත ක්‍රමය සම්පාදනය කළ උගතුන්ව ද මුස්ලිම්වරු `ඉමාම්' යන වචනයෙන් හදුන්වති.

සල්ලල්ලාහු අලෙහිවසල්ලම් (ﷺ)

මෙය මුහම්මද් නබිනායක (ﷺ) තුමාගේ නම හදුන්වන විට එම නම ඇසෙන තැනැත්තා පවසන වචනයකි. `අල්ලාහ්ගේ දයාව හා අභිවෘද්ධිය එතුමා මත ලැබේවා' යනු මෙහි අර්ථයයි. සත්‍ය ධර්මය වූ ඉස්ලාමය මෙලොවෙහි අවසාන වශයෙන් ඉදිරිපත් කර තමා ඉදිරිපත් කළ එම සත්‍යය වෙනුවෙන් තම ජීවිතය පවා පරදුවට තබා ජීවත් වී පෙන්වූ තම ජීවිතයට වඩා උතුම් වූ එම උත්තම දූතයාණන්ගේ නම කියන අවස්ථාවල මුස්ලිම්වරු අල්ලාහ් වෙතින් එතුමා වෙනුවෙන් සිදුකරන ප්‍රාර්ථනාව මෙයයි. සමහරු මෙම වචනය ලියද්දී (සල්) (ﷺ) යැයි කෙටියෙන් ද කතා කරන අවස්ථාවල සල්ලල්ලාහු අලෙහිවසල්ලම් යැයි සම්පූර්ණව ද භාවිතා කරගනිති.

අලෙයිහිස් සලාම් (عليه السلام)

මෙම විශේෂණය කව්රු වෙනුවෙන් භාවිතා කෙරෙන්නේ ද `ඔහුට අල්ලාහ්ගෙන් උසස්වීම ලැබේවා' යන අර්ථයෙන් භාවිතා වේ. නබිනායක (ﷺ) හැර අනෙක් සියළුම නබිවරුන්ටත් ඔවුන්ගේ නම සඳහන් වන අවස්ථාවලදීත් එම නමත් සමග එකතු කර මෙම විශේෂණය මුස්ලිම්වරු භාවිතා කරති. ලිවීමේ දී කෙටියෙන් (අලෛ) (عليه السلام) යැයි ලියති.

රලියල්ලාහු අන්හු (رضي الله عنه)

මෙම විශේෂණය නබි මුහම්මද් (ﷺ) තුමාගේ අනුවරයින් හැඳින්වීමට භාවිතා කළ විශේෂණ පදයකි. `අල්ලාහ් ඔවුන්ව පිලිගනිත්වා' මෙහි තේරුමයි. නබිතුමාගේ අනුවරියන් `රලියල්ලාහු අන්හා' යැයි ස්ත්‍රී ලිංග වචනය භාවිතා කෙරේ. නබිතුමාගේ

අනුවරයින්ග් හෝ අනුවරියනගේ නම් කියැවෙන විට මෙම විශේෂණය එකතු කර භාවිතා කළ යුතුය. සමහරු මෙම වචනය ලියද්දී (රලි) (ﷺ) යැයි කෙටියෙන් ද කතා කිරීමේ දී රලියල්ලාහු අන්හු හෝ අන්හා යැයි මුණමණින් ද භාවිතා කරති.

සකාත්

සකාත් යනු අවුරුදු 1440 පෙර සිට ම ඉස්ලාමය හඳුන්වා දුන් සජීවී ආර්ථික සැලැසුමකි. මුස්ලිම්වරු අතර ජීවත් වන ධනවතුන්ගෙන් වාර්ෂිකව අය කරගන්නා මුදල් හා තෝරාගත් වස්තු අල්කුර්ආනය හඳුන්වන කණ්ඩායම් අටකට බෙදා දීම මෙය හඳුන්වයි.

මජ්ලිසුෂ් ෂූරා

මජ්ලිසුෂ් ෂූරා යනු `උපෙදේශන සභාව' හෝ `සමාලෝචන මණ්ඩලය' ලෙස අරුත දැක්විය හැක. අල්කුර්ආන් හදීස් යනාදියෙහි මුස්ලිම්වරුන්ට ඇතිවන සැකයන් අමීර්, ආගමික වියතුන්, ක්ෂේත්‍ර නිපුණයින් වැනි අය මගින් හොඳින් පර්යේෂණ කර තීන්දු තීරණ ගැනීමට බිහිකරන ලද සභාවකි.

මුබාහලා

මුබහලා යන්න `ශාපය ඉල්ලීම' හෝ `විනාශ දිවුරුම' යැයි තේරුම් කළ හැක. මුස්ලිම්වරුන්ටත් අල්ලාහ්ව දෙවිදාණන් ලෙස පිළිගත් මුස්ලිම් නොවන්නන් අතරත් විවාදයක් සිදුවන අවස්ථාවකදී මුස්ලිම්වරු ඉදිරිපත් කරන සාධක මුස්ලිම් නොවන්නන් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක හෝ විසංවාදයේ යෙදෙන අවස්ථාවක ඔවුන්ට අල්ලාහ්ගේ ශාපය ඉල්ලා විනාශ දිවුරුම කරන මෙන් ඉල්ලති. අල්ලාහ්ව දෙවිදාණන් ලෙස පිළිගන්නා අදාල මුස්ලිම් නොවන පාර්ශවය තම සාධක වල ස්තීරව සිටින්නේ නම් ශාපය ඉල්ලා විනාශ දිවුරුම නොබිය ව සිදුකරති. එලෙසම මුස්ලිම්වරුත් තම ප්‍රතිපත්තිය සඳහා වූ සාධක සත්‍ය බවත්, ඒවා බොරු වේ නම් අල්ලාහ්ගේ ශාපය අප මත ඇති වේවා යැයි ඔවුන් ද ශාපය ඉල්ලා විනාශ දිවුරුම කරති. මුබාහලා යනු මෙයයි.

ජුම්ආ නැමදීම

සිකුරාදා දිනවල දිවා කාලයේ මුස්ලිම්වරු විශේෂ ආගමික දේශනයක් සමග වූ නැමදීමක් කරති. මෙලෙස සිකුරාදා දිනවල විශේෂයෙන් නමදින සාමූහික නැමදීමට `ජුම්ආ නැමදුම' යැයි හැඳින්වේ. ගම්මානයක සිටින සියළුම මුස්ලිම්වරු බොහෝ විට මෙයට සහභාගි වෙති.

සකාතුල් ෆිත්රා

සකාතුල් ෆිත්රා යනු මුස්ලිම්වරුන්ගේ හතරවැනි යුතුකම වූ රමලාන් මාසයේ උපවාස කාලයේ දී එම උපවාසයේ මිනිස්සු ලෙසින් ඇතිවන (බොරුව, අනවශ්‍ය ක්‍රියා වැනි) සුළු වැරැදිවලට ප්‍රතිකර්මයක් ලෙස මුස්ලිම්වරුන්ගේ පවුලේ සිටින එක් එක් සාමාජිකයාට කිලෝ 2 ½ බැගින් බයිතුල් මාල් එකට දෙනු ලබන සහල් වැනි දෛනික ප්‍රධාන ආහාරය මෙය හඳුන්වයි. මෙලෙස එකතු කරන ධාන්‍ය, ආහාර ද්‍රව්‍ය දුප්පතුන්ට බෙදා දෙනු ලැබේ. මෙය `සකාතුල් ෆිත්රා' යැයි හැඳින්වේ.

## බයිතුල් මාල්

බයිතුල් මාල් යනු `මුස්ලිම්වරුන්ගේ ආර්ථික කටයුතු වගබලා ගැනීම සඳහා බිහිකරන ලද මූල්‍ය සංවිධාන ව්‍යුහයයි'. මුස්ලිම්වරුන්ගෙන් අයකරගන්නා සකාත්, සකාතුල් ෆිත්රා, තිළිණ හා ප්‍රදාන සහ, අනෙකුත් පරිත්‍යාග යනාදිය එකතු කර අදාලවූවන්ට බෙදා දීමත් අවශ්‍යවූවන් හඳුනාගෙන ඔවුන්ට ලබාදීමත් වැනි කරුණු මෙම මූල්‍ය ආයතනය සිදුකරයි.

## සහීහ් මුස්ලිම්, සහීහ් බුහාරි

මුහම්මද් නබි (ﷺ) තුමාගේ සාධකපූර්ණ චාරිත්‍රය සම්පාදනය කර වාර්තාගත කර තිබෙන හදීස් ග්‍රන්ථ දෙකක් වේ. මේවාහි නබිතුමාගේ මරණයෙන් පසුව නබිතුමාගේ අනුවරයින්ගේ ක්‍රියාවන් ද අදාල හදීස් ග්‍රන්ථකරුවන් විසින් වාර්තා කර ඇත. මේවා හදීස් නොවේ. මුස්ලිම්වරයෙකු නබිතුමාගෙන් පැමිණෙන පුවත් පමණක් අනුගමනය කළ යුතුය. මෙම හදීස් ග්‍රන්ථ දෙකෙහි නබිතුමාගෙන් පැමිණෙන සියළුම පුවත් විශ්වසනීය යැයි ජමාඅතුල් මුස්ලිමීන් පිලිගනියි.

## අබූදාවූද්, තිර්මිදි, නසායි, ඉබ්නු මාජා යනාදිය

මේවා නබි මුහම්මද් (සල්)තුමාගේ නබි මග සංග්‍රහ කර ඒවා වාර්තා කර තිබෙන හදීස් ග්‍රන්ථ වේ. මේවා හි නබිතුමාගේ සාධක සහිත පුවත් සහ සාධක රහිත පුවත් ද මිශ්‍රව වාර්තා වී ඇත. මේවාහි තිබෙන හදීස්වලින් හදීස් කලාවේ රීතින් පදනම් කරගෙන පර්යේෂණය කර ඒවායින් හදීස් කලාවට අනුගත වන සාධක සහිත පුවත් පමණක් නබිතුමාගේ විශ්වසනීය ක්‍රමය යැයි ජමාඅතුල් මුස්ලිමීන් පිලිගනියි.

## මද්රසා

මද්රසා යනු `පාසල' යි. මෙහි මුස්ලිම් සිසුන් සඳහා අල්කුර්ආන්, හදීස් කලාව, අරාබි භාෂාව, සදාචාර ගුණ ධර්ම යනාදිය උගන්වනු ලැබෙයි. මේවාහි පූර්ණව අධ්‍යාපනය ලැබ පිටත් වන උගතුන් මව්ලවි, ආලිම් වැනි නම්වලින් හඳුන්වනු ලැබෙති. ජාමිආ, කුල්ලියා වැනි වෙනත් නම්වලින් ද මද්රසා හඳුන්වනු ලැබේ.

## තව්හීද්

තව්හීද් යන්න `ඒකීය කිරීම' යැයි හැඳින්විය හැක. අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකර ඔහුව තනිව ඔහුට පමණක් වන්දනා කිරීම තව්හීද් යන වචනයෙන් පැහැදිලි කරගත හැක. සමහරු අල්ලාහ් ඒකීය යැයි පිලිගන්නා අතරම වන්දනාවලදීත් නීති සෑදීමේ පරමාධිපත්‍යයේත් අල්ලාහ්ට ආදේශ පිහිටුවති. මේවා පවා ඉස්ලාමය `ආදේශ පිහිටුවීම' (ෂිර්ක්) යැයි ද එවැනි ආදේශ පිහිටුවීම්වල යෙදෙන්නන් `ආදේශ පිහිටුවන්නන්' (මුෂ්රික්) යැයි ද පවසයි.

## ඉජ්මාඋස් සහාබා

මුහම්මද් නබි (ﷺ) තුමා තම අනුවරයින් ව `සහාබා' යැයි ඇමතූහ. නබිතුමාගේ මරණයෙන් පසු සහාබාවරු පැවැසූ විශ්වාසවන්ත කරුණු `ඉජ්මාඋස් සහාබා' යැයි හැඳින්වේ. මුස්ලිම්වරයෙකු අල්කුර්ආන් සහ විශ්වසනීය නබිමග පමණක් අනුගමනය කළ යුතුය. ඉජ්මාඋස් සහාබා යනාදිය අල්කුර්ආන් සහ හදීස් වැනි අල්ලාහ්තආලා විසින් පහළ කරන ලද ඒවා නොවෙයි. ඒවා නබිතුමාගේ අනුවරයින්ගේ ස්වයං අදහස් හෝ විවරණයන් යැයි විශ්වාස කෙරේ. මේවා ආගමික මූලාශ්‍ර ලෙස ගෙන වතාවත් වල කිසිවිටෙක නොයෙදිය යුතුය.